5 වැනි පරිච්ඡේදය

විදේශීය අංශයේ ප්‍රවනතා සහ ප්‍රතිපත්ති

5.1 සමස්ත නිරීක්ෂණ

- **ශ්‍රී ලංකාවේ විදේශීය අංශය 2005 වසර තුළ දී අභියෝගයන් රැසකට මුහුණ පෑවද. විදේශ වෙළෙඳමේ සහ මූල්‍ය ප්‍රවාහයන්වල ඇති වූ සැලකියයුතු වර්ධනය හේතුවෙන් සමස්ත ගෙවුම් තුලනයේ අතිරික්තයක් වාර්තා විය. ලෝක ආර්ථිකයේ පැවති අඛණ්ඩ වර්ධන ප්‍රවනතාවය සහ රාජ්‍ය සහ ව්‍යාපාරික අංශයන්හි සාමූහික උත්සාහය මෙයට ප්‍රධාන වශයෙන් දයකවිය.** තිරසාර ලෝක ආර්ථික වර්ධනය සහ ප්‍රධාන අපනයන ගමනාන්ත ආර්ථිකයන්හි වර්ධනය මෙන්ම ශ්‍රී ලංකා අපනයනයන් හි ඉහළ ගුණාත්මක බව හේතුවෙන් අපනයන සඳහා අඛණ්ඩ ඉල්ලුමක් පැවතිණි. බහුකෙඳි ගිවිසුම (Multi Fibre Arrangement - MFA) අවසන්වීමෙන් මුහුණපෑමට සිදු වන ජාත්‍යන්තර තරගකාරිත්වයට මුහුණ දීම සඳහා ව්‍යවසායකයන්ගේ පැවති පූර්ව සූදනම නිසා එම අභියෝගයන් ජයගැනීමට හැකි විය. රජය, වාණිජ දූතමණ්ඩල හරහා වෙලෙඳපොළට පිවිසීමට ඇති ඉඩකඩ පුළුල් කිරීම පෞද්ගලික අංශයේ ක්‍රියාකාරකම් සඳහා උපකාරී විය. විදේශ විනිමය ඉපැයීම් ඉහළයාම සහ ඉහළ ගිය ජාත්‍යන්තර තෙල් මිලෙන් කොටසක් දේශීය ආර්ථිකය හරහා ගැලපීම නිසා ඉහළ යමින් පැවති බලශක්ති පිරිවැය පාලනය කර ගැනීමටත්, විදේශීය තරගකාරිත්වය පවත්වා ගැනීමටත් හැකි විය. සංචාරක අංශයේ තාවකාලික පසුබෑමක් දක්නට ලැබුණ ද, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඉහළයාම, සුනාමි සම්බන්ධ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ලැබුණු ප්‍රදානයන්, ණය ආපසු ගෙවීම සඳහා ලැබුණු සහනයන් සහ රජයට ලැබුණු ණය සහ ආධාර හේතුවෙන් ඉහළ ගිය ආනයන වියදම් පියවා ගැනීමට හැකි විය. මේ හේතුවෙන් 2005 වසර තුළ දී සමස්ත ගෙවුම් තුලනයේ අතිරික්තයක් ඇති වූ අතර ණය සේවා ගෙවීමේ ශක්‍යතාවය වර්ධනය විය. බාහිර කම්පනයන්ට මුහුණ දීමට රටට ඇති හැකියාව තවදුරටත් ශක්තිමත් කරමින් විදේශ වත්කම් ප්‍රමාණය යහපත් මට්ටමක් කරා වර්ධනය විය. ප්‍රධාන මුදල් ඒකකවලට එරෙහිව රුපියල අධිප්‍රමාණය වුවද එය ජාත්‍යන්තර තරගකාරිත්වය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කිරීමට තරම් හේතු නොවීය.

- **2005 වසර තුළ දී අපනයනයන් සියයට 10.2කින් සහ ආනයනයන් සියයට 10.8කින් වර්ධනය වීම හේතුවෙන් වෙළෙඳ හිඟය පුළුල් විය. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සැලකිය යුතු ලෙස ඉහළයාම හේතුවෙන් ජංගම ගිණුමේ හිඟය සුළු වශයෙන් පමණක් ඉහළ ගියේය.** සැපයුම පුළුල් වීම සහ ජාත්‍යන්තර වෙළෙඳපොළ ඉල්ලුම ඉහළයාම හේතුවෙන් අපනයන වටිනාකම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 6,347 දක්වා ඉහළ ගියේය. අපනයන පරිමාව සියයට 6.7කින් ඉහළ ගිය අතර අපනයන මිල සියයට 3.3කින් ඉහළ ගියේය. ආනයන පරිමාව සියයට 2.7කින් සහ ආනයන මිල සියයට 7.8කින් ඉහළ යාම පිළිබිඹු කරමින් ආනයන වටිනාකම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 8,863 දක්වා වැඩි විය. පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා වර්ධන වේගය අඩුමට්ටමක (සියයට 0.9) පැවතීම ආනයන පරිමාවේ සාමාන්‍ය වර්ධනයට හේතු විය. එහෙත් අතරමැදි භාණ්ඩ (සියයට 2.7) හා ආයෝජන භාණ්ඩවල (සියයට 4.2) ආනයන පරිමාවල වර්ධන

රූප සටහන 5.1
විදේශීය වෙළෙඳාම



5.1 සංඛ්‍යා සටහන
ගෙවුම් තුලන විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම (අ)

ශීර්ෂය	එ.ජ.ඩොලර් දශ ලක්ෂ					රුපියල් දශ ලක්ෂ				
	2001	2002	2003	2004	2005 (ආ)	2001	2002	2003	2004	2005 (ආ)
වෙළෙඳ ශේෂය	-1,157	-1,406	-1,539	-2,243	-2,516	-102,592	-134,706	-148,324	-227,171	-253,082
අපනයන	4,817	4,699	5,133	5,757	6,347	430,372	449,855	495,426	583,967	638,276
ආනයන	5,974	6,106	6,672	8,000	8,863	532,964	584,561	643,750	811,138	891,359
සේවා (ශුද්ධ) (ඇ)	204	295	399	419	338	14,692	28,224	38,443	42,735	34,043
ලැබීම්	1,355	1,268	1,411	1,527	1,540	120,937	121,340	136,123	154,746	154,877
ගෙවීම්	1,151	974	1,012	1,108	1,202	106,246	93,115	97,680	112,011	120,833
ආදයම් (ශුද්ධ)	-267	-252	-172	-204	-299	-23,842	-24,167	-16,535	-20,732	-30,049
ලැබීම්	108	75	170	157	35	9,584	7,201	16,385	15,813	3,629
ගෙවීම්	375	328	341	360	335	33,425	31,368	32,920	36,545	33,678
භාණ්ඩ සේවා හා ආදයම (ශුද්ධ)	**-1,220**	**-1,364**	**-1,312**	**-2,028**	**-2,478**	**-111,742**	**-130,648**	**-126,416**	**-205,168**	**-249,088**
පෞද්ගලික සංක්‍රාම (ශුද්ධ)	984	1,097	1,205	1,350	1,736	87,837	104,980	116,350	136,672	174,542
ලැබීම්	1,155	1,287	1,414	1,564	1,968	103,180	123,183	136,475	158,291	197,968
ගෙවීම්	172	190	209	214	233	15,343	18,202	20,125	21,619	23,426
නිල සංක්‍රාම (ශුද්ධ)	22	31	36	30	93	1,925	2,982	3,441	3,038	9,300
ජංගම ගිණුම	**-215**	**-236**	**-71**	**-648**	**-650**	**-21,980**	**-22,686**	**-6,625**	**-65,458**	**-65,246**
ප්‍රාග්ධන සහ මූල්‍ය ගිණුම	562	444	722	631	1,224	49,077	40,639	69,723	61,588	123,866
ප්‍රාග්ධන ගිණුම	198	65	74	64	250	17,766	6,219	7,146	6,573	25,108
ප්‍රාග්ධන සංක්‍රාම (ශුද්ධ) (ඈ)	198	65	74	64	250	17,766	6,219	7,146	6,573	25,108
ලැබීම්	203	71	81	71	257	18,241	6,782	7,768	7,242	25,863
ගෙවීම්	5	6	6	7	7	475	563	622	669	755
මූල්‍ය ගිණුම	**364**	**379**	**648**	**567**	**974**	**31,311**	**34,420**	**62,577**	**55,015**	**98,757**
දිගු කාලීන	163	326	722	680	798	14,337	28,911	69,721	69,255	80,391
සෘජු ආයෝජන	172	185	201	227	234	15,271	17,716	19,450	22,826	23,505
විදේශීය සෘජු ආයෝජන (ශුද්ධ)	82	181	171	217	234	7,310	17,281	16,557	21,948	23,505
පෞද්ගලීකරණ ලැබීම්	90	5	30	10	-	7,961	435	2,893	878	-
පෞද්ගලික දිගුකාලීන (ශුද්ධ) (ඈ)	-257	-21	-33	18	11	-22,918	-2,039	-3,201	1,720	1,054
ලැබීම්	44	115	101	169	197	4,016	11,007	9,738	17,395	19,739
ගෙවීම් (ඈ)	301	136	134	155	186	26,934	13,046	12,939	15,675	18,685
රජයේ දිගුකාලීන (ශුද්ධ)	249	162	554	439	553	21,984	13,233	53,472	44,709	55,832
ලැබීම්	575	542	913	771	747	51,193	51,843	88,106	78,299	75,309
ගෙවීම්	326	380	359	331	194	29,209	38,610	34,634	33,590	19,477
කෙටිකාලීන	201	53	-75	-112	176	16,974	5,509	-7,145	-14,240	18,366
විවිධ ආයෝජන (ශුද්ධ)	-11	25	2	11	60	-1,025	2,443	209	1,109	6,103
පෞද්ගලික කෙටිකාලීන (ශුද්ධ)	-42	68	19	28	16	-3,798	6,548	1,877	2,514	1,640
වාණිජ බැංකු වත්කම් (ශුද්ධ)	183	104	-94	-354	-223	2,867	6,893	-9,090	-45,367	-19,669
වාණිජ බැංකු වගකීම් (ශුද්ධ)	71	-145	-2	202	323	18,929	-10,375	-141	27,504	30,292
රජයේ කෙටිකාලීන (ශුද්ධ)	-	-	-	-	-	-	-	-	-	-
වි.ගැ.හි. වෙන්කිරීම්	-	-	-	-	-	-	-	-	-	-
රුපියල් අගය පිළිබඳ ගැලපීම	-	93	-	-	-	22,245	8,900	-	-	-
වැරදීම හා අත්හැරීම	-127	38	-148	-189	-72	-19,578	9,197	-14,487	-3,604	-10,494
සමස්ත ශේෂය (ඉ)	**220**	**338**	**502**	**-205**	**501**	**29,765**	**36,051**	**48,610**	**-7,474**	**48,125**
මූල්‍ය වෙනස්වීම් (ඉ)	-220	-338	-502	205	-501	-29,765	-36,051	-48,610	7,474	-48,125
වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතය ශ්‍රී ලං.රු./ එ.ජ. ඩොලර්						89.36	95.66	96.52	101.19	100.50
ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස										
වෙළෙඳ ගිණුම	-7.4	-8.5	-8.4	-11.2	-10.7	-7.3	-8.5	-8.4	-11.2	-10.7
ජංගම ගිණුම	-1.4	-1.4	-0.4	-3.2	-2.8	-1.6	-1.4	-0.4	-3.2	-2.8
ප්‍රදනයන් හැර ජංගම ගිණුම	-1.5	-1.6	-0.6	-3.4	-3.2	-1.7	-1.6	-0.6	-3.4	-3.2

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) මෙම සංඛ්‍යා ගෙවුම් තුලන අත්පොතේ 5වන සංස්කරණය (1993) ට අනුරූපව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් ජාත්‍යන්තරව අනුගමනය කරන අයුරින් සකස් කොට ඇත. මීට අමතරව 1994 සිට විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකද දේශීය බැංකු ක්‍රමයේ කොටසක් ලෙස සලකා ඇත.

(ආ) තාවකාලික

(ඇ) සේවා ලැබීම් තුළ 2001 ජූලි මස කටුනායක ගුවන් තොටුපොලට එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරය හේතුවෙන් විනාශ වූ ගුවන්යානා සඳහා වූ රක්ෂණ වන්දි ලැබීම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 382.4 ඇතුළත් වන අතර, සේවා ගෙවීම් තුළ එසේ ලැබුණු රක්ෂණ මුදලින් බදුහිමියන්ට ආපසු ගෙවනු ලැබූ එ.ජ. ඩොලර් දශ ලක්ෂ 292.8ක් ඇතුළත් වේ. මේ අනුව ශුද්ධ රක්ෂණ වන්දි ලැබීම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 89.6ක් වේ.

(ඈ) 2001 ජූලි මස කටුනායක ගුවන් තොටුපොළට එල්ල වූ ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් විනාශ වූ ගුවන්යානා දෙකෙහි නොපියව පැවති ප්‍රාග්ධනය වෙනුවෙන් පෞද්ගලික ප්‍රාග්ධන ගෙවීම් යටතේ කරන ලද එ.ජ. ඩොලර් දශ ලක්ෂ 147.6ක තාක්ෂණ ගෙවීම් ද ඊට අනුරූපව ප්‍රාග්ධන සංක්‍රාම යටතේ කරන ලද ගැලපුම් ද ඇතුළත්ය.

(ඉ) මූල්‍ය අංශයේ සියලුම ගණුදෙනු කාලච්ඡේද අවසානයේ විනිමය අනුපාතිකයන්ට අනුව පරිවර්තනය කර ඇත.

5.2 රූප සටහන

ගෙවුම් තුලනය

වේගය ඉහළ මට්ටමක පැවතුණි. භාණ්ඩ මිල ඉහළයාම කෙරෙහි ආනයන පරිමාව ප්‍රතිචාර දක්වූ නමුත්, ආර්ථික කටයුතු අඛණ්ඩව වර්ධනයවීම සහ අපනයන ඉල්ලුම ඉහළයාම නිසා අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයනය උනන්දු කෙරිණි. 2005 වසර තුළ දී අපනයන මිල ගණන්වල ඉහළයාම ඉක්මවා ආනයනවල සමස්ත මිල ඉහළ යාම හේතුවෙන් වෙළෙඳ හිඟය සියයට 4.2කින් පුළුල් විය. 2005 වසර තුළ දී, වෙළෙඳ හිඟය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,516 දක්වා ඉහළ ගිය අතර ජංගම ගිණුමේ ශේෂය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 650ක් දක්වා සියයට 0.3කින් සුළු වශයෙන් ඉහළ ගියේය. විදේශ සේවා නියුක්තිකයන්ගෙන් ලැබුණු ප්‍රේෂණ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,918 දක්වා සියයට 22.7කින් තියුණු ලෙස ඉහළ යාම හේතුවෙන් ජංගම ගිණුමේ හිඟය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 650කට සීමාවිය. 2005 වසර තුළ දී, ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුමේ ශුද්ධ ලැබීම් සියයට 94කින් වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස, ගෙවුම් තුලනයේ සමස්ත අතිරික්තය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 501ක් විය. මෙය 2005 වසර අවසානයේ දී නිල විදේශ වත්කම් ප්‍රමාණය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,735 (මාස 3.7ක ආනයන ආවරණයට ප්‍රමාණවත්) දක්වා ඉහළයාමට හේතු විය. ඊට අනුරූපව, විනිමය අනුපාතය එ.ජ.ඩොලරයට එරෙහිව සියයට 2.4කින් අධිප්‍රමාණය විය. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස මුළු විදේශ ණය ප්‍රමාණය සියයට 48.3 දක්වා පහත වැටිණි. 2005 වසර තුළ දී, රටේ විදේශ ඉපැයීම් වැඩිවීම සහ ණය ආපසු ගෙවීමේදී ලැබුණු සහනයන් හේතුවෙන් ණය සේවා අනුපාතය තවදුරටත් යහපත් මට්ටමකට පත්විය.

5.2 විදේශීය අංශයේ ප්‍රතිපත්තීන් සහ ආයතනික පහසුකම්

- **විදේශීය වෙළෙඳම සහ මූල්‍ය කටයුතු 2005 වසරේදී තවදුරටත් නිදහස් සහ ලිහිල් ආර්ථික පරිසරයක් තුළ ක්‍රියාත්මක විය. මෙම ආර්ථික පසුබිම තුළ ජංගම ගිණුම පූර්ණ පරිවර්තිතාවයකින්ද, ප්‍රාග්ධන ගිණුම පාර්ශ්විකව විවෘතවද පැවති අතර විදේශ විනිමය අනුපාතය නිදහසේ පාවෙන ක්‍රමයකින් සමන්විත විය**. වෙළෙඳම, ආයෝජන සහ ගෙවීම් ක්ෂේත්‍රවල පැවති පුළුල් නිදහස හා නිරතුරුව වර්ධනය වෙමින් පවතින ලිහිල් ආර්ථික පරිසරය, කුඩා ආර්ථිකයක් සහිත ශ්‍රී ලංකාව වැනි රටකට පසුගිය දශක තුන පුරා නිරන්තරයෙන් මුහුණදීමට සිදුවූ බාහිර කම්පනයන් මැඩලීමේ හැකියාව ශක්තිමත් කල අතර, මෙම නැඹුරුව ආර්ථික වර්ධන ප්‍රවනතාවය දීර්ඝ කාලීනව පවත්වා ගැනීමට බෙහෙවින් ඉවහල් විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ VIII වගන්ති ප්‍රකාරව, ජංගම ගිණුමේ පරිවර්තිතාවය 1994 සිට පවත්වා ගනිමින් සිටී. කෙසේ නමුදු, විශාල ලෙස සහ අක්‍රමවත් ලෙස සිදුවන ප්‍රාග්ධන ප්‍රවාහ තුළින් ශ්‍රී ලංකා ආර්ථිකය ආරක්ෂා කරගැනීම සඳහා ප්‍රාග්ධන ගිණුමේ සීමා කිරීම තවදුරටත් පවත්වා ගැනිණි. 2001 වසරේ සිට ක්‍රියාත්මක වන්නා වූ නිදහස් පාවෙන විනිමය අනුපාත ක්‍රමය ආර්ථිකයේ වර්ධනයට බෙහෙවින් උපකාරී වූ අතර, විශේෂයෙන්ම, රටෙහි මූලික ආර්ථික සිද්ධාන්තයන්ට සමගාමීව ස්වයංක්‍රීයව වෙනස් වූ විනිමය අනුපාතය, විදේශීය වෙළෙඳමේ තරගකාරිත්වය රඳවා ගැනීමට උපකාරී විය.

- **බොහෝ දුරකට ලිහිල් වූ විදේශීය ආයෝජන පරිසරයක් ශ්‍රී ලංකාව තුළ තවදුරටත් පවත්වාගෙන යනු ලැබිය**. මුදල් ණයට දීම, උකස් කටයුතු, එ.ජ. ඩොලර් දශ ලක්ෂයට වඩා අඩු සිල්ලර වෙළෙඳම සහ කරදිය ධීවර කටයුතු යන අංශ හතර හැර අනෙකුත් සියළුම ක්ෂේත්‍රයන් සෘජු විදේශීය ආයෝජන සඳහා විවෘත විය. වසරකට එ.ජ. ඩොලර් දශ ලක්ෂ 200 (දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 1-2) මට්ටමකට ආසන්නව පැවති සෘජු විදේශීය ආයෝජනයන්, 2005 වසරේ දී එ.ජ. ඩොලර් දශ ලක්ෂ 272ක් දක්වා ඉහළ ගියේය. ආර්ථික වර්ධනය වේගවත් කිරීමේදී සෘජු විදේශීය ආයෝජනයන් ගේ කාර්යභාරය මනාව වටහා ගනිමින්, මනා ශක්‍යතාවයෙන් යුතු ආයෝජකයන් හඳුනා ගැනීමෙන් පසු, වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය+ (GSP+) සහ ද්විපාර්ශ්වික වෙළෙඳ ගිවිසුම් වැනි කාලීන ගිවිසුම් වලට අදාල ප්‍රතිලාභ හරහා ඔවුන් ධෛර්යමත් කිරීම තුළින්, ඉදිරියේදී තවත් විදේශීය ආයෝජන වැඩිකිරීමට අපේක්ෂා කෙරේ.

- **ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ආදායම පහළ - මධ්‍යම මට්ටම කරා යොමුවීමත් සමග, සහනදායී ආධාර ලැබීමෙහි නැඹුරුව අඩුවීම නිසා, විදේශීය මූල්‍ය ප්‍රභවයන් විවිධාංගීකරණය කිරීමට රජය විසින් ක්‍රියාමාර්ග ගනිමින් සිටියි**. රජයේ සහ පෞද්ගලික දෙඅංශයේ විදේශීය ණය ප්‍රභවයන් විවිධාංගකරණය කිරීම උදෙසා ප්‍රාග්ධන ගිණුම ක්‍රමානුකූලව විවෘත කෙරෙමින් පවතී. ආරම්භක පියවරක් වශයෙන්, විදේශ විනිමය ප්‍රේෂණ ඉහල නැංවීම පිණිස විදේශගත ශ්‍රී ලාංකිකයන් ඉලක්කගත කර, ජාතිය ගොඩනැඟීමේ බැඳුම්කර නිකුත් කිරීමට කටයුතු කර ඇති අතර සහ ශ්‍රී ලාංකික නොවන පුරවැසියන් හට රජයේ රුපියල් සුරැකුම් පත්‍රයන් හි යම් ප්‍රතිශතයක් ආයෝජනය කිරීමට ඉඩ ප්‍රස්තා ලබාදීමටද රජය අදහස් කර ඇත. මීට අමතරව රජය විසින් අන්තර් ජාතික ප්‍රාග්ධන වෙළෙඳපොළෙන් විදේශ ණය ලබා ගැනීමේ පහසුකම් ඇති කිරීම පිණිස අදාල ණය ශ්‍රේණි ගත කිරීම්ද (credit ratings) ලබාගන්නා ලදී.

- **බහුපාර්ශ්වික, කලාපීය හා ද්විපාර්ශ්වික වෙළෙඳ ගිවිසුම් හි පුළුල් වීමත් සමග 2005 වසරේ දී විදේශීය වෙළෙඳ සබඳතා තවදුරටත් ශක්තිමත් විය**. ශ්‍රී ලංකාව, ලෝක වෙළෙඳ සංවිධානයෙහි ආරම්භක සාමාජික රටක් වශයෙන්, බහුපාර්ශ්වික වෙළෙඳ ගිවිසුම් ක්‍රමය දැඩිව අනුගමනය කිරිමේ ස්ථාවරයේ තවදුරටත් රැඳී සිටී. ශ්‍රී ලංකාව, භාණ්ඩ වෙළෙඳමට අදාලව ලෝක වෙළෙඳ සංවිධානයේ නීතිරීතිවලට එකඟ වී ඇති අතර, සේවා වෙළෙඳම් පිළිබඳ පොදු ගිවිසුම (GATS) යටතේ පණිවුඩ හුවමාරු, සංචාරක සහ මූල්‍ය යන සේවාවන් සඳහා ද වන නීතිරීති කෙරේ බැඳී ඇත. 2005 දෙසැම්බර් මස හොංකොං හි දී පැවැත්වූ ලෝක වෙළෙඳ සංවිධානයේ හය වන අමාත්‍ය සමුළුවේ දී, තම රට හා සමාන ආකල්ප දරූ අනෙකුත් රටවල් සමග එක්ව කෘෂිකාර්මික නිෂ්පාදිත රාශියක්ම විශේෂිත නිෂ්පාදිත ලෙස නම් කිරීමට ශ්‍රී ලංකාව ක්‍රියාකල අතර, මේ හේතුවෙන් එම නිෂ්පාදිත තවදුරටත් තීරුබදු කපා හැරීම් වලට භාජනය නොවීම තුලින් දේශීය ගොවියා ආරක්ෂා කරගැනීමට හැකිවනු ඇත. මීට අමතරව, යෝජිත "නව විශේෂිත ආරක්ෂණ යාන්ත්‍රණය" යටතේ, කෘෂි නිෂ්පාදන ඉතා අධික ලෙස ආනයන කරන අවස්ථාවකදී දේශීය ගොවියා රැකගැනීම උදෙසා අදළ කෘෂි නිෂ්පාදන මත ඉහළ තීරුබදු පැනවීමේ හැකියාව ද ලබා ගැනීමට ශ්‍රී ලංකාව බලාපොරොත්තු වේ. කෙසේ නමුදු, දේශීය කෘෂිකර්මාන්තයේ, ඵලදයිතා ඉහළ නැංවීමේ උපාය මාර්ග හඳුන්වා දෙනතුරු පමණක් මෙම කෘෂි නිෂ්පාදන සඳහා වූ ආරක්ෂණ වැඩ පිළිවෙල සීමා කළයුතුය. නොකඩවා පවත්වා ගැනෙන ආරක්ෂණ විධි විධාන නිසා ශ්‍රී ලංකා අපනයනව තරඟකාරිත්වය සහ පාරිභෝගික සුභසාධනය කෙරෙහි පසුගාමී බලපෑමක් ඇති විය හැකිය.

- **කලාපීය වෙළෙඳ ගිවිසුම් හරහා වෙළෙඳපොළ වලට පිවිසීමේ ඉඩ ප්‍රස්තා 2005දි තවදුරටත් ව්‍යාප්ත කරගන්නා ලදී**. දකුණු ආසියානු වරණීය තීරුබදු වෙළෙඳ ගිවිසුම (SAPTA) 2006 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි දකුණු ආසියානු නිදහස් වෙළෙඳ කලාප ගිවිසුම බවට (SAFTA) පරිවර්තනය කිරීමට 2004 ජනවාරි පවත්වන ලද කලාපීය සමුළුවේ දී ශ්‍රී ලංකා රජය එකඟ විය. පසුගිය කාලයේදී දකුණු ආසියානු නිදහස් වෙළෙඳ කලාපය(SAFTA) ප්‍රතිස්ථාපනය කිරීමට කිහිපවරක් උත්සාහ කළ ද, දේශපාලනික වශයෙන් පැවති මන්දගාමීත්වය සහ සාමාජික රටවල් අතර වූ මතභේදයන් එහි සාර්ථකත්වයට බාධා ගෙන දිණි. වර්තමාන ගිවිසුම ප්‍රධාන කරුණු හතරක් පදනම් කරගෙන ගොඩනැංවෙනු ඇත. ඒවා නම් ප්‍රභවය සම්බන්ධයෙන් වූ නිර්ණායක සකස් කිරීම, වාරණ ලැයිස්තු (Negative List) සකස් කිරීම, ඌණ සංවර්ධිත රටවල්වල අහිමි වන්නා වූ ආදයම් වෙනුවෙන් වන්දි ගෙවීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම සහ අවශ්‍ය රටවල් සඳහා තාක්ෂණික දැනුම ලබාදීම යන කරුණු වේ. කලාපය තුළ තීරුබදු අඩු කිරීමේ පළමු අදියර 2006 ජුලි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක වනු ලබන අතර කලාපය තුළ තීරු බදු වෙනස් නොකරන ලැයිස්තුවේ වූ භාන්ඩ හැර අනෙකුත් භාණ්ඩ වල තීරු බදු සියයට 1 සිට සියයට 5 දක්වා ගෙන ඒම තුලින් 2016 වසරවන විට ගිවිසුම මුළුමණින්ම ක්‍රියාත්මක වනු ඇත. 'බහු ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගිතාවය උදෙසාවන බෙංගාල බොක්කේ රටවල මූලිකත්වය (BIMST-EC)' සඳහා නිදහස් වෙළෙඳ ගිවිසුම සම්බන්ධ කෙටුම්පත්කරණය නිමකිරීමත් සමග ශ්‍රී ලංකාව කලාපීය සහයෝගිතාවන් උදෙසා තවත් ඉදිරි පියවරක් තැබීය. සංවර්ධනය වෙමින් පවතින එකිනෙක රටවල් අතර තීරුබදු සහනයන් ප්‍රදනය කිරීමේ රාමු සැකිල්ලක් ලෙස අරඹන ලද ජගත් වෙළෙඳ වරණ ක්‍රමය (GSTP) යටතේ ශ්‍රී ලංකාව වෙත තවදුරටත් සාමාජික රටවල් වෙතින් තීරුබදු සහන ලැබෙමින් පවතී.

- **2005 වසරේ ශ්‍රී ලංකාව සහ යුරෝපීය සංගමය (EU) ද්විපාර්ශ්වික සබඳතාවයන් ඔස්සේ ඉදිරි පියවරක් තැබුව ද, මෙමගින් අපේක්ෂිත පූර්ණ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා තවදුරටත් සාකච්ඡා පැවැත්විය යුතුය**. දැනට පවත්නා වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP) කොටස් තුනකින් සමන්විත නව ක්‍රමයකින් ප්‍රතිස්ථාපනය කෙරෙනු ඇත. නව ගිවිසුමේ කොටස් වශයෙන් 'වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය+ (GSP +)', 'පොදු ක්‍රමය' සහ 'අවිආයුධ හැර සියල්ල' යන ගිවිසුම් සඳහන් කළ හැක. වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය+යටතේ 2005 ජුලි 01 දින සිට, ශ්‍රී ලංකාවට තීරුබදු රහිත සහන ලබා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සපුරාලීමට හැකි වූ වුවද, 'පොදු ක්‍රමය' සහ 'අවිආයුධ හැර සියල්ල ක්‍රමය' ඇතුළු සමස්ත වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය ක්‍රියාත්මක වූයේ 2006 ජනවාරි 01 දින සිටය. තිරසාර සංවර්ධනය සහ මනා චර්යා පද්ධතියක් ඇති කිරීම යන පරමාර්ථ මුදුන්පත් කර ගැනීම වෙනුවෙන් විශේෂිත සංවර්ධන අවශ්‍යතාවයන් පවතින රටවල් සඳහා සහයෝගය දීමට හඳුන්වා දුන් වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය+ යටතේ යුරෝපා වෙළෙඳපොළ තුල තීරුබදු සහන ලබා ගැනීමට සමත් වූ ප්‍රථම රට ශ්‍රී ලංකාව විය. වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය+ යටතේ, ශ්‍රී ලංකාවෙන් ආනයනය කරනු ලබන භාණ්ඩ කිහිපයක්, එනම් රෙදිපිළි හා ඇඟළුම්, දුම්කොළ, අත්වැසුම්, පිහන් නිෂ්පාදිත හා සක්‍රිය කාබන් ඇතුළත්ව අයිතම 7,200ක් උදෙසා තීරුබදු රහිතව යුරෝපා වෙළෙඳ පලට පිවිසිය හැකි ලෙස සහනයන් ප්‍රදනය කර ඇත. කෙසේ නමුදු, මෙම සහනයන් ලබා ගැනීමට සුදුසුකමක් වශයෙන්, රටක් විසින් තම නිමි භාණ්ඩ සඳහා අවම වශයෙන් සියයට 50ක අගයක් දේශීයව එකතු කළ යුතුවිය. මෙම නිර්ණායකයන් හි දැඩි බව නිසා විශේෂයෙන්ම ඇඟළුම් ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය+ මගින් සපයාදී තිබූ පහසුකම් භාවිතයට ගැනීම, අපේක්ෂිත මට්ටමට වඩා අඩුවිය. ප්‍රමාණවත් වන දේශීය අමුද්‍රව්‍ය පදනමක් නොමැතිවීම හේතුවෙන් ඇඟළුම් ක්ෂේත්‍රයේ නිමි භාණ්ඩ සඳහා

විශේෂ සටහන 9

ඉන්දු-ශ්‍රී ලංකා විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුම (CEPA)

1998 වර්ෂයේ දී අත්සන් කිරීමෙන් පසුව 2000 වර්ෂයේ සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කල ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම, යෝජිත ඉන්දු-ශ්‍රී ලංකා විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුමට අවශ්‍ය පසුබිම සකසන ලදී. දැනට දෙරට අතර භාණ්ඩ වෙළෙඳමට පමණක් සීමා වී පවත්නා සහයෝගිතාවය සේවා අංශය, ආයෝජන සහ ආර්ථික කටයුතු යන අංශ ද ඇතුළත් කරමින් තවදුරටත් පුළුල් කිරීම සඳහා යෝජිත ඉන්දු-ශ්‍රී ලංකා විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුම සැලසුම් කර ඇත. මෙම ගිවිසුම කලාපය තුළ අනෙකුත් රටවල් හා ආර්ථික වශයෙන් බද්ධ වීමේ මූලික පියවරක් වන අතර මේ හා සමානව ඉදිරියේ දී අත්සන් කෙරෙන ගිවිසුම්වලට මූලික ආකෘතියක් ද වනු ඇත.

ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම ක්‍රියාත්මක වීමත් සමගම ඉන්දියාව, ශ්‍රී ලංකාවේ විශාලතම භාණ්ඩ සැපයීම්කරු වූ අතර, 2005 වර්ෂයේ මුළු ආනයන තුළ ඉන්දියාවෙන් ආනයනය කළ භාණ්ඩවල දයකත්වය සියයට 21ක් විය. 2000 වර්ෂයේ දී සියයට 1.0ක අපනයන දයකත්වය 2005 වර්ෂයේ දී සියයට 8.9ක් දක්වා වැඩිවිය. ආර්ථික වශයෙන් දෙරට ඒකාබද්ධ වීමෙන් ඉදිරියේ දී අත්පත් කරගත හැකි ඉමහත් ප්‍රතිලාභ සැලකිල්ලට ගනිමින් දෙරට අතර පවතින ද්විපාර්ශ්වික සබඳතා ඇගයීමට ලක් කිරීමේ අරමුණ ඇතිව ආර්ථික සහයෝගිතාවය තවදුරටත් වර්ධනය කළයුතු ආකාරය පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා දෙරටේ නායකයන් විසින් 2003 දී ඒකාබද්ධ අධ්‍යයන කමිටුවක් (Joint Study Group) පත්කරන ලදී. ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ දැනට නොයෙකුත් වෙළෙඳ සම්බාධකවලට යටත්ව ඇති සේවාවන් තව දුරටත් ලිහිල් කිරීම, ආයෝජන සඳහා ඉඩ ප්‍රස්තා පුළුල් කිරීම සහ අධ්‍යාපනය, සෞඛ්‍ය, ප්‍රවාහන, කෘෂිකර්ම හා සාගර සම්පත් ගවේෂණය යන ක්ෂේත්‍රයන්වල සහයෝගීතාවය පුළුල් කරලීමට මෙම අධ්‍යයන කමිටුව මගින් නිර්දේශ කර තිබිණි.

මෙම ගිවිසුම හා ආශ්‍රිතව දෙරටේ වෙළෙඳ ලේකම් මට්ටමේ සාකච්ඡා 2004 දී අරඹන ලදී. දෙරටේ ආර්ථිකයන් හි පවත්නා අසමතුලිතාවය සහ කොටස් වශයෙන් ක්‍රමානුකූලව සේවා අංශය ලිහිල් කිරීමේ සම්මුතිය ඇතිව සාකච්ඡා කිරීමේ මූලික කරුණු සම්බන්ධයෙන් එකඟ තාවයකට පැමිණ ඇත.

වෙළෙඳ ලේකම් මට්ටමේ සාකච්ඡාවලින් පසුව අදාළ ක්ෂේත්‍රයන් තුළ සාකච්ඡා තවදුරටත් පවත්වාගෙන යාම සඳහා ලේකම්වරුන්ගේ ප්‍රධානත්වය යටතේ ක්‍රියාකාරී කමිටු හා අනුකමිටු වලින් සමන්විත වෙළෙඳ සාකච්ඡා කමිටු (Trade Negotiating Committee) පත්කරනු ලැබීය. 2006 ජනවාරි මස අවසන් වන විට තාක්ෂණික මට්ටමේ සාකච්ඡා වට හයක් පවත්වමින් මෙම සියළුම ක්ෂේත්‍රයන් හි ඉමහත් ප්‍රගතියක් අත්පත් කරගත් අතර තවමත් නොවිසඳු ගැටලු කිහිපයක් විසඳ ගැනීමට එකඟතාවයකට පැමිණ ඇත.

දැනට පවත්නා තීරුබදු සහන නොලබන ලැයිස්තුවේ අඩංගු භාණ්ඩ ප්‍රමාණය අඩු කිරීම, ප්‍රභවස්ථාන පිළිබඳ නීති ලිහිල් කිරීම, අපනයන සඳහා පනවා ඇති තීරුබදු නොවන බාධක ඉවත් කිරීම දෙරටේ පවත්නා ප්‍රමිතිකරණ පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනීම තහවුරු කිරීම සහ පාරිභෝගික ආරක්ෂාව හා නීතිමය පසුබිම පිළිබඳ අවබෝධතා ගිවිසුම් පිළියෙළ කර අවසන් කිරීම යන කරුණු භාණ්ඩ වෙළෙඳම සම්බන්ධයෙන් පවත්නා වෙළෙඳ බැඳීම් ඔස්සේ සලකා බැලීමට නියමිතය.

සේවාවන් පිළිබඳ පොදු සම්මුතියට (GATS) අනුව සහ එහි තීරුබදු අඩු කිරීමට යටත් ලැයිස්තු පදනම, ක්‍රමාණුකූලව සහ කොටස් වශයෙන් ලිහිල්කිරීම පදනම් කරගනිමින් සේවා අංශයට අදළ ද්විපාර්ශ්වික සාකච්ඡා පවත්වනු ලබයි. රටවල් අතර පුද්ගල සංසරණය, පිළිගත් වෘත්තිමය සේවාවන්හි අන්‍යෝන්‍ය පිළිගැනීම පිළිබඳ අවබෝධතා ගිවිසුම් සහ සේවා වෙළෙඳමට අදළ 3වන ක්‍රමය සහ 4වන ක්‍රමය යටතේ සිදුකෙරෙන සේවා සැපයීම යන කරුණු පිළිබඳව ද දෙරට විසින් සාකච්ඡා පැවැත්විණි.[1] තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය, සංචාරක හා ආශ්‍රිත ව්‍යාපාර, ගොඩනැගිලි හා ඉංජිනේරු කටයුතු, සෞඛ්‍ය, ප්‍රවාහන හා සහනසේවා ප්‍රථමයෙන් ලිහිල්කරණයට භාජනය විය යුතු යැයි අපේක්ෂා කරනු ලබන සේවාවන් අතර වේ. බැංකු කටයුතු, රක්ෂණ හා ප්‍රාග්ධන යන සේවාවන් ඇතුළත් මූල්‍ය සේවාවන් සේවා අංශය යටතේ යටතේ ඇති උපකමිටුවක් මගින් සලකා බලනු ලැබේ. මූල්‍ය අංශයේ සේවා ලිහිල්කරණය ප්‍රධාන වශයෙන්, සේවා අංශයේ 3වන ක්‍රමයට අදළව සියළු පාර්ශ්වයන්ට සමානව සැලකීමේ (National Treatment) සම්මුතිය තුළින් තවත් සහනයන් එක්කරමින් සිදුකෙරෙනු ඇත. සේවා වෙළෙඳමේ 1වන ක්‍රමයට අදළ ලිහිල් කිරීම්වල දී නොයෙකුත් බාධක මතුවන බැවින් එය ප්‍රාග්ධන ගිණුම තවදුරටත් ලිහිල්කරණය කිරීමේ අරමුණත් සමග සළකා බැලෙනු ඇත.

ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම ක්‍රියාත්මකවීමෙන් පසු වෙළෙඳම හා සම්බන්ධව ආයෝජන සැලකිය යුතු ලෙස ඉහළයාමත් සමග ඉන්දියාව, ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආයෝජකයෙක් බවට පත්වෙමින් පවතී. ඉන්දියාව විසින් දකුණු ආසියානු කළාපය තුළ සිදුකල ආයෝජනයන්ගේ වඩා වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකාව තුළ කර ඇති අතර, 2005 වර්ෂයේ දී එය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 181 කට වඩා වැඩි ප්‍රමාණයක් වෙමින් ඉන්දියාව, ශ්‍රී ලංකාවේ හත්වන විශාලතම ආයෝජකයා බවට පත්වී ඇත. ආර්ථික වශයෙන් දෙරට අතර පවතින

සබඳතාවයේ වැදගත්කම සලකමින්, පවත්නා ආයෝජන වර්ධනය සුරක්ෂිත කරගනිමින් ඉදිරි ආයෝජන සඳහා ඉඩ ප්‍රස්තා වර්ධනය කිරීම හා ධෛර්යවත් කිරීම දෙරට අතර ද්විපාර්ශ්වික සාකච්ඡා වලින් අරමුණු කෙරිණි. වඩාත් පුළුල් වූ විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුමට අදළව නමුත් ස්වාධීනව ක්‍රියාත්මක වන ද්විත්ව බදුකරණ හා රාජ්‍ය බදු පැහැර හැරීම් වැළැක්වීම පිළිබඳ ගිවිසුම දෙරට අතර ආර්ථික කටයුතු වර්ධනය හා පහසු කරවනු ඇත. මෙලෙස ක්‍රියාත්මක වන සියළු පියවර ආයෝජකයින්ගේ විශ්වාසය තහවුරු කරමින් ශ්‍රී ලංකාවට ගුණාත්මක වශයෙන් පිරි වැඩි ආයෝජන අවස්ථාවන් උද කිරීමට අවශ්‍ය පසුබිම සකස් කරනු ඇත.

ආර්ථික සහයෝගිතාව ඔස්සේ අධ්‍යාපනය, සෞඛ්‍ය, දුම්රිය ප්‍රවාහණය, සම්ප්‍රදායී නොවන විදුලිබල ජනනය හා බුද්ධිමය දේපල සුරකීම් යන සේවාවන් ප්‍රථමයෙන් සලකා බැලෙන අතර මේ සඳහා ඉන්දියාවේ සහයෝගය ලැබෙනු ඇත. නොයෙකුත් සේවාවන්ට අදළ ව්‍යාපාර යෝජනා ඒ හා සම්බන්ධ සියළු පාර්ශ්වකරුවන් සමග සාකච්ඡා කර ක්‍රියාත්මක කරනු ඇත.

විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුම යටතේ විනිවිදභාවයෙන් යුතු ප්‍රභවස්ථාන සම්බන්ධයෙන් වූ නීති සම්පාදනය දෙරට අතර පවත්නා තීරුබදු පහත හෙලීම මෙන්ම වැදගත්වනු ඇත. තීරුබදු සහනයන්ට යටත්වන යම්කිසි භාණ්ඩයක් හෝ සේවාවක් සඳහා, එම තීරුබදු සහනයන් ප්‍රදනය කර ඇති රට මගින් ප්‍රමාණාත්මක දයකත්වයක් කර ඇත්දැයි යන්න සාක්ශාත් කිරීම මෙම ප්‍රභවස්ථාන නීති මගින් සිදුකරනු ලබයි. භාණ්ඩ වෙළෙඳමෙහි දී මෙම ප්‍රභවස්ථාන නිර්ණායකයන් ඉතා පැහැදිලිය. ගිවිසුමට අදළ නොවන වෙනත් රටකින් අමුද්‍රව්‍ය ගෙන්වා භාණ්ඩයක් නිපදවන විට, ප්‍රභවස්ථාන නීති අනුව සපුරාලිය යුතු අවම දයකත්වය තීරුබදු සහන ලබන රට මගින් සම්පූර්ණ කලයුතුය. කෙසේ නමුත් සේවාවන්, ආයෝජන හා ආර්ථික සහයෝගිතාව යන අංගයන්ගෙන් සමන්විත ඉන්දු-ශ්‍රී ලංකා විස්තීර්ණ ආර්ථික සහයෝගිතාව යටතේ, විනිවිදභාවයෙන් යුතු හා වඩාත් සරලවූ ප්‍රභවස්ථාන නිර්ණායකයන් සම්පාදනය ඉතා වැදගත් වනවා සේම එය ඉදිරියේදී දෙරට අතර ඇතිවිය හැකි වෙළෙඳම පිළිබඳ ගැටලු මහහැරවීමට ද ඉවහල් වනු ඇත.

[1] සේවා අංශයේ වෙළෙඳම එකිනෙකට වෙනස් ක්‍රම 4කින් සිදුකල හැක. 1වන ක්‍රමය - රටවල සීමාවන් හරහා සිදුවන වෙළෙඳම, 2වන ක්‍රමය - රටින් එකෙර සිදුවන පාරිභෝජනය: මෙහි දී සේවාව ලබන්නා රටින් පිටව ගොස් වෙනත් රටක දී අදල සේවාව ලබාගනී, 3වන ක්‍රමය - වෙළෙඳ ආයතන වෙනත් රටක පිහිටුවා එම සේවාව සැපයීම සහ 4වන ක්‍රමය - සංචාරක පුද්ගලයින් විසින් සපයන සේවාවන්: මෙහි දී අදළ පුද්ගලයන් වෙනත් රටක සංචාරය කරමින් අදල සේවාව සපයයි.

සියයට 50ට වැඩි අගයක් එක් කිරීමට නොහැකිවී ඇත. එබැවින්, වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය+ යටතේ ලබාගත හැකි වාසිදයක තත්ත්වය උදකරගනු වස් එකතු කල අගය සියයට 35 දක්වා පහත හෙලීම පිණිස ශ්‍රී ලංකාව යුරෝපීය සංගමය සමග ක්‍රියාකාරී ලෙස සාකච්ඡා කරමින් සිටී.

- **ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුම (CEPA) යටතේ සාකච්ජා 2005 වසරේ දී ද නොකඩවා පැවතුණි**. ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (ISLFTA) යටතේ දනට භාණ්ඩ හා සේවා අංශය මත පවත්නා සහනයන් තවදුරටත් ව්‍යාප්ත කිරීම, ආයෝජන ප්‍රවර්ධනය සහ සේවා කිහිපයක් වන ගමනාගමන, යටිතල පහසුකම්, අධ්‍යාපන, සංචාරක, තොරතුරු හා සන්නිවේදන සහ තාක්ෂණය යන අංශ වල ආර්ථික සහයෝගිතා ඉහළ නැංවීමට විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුම මගින් බලාපොරොත්තු වේ. විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුමට අදාළ මූලික සැකැස්ම පිළියෙළ කිරීම සහ ගිවිසුම ඵලදයී ලෙස හා නොපමාව ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර සාකච්ඡා වට කිහිපයක් පවත්වන ලදී.
- **ශ්‍රී ලංකාව සහ පකිස්ථානය විසින් අත්සන් කළ ද්විපාර්ශ්වික වෙළෙඳ ගිවිසුම. 2005 ජූනි මස සිට ක්‍රියාත්මක විය**. ශ්‍රී ලංකාව විසින් තේ, බුලත් ඇහලුම් හා පිහන් නිෂ්පාදිත ඇතුළු අයිතමයන් රාශියක් සඳහා සහනයන් ලබා ගනු ලැබූ අතර, පකිස්ථානය විසින් ඔවුන්ගේ වැදගත් අපනයනයන් වන බාස්මතී සහල් සහ අර්තාපල් වැනි නිෂ්පාදන සඳහා සහනයන් ලබා ගන්නා ලදී. මෙම ගිවිසුම හා සම්බන්ධ විශේෂිත ලක්ෂණයක් වනුයේ අපනයන භාණ්ඩවල ප්‍රභවය නිර්ණය කිරීමේ එක් නිර්ණායකයක් වූ සංයෝජිත වර්ගීකරණ ක්‍රමයට (Harmonised Commodity Description and Coding System) අදළ තීරුබදු කාණ්ඩය සැලකීමේ දී සංඛ්‍යාංක හයක් දක්වා වෙනස් වීමට ඇති හැකියාවයි. ඉන්දු-ලංකා වෙළෙඳ ගිවිසුමේ අදළ තීරුබදු කාණ්ඩය වෙනස්වීම සලකා බලනුයේ වර්ගීකරණ සංඛ්‍යාංක හතරකින් යුත් කාණ්ඩ අතරය. ශ්‍රී ලංකාවේ විදේශීය ආයෝජන ප්‍රවර්ධනය කිරීම සහ පකිස්ථානු වෙළෙඳපොළ සඳහා භාණ්ඩ නිපදවීම සඳහා දේශීය කර්මාන්ත යොමු කිරීම සඳහා මෙම වෙනස්වීම මහෝපකාරී වේ. මෙම ගිවිසුම යටතේ, තීරුබදු වෙනස් නොකරන ලැයිස්තුවේ වූ භාණ්ඩ හැර අනෙකුත් භාණ්ඩ සඳහා වූ තීරුබදු, ශ්‍රී ලංකාව අවුරුදු 5ක් ඇතුළත අහෝසි කරන අතර, එය පකිස්ථානය විසින් අවුරුදු 3 ක් ඇතුළත අහෝසි කරනු ලබයි.
- **2005 වසරේ දි ද්විපාර්ශ්වික වශයෙන් වැදගත් වූ තවත් වෙළෙඳ සාකච්ජා රාශියක් පැවැත්විණි**. වරණීය වෙළෙඳ ගිවිසුමක් (PTA) ඇති කිරීම සඳහා ශ්‍රී ලංකාව සහ තායිලන්තය ගිවිසගත්හ. විශේෂයෙන්ම රෙදිපිළි හා

ඇහළුම් පංගු ක්‍රමය අහෝසිවීමත් සමග ඇමෙරිකා එක්සත් ජනපදය සමග වෙළෙඳ හා ආර්ථික සබඳතා වර්ධනය කිරීම ඉතා වැදගත් වේ. එබැවින් ශ්‍රී ලංකාව සහ ඇමෙරිකා එක්සත් ජනපදය අතර නිදහස් වෙළෙඳ ගිවිසුමකට (FTA) මූලිකාරම්භය සැකසීම සඳහා ඇමෙරිකා එක්සත් ජනපදය සමග නොකඩවා සාකච්ඡා පැවැත්විණි. නිදහස් වෙළෙඳ ගිවිසුම පිළිබඳ අපේක්ෂාවන් මුදුන් පමුණුවා ගැනීම සහ දෙරට අතර වෙළෙඳ සහ ආර්ථික ගැටලු සාර්ථක ලෙස නිරාකරණය කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව සහ ඇමෙරිකා එක්සත් ජනපදය අතර පවත්නා වෙළෙඳ සහ ආයෝජන කෙටුම්පත් ගිවිසුම (TIFA) ඉතා වැදගත් වූ යාන්ත්‍රණයක් බවට පත්විය. ශ්‍රී ලංකාව සහ ඉරානය අතර කෙටුම්පත් ගිවිසුමක් සඳහා 2004 නොවැම්බර් මස අත්සන් කිරීමට යෙදුනු අතර, තීරුබදු සහන ලබන භාණ්ඩ පිළිබඳ සාකච්ඡා 2005 සැප්තැම්බර් මස දී අවසන් කෙරිණි. ගිවිසුමට අදළ නීතිමය ක්‍රියාවලින් නිම කිරීම දෙරට විසින්ම සිදුකරමින් පවතී. දෙරට විසින්ම එකිනෙක රටට දැනුම් දීමෙන් පසුව ගිවිසුම ක්‍රියාත්මක වීමට අපේක්ෂිතය.

- **වෙළෙඳපොළවල් වෙත පිවිසීම ව්‍යාප්ත කිරීම සඳහා. රජය විසින් අපනයනකරුවන් වෙත නොයෙකුත් ආකාරයේ පහසුකම් තවදුරටත් සපයමින් සිටියි**. රජයේ ප්‍රධානතම විදේශීය ආයෝජන ප්‍රවර්ධන ආයතනය වන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) විසින් තීරුබදු විරාම සහ අමුද්‍රව්‍ය හා ආයෝජන භාණ්ඩ ආනයනයන් සඳහා තීරුබදු අත්හැරීම් වැනි සහන ලබාදී ඇත. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (SLEDB), අලෙවිකරණය, මූල්‍යකරණය සහ විද්‍යුත් මාධ්‍ය හරහා ව්‍යාපාර අවස්ථා උදකිරීම් තුළින් තවදුරටත් සහයෝගය ලබාදුණි. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ මූලිකත්වයෙන්, අපනයන සහ ව්‍යවසායක සංවර්ධන සංසදය තුළ දී රාජ්‍ය නිලධාරීන් සහ ව්‍යවසායකයන්, එකිනෙකා මුණගැස්සවීම තුළින් අපනයනකරුවන් මුහුණපාන ගැටළු විසඳ ගැනීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම සිදු කෙරිණි. තවද ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සකස් කල 'ජාතික අපනයන ප්‍රඥප්තිය: 2004-2008' මගින් ඉදිරිපත් කල නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම උදෙසා අදළ අමාත්‍යාංශ සහ අනෙකුත් වගකිවයුතු පුද්ගලයන් සමග සමීපව කටයුතු කරනු ලැබීය. අපනයන රක්ෂණ ණය හා ඇපකර නිකුත් කිරීම හරහා ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (SLECIC), 2005 වසරේදීත් අපනයනකරුවන්ට සහාය ලබා දුණි. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI), ශ්‍රී ලංකා ප්‍රමිතීන්ට අනුව අපනයනයන්හි තත්ත්වය පිළිබඳ වගකීම් සහතික සැපයීමට අමතරව, ලෝක වෙළෙඳ සංවිධානයේ (WTO) වෙළෙඳමට වූ තාක්ෂණික අවහිරතා හා සම්බන්ධිත ඇගයීම් විමර්ශන ක්‍රියාදමයේ දී අදළ ප්‍රමිතීන්, කාර්මික රෙගුලාසි සහ තත්ව නිර්ණය කිරීමේ පටිපාටීන් පිළිබඳ දැනුවත් කිරීමේ ජාතික මධ්‍යස්ථානය වශයෙන්ද කටයුතු කරයි.

- **ආර්ථික සංවර්ධනය උදෙසා වන ජාතික කවුන්සිලය (NCED) යටතේ ක්‍රියාත්මක වන වෙළෙඳම හා තීරුබදු සහ අපනයන පිළිබඳ වූ කමිටු මගින් ප්‍රතිපත්තීන් සහ ක්‍රියාකාරිත්වය විමර්ශනය කරන ලදී**. මේ අනුව දේශීය අන්තර් භාණ්ඩ සැපයුම්කරුවන් වෙත වූ එකතු කල අගයමත වූ බදු (VAT) පහත හෙළීම, උසස් තාක්ෂණය ලබා ගැනීම උදෙසා තීරුබදු රහිත සහන ලබා දීම, තාක්ෂණික ප්‍රවර්ධනයන් උදෙසා මූල්‍ය පහසුකම් ලබාදීම, එකතු කල අගය මත වූ බදු ගණනය සරල කිරීම සහ ඇහළුම් මිලදී ගන්නා කාර්යාල වෙත ශුන්‍ය තීරුබදු ව්‍යුහයක් ඉදිරිපත් කිරීම යන උපාය මාර්ග රාශියක් නිර්දේශ කරන ලදී.

- **2005 වසරේ දී තීරුබදු ව්‍යුහය තවදුරටත් තාර්කික බවට පත් කල නමුදු. එකිනෙකට වෙනස් වූ පරමාර්ථයන් රාශියක් සපුරාගතයුතු ආකාරය ද සැලකිල්ලට ගත යුතුව ඇත**. තීරුබදු ඉවත් කිරීම මගින් තවදුරටත් ලිහිල් වූ වෙළෙඳම, ආර්ථික ප්‍රතිලාභ අත්පත් කරදීමට සමත් වුවද, තීරුබදු පැනවීමේ අනෙකුත් අභිමතාර්ථයන් වන රාජ්‍ය ආදයම ඉහල නැංවීම, දේශීය නිෂ්පාදකයන්ට ආරක්ෂණය ලබාදීම හා කර්මාන්තයන්ට විශේෂිත දිරිගැන්වීම් ලබාදීම යනාදිය වෙළෙඳම ලිහිල්කරණය මගින් අපේක්ෂිත පරමාර්ථ හා එකිනෙක ගැටේ. කලින් වර්ෂයේ පැවති සියයට 3, සියයට 6, සියයට 12, සියයට 16, සියයට 20 සහ සියයට 27.5 යන සයවිධි තීරුබදු ව්‍යුහය, 2005 වසරේ දී සියයට 0, සියයට 2.5, සියයට 6, සියයට 15, සියයට 28 යන ආකාරයෙන් වූ තීරුබදු ව්‍යුහයක් ලෙසට ප්‍රතිස්ථාපනය කරන ලදී. මෙහි දී මූලික අමුද්‍රව්‍ය අවම තීරුබදු ව්‍යුහයක පවත්වාගත් අතර දන්තර් භාණ්ඩ අතර මැදි තීරුබදු පරාසයක පවත්වා ගැනිණි. නිමි භාණ්ඩ ඉහළ තීරුබදු තලයකට යටත් කරන ලදී. මුද්‍රණ වියදම අඩු කරනු වස් සියළුම ආකාරයේ ආනයනික කඩදසි තීරු බද්දෙන් නිදහස් කරන ලදී. පාම් තෙල්, විදුලි පංකා සහ විදුලි උපකරණ අමතර කොටස් වැනි විශේෂිත අයිතමයන් කිහිපයක්, දේශීය නිෂ්පාදකයින් ආරක්ෂා කරනු වස් ඉහළ තීරුබදු ව්‍යුහයකට යටත් කරන ලදී. දේශීය ගොවියන් ආරක්ෂා කරනු වස් සහල්, තිරිඟු ඇට හා තිරිඟු පිටි මත වූ බදු අත්හැරීම් 2005 වසරේ දී ඉවත් කරන ලදී. උසස් තාක්ෂණයෙන් යුත් නවීන යන්ත්‍රෝපකරණ ආනයන සඳහා තීරුබදු සහනයන් ප්‍රදනය කරන ලදී. කිරි පිටි, අර්තාපල්, පරිප්පු, සහල්, සීනි සහ ළදරු ආහාර වැනි ආහාර වර්ග සහ සිමෙන්ති, කඩදසි වර්ග සහ ත්‍රී රෝද හැර අනෙකුත් සියළුම ආනයන භාණ්ඩ සඳහා වූ සියයට 10 ක අධිභාරය තවදුරටත් ක්‍රියාත්මක විය. ත්‍රිරෝද හිමියන් සඳහා සහන සැපයීමේ අරමුණින් ත්‍රී රෝද ටයර් සඳහා ආනයන බද්ද සියයට 28 සිට සියයට 15 දක්වා අඩු කරන ලදී. රාජ්‍ය ආදයම වැඩිකරනු වස්, වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බද්ද (PAL) සියයට 1 සිට සියයට 1.5 දක්වා වැඩි කරන ලදී. කෙසේ නමුදු අපනයකරුවන් දිරිගැන්වීම පිණිස ඔවුන්

වෙත පනවා තිබූ වරාය සහ ගුවන් සේවා බද්ද සියයට 0.25 දක්වා අඩු කරන ලදී. සිගරට්, ඛනිජ තෙල් නිෂ්පාදිත, පානීය ජලය සහ මෝටර් රථ සඳහා පනවා තිබූ නිෂ්පාදන බද්ද, කල්පවත්නා පාරිභෝගික භාණ්ඩවන වායු සමීකරණ, ශීතකරණ, රෙදි සෝදන යන්ත්‍ර, රූපවාහිනී, රූපවාහිනී ඇන්ටෙනා සහ විදුලි උපකරණ ද ආවරණය කෙරෙන පරිදි පුළුල් කරන ලදී. 2005 වසරේ දී ත්‍රී රෝද, ලොරි සහ පුද්ගලයන් ප්‍රවාහනය කරන බස් හැර සෑම ආනයනික හෝ අළුතින්ම ලියාපදිංචි කරනු ලබන මෝටර් රථයකට රු.5,000ක රඳවා තබා ගැනීමේ බද්දක් පනවන ලදී. ශ්‍රී ලංකාවට තවදුරටත් ප්‍රමිතියෙන් අඩු වාහන ආනයනය අධෛර්යමත් කිරීමේ අරමුණින් ආනයන පරීක්ෂා කිරීමේ සහ සහතික කිරීමේ ක්‍රමයක් 2005 වසරේ දී ආරම්භ කරන ලදී. සංගීත අධ්‍යාපනය සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් සංගීත භාණ්ඩ වෙත පනවා තිබූ සියයට 28 ක බද්ද සියයට 15

5.2 සංඛ්‍යා සටහන

සාමාන්‍ය ආනයන බදු එකතු කිරීමේ අනුපාත (අ)

ශීර්ෂය	2001	2002	2003	2004	2005(ආ)
පාරිභෝගික භාණ්ඩ	**13.3**	**13.3**	**13.5**	**10.4**	**10.4**
ආහාර හා පාන වර්ග	15.3	14.4	14.2	8.5	9.6
සහල්	21.2	32.9	29.1	4.9	10.6
පිටි	13.3	12.3	11.5	7.2	3.8
සීනි	16.2	16.0	16.8	4.6	1.5
තිරිඟු හා ධාන්‍ය	0.0	0.0	0.0	0.1	1.1
කිරි හා කිරි නිෂ්පාදන	15.3	11.9	12.2	7.9	10.2
කරවල	2.0	7.9	10.8	5.9	5.9
වෙනත් මාළු නිෂ්පාදන	6.3	6.8	7.9	10.0	9.8
වෙනත් ආහාර	25.4	22.9	22.3	17.4	22.0
ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ	10.9	12.1	13.0	12.2	11.1
මෝටර් රථ හා යතුරු පැදි	21.1	23.3	22.1	21.1	18.9
ගුවන් විදුලි යන්ත්‍ර හා රූපවාහිනී යන්ත්‍ර	8.3	8.6	8.9	9.4	13.6
රබර් ටයර් හා ටියුබ්	29.6	27.9	26.0	25.8	26.2
බෙහෙත් හා ඖෂධ නිෂ්පාදන	0.6	0.6	0.6	0.6	0.5
ආහාර නොවන වෙනත් ද්‍රව්‍ය	9.7	9.4	9.2	8.9	8.7
අන්තර් භාණ්ඩ	**1.7**	**1.6**	**1.5**	**1.9**	**1.9**
පොහොර	-	0.4	2.6	3.1	2.7
බොරතෙල්	...	0.0	0.0	0.0	0.0
වෙනත් ඛනිජ තෙල්	0.9	0.8	0.8	0.9	0.9
රසායන ද්‍රව්‍ය හා සංයෝග	3.3	1.1	2.2	2.6	2.0
ඩයි වර්ග, පදම් කිරීමේ හා වර්ණ වර්ග	6.3	4.0	4.6	4.5	4.4
කඩදාසි හා ඝන කඩදාසි	6.7	5.2	5.4	6.0	6.0
රෙදිපිළි හා ඇඟළුම්	0.1	0.1	0.1	0.0	0.1
වෙනත් අන්තර් භාණ්ඩ	4.2	4.3	3.3	4.3	4.5
ආයෝජන භාණ්ඩ	**5.3**	**5.5**	**7.2**	**6.1**	**5.8**
ගොඩනැගිලි ද්‍රව්‍ය	9.3	7.4	7.7	9.0	7.8
ගමනාගමන උපකරණ	10.3	11.0	12.9	11.9	9.7
යන්ත්‍ර සූත්‍ර හා උපකරණ	2.7	3.7	5.6	3.2	3.3
වෙනත් ආයෝජන භාණ්ඩ	4.2	3.8	4.6	5.0	5.3
එකතුව	**4.9**	**4.8**	**5.3**	**4.5**	**4.3**

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
සීමාසහිත ප්‍රීමා ලංකා සමාගම

(අ) මුළු තීරුබදු එකතුව මුළු ආනයන වටිනාකමෙහි (පි. ර. ගැ.) ප්‍රතිශතයක් ලෙස
(ආ) තාවකාලිකයි

දක්වා අඩු කරන ලදී. මෙම සියළුම තීරුබදු සංශෝධනවල අවසාන ප්‍රතිඵලය ලෙස 2004 වසරේ සියයට 4.5ක් වූ ආනයනික තීරුබදුවල සාමාන්‍ය අගය 2005 වසරේ දී සියයට 4.3ක් දක්වා පහත වැටිණි. අදාළ කර්මාන්තයන් හි පර්යේෂණ කටයුතු සහ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන උපයා ගැනීම සහ දේශීය කර්මාන්තයන් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍යයන්හි සුලභතාව සහතික කිරීම යන අරමුණු පෙරදැරිව අයිතමයන් කීපයක් සෙස් බද්දකට යටත් කොට තිබුණි. තේ, පොල් සහ රබර්, අපනයන මත පනවා තිබූ සෙස් බද්දට අමතරව කුරුඳු සඳහා ද 2005 වසරේ දී සෙස් බද්දක් හඳුන්වා දෙන ලදී.

- **2006 වසරේදී විදේශීය රැකියා 150,000 සපුරා ගැනීමේ අවශ්‍යතාවය 2006 අයවැය මගින් යෝජනා කර ඇත**. විදේශ ශ්‍රමිකයන් උපයන ආදායම, තවදුරටත් රටෙහි ප්‍රධාන විදේශ විනිමය උපයන ප්‍රභවයක් වන බැවින්, රැකියා අවස්ථා ඉහළ නැංවීම සඳහා තවදුරටත් ද්විපාර්ශ්වික ගිවිසුම්වලට එළඹීමට ඇති හැකියාව සොයා බැලීම සහ හෙදි, නාවික හා තොරතුරු තාක්ෂණය වැනි ක්ෂේත්‍රයන්ට අදාළව විශේෂ පුහුණු වැඩසටහන් දියත් කිරීමේ අවශ්‍යතාවයද අයවැය මගින් යෝජනා කර ඇත. විදේශ සේවයෙන් පසු නැවත පැමිණෙන සේවා නියුක්තිකයන්ට ස්වයං රැකියා ව්‍යාපෘති දිරිගන්වනු වස්, වසර 2 කට වැඩි අඛණ්ඩ සේවාවකින් පසු තම රටට පැමිණෙන විදේශ සේවානියුක්තිකයන්හට විදේශයන් හි රැඳී සිටි කාල සීමාව පදනම් කරගෙන එ.ජ.ඩොලර් 5,000 දක්වා වූ විශේෂිත තීරුබදු රහිත දීමනාවක් ප්‍රදානය කිරීමට රජය යෝජනා කර තිබේ. ඔවුන් මෙරටට පැමිණි දින සිට මාස 6 ක කාලසීමාවක් දක්වා මෙම දීමනාව භාවිතා කිරීමේ හැකියාව ද ලබා දී ඇත.

5.3 භාණ්ඩ වෙළෙඳාම සහ වෙළෙඳ ශේෂය

- **ලෝක ආර්ථිකය අඛණ්ඩව වර්ධනය වීම, දේශීය ආර්ථිකය තවදුරටත් ලෝක ආර්ථිකය හා බද්ධ වීම, දේශීය ප්‍රතිපත්තීන්හි පැවති හිතකර භාවය සහ දේශීය ආර්ථික කටයුතු වල සිදුවූ වර්ධනය තුළින් ඇති වූ වාසිදායක පසුබිම 2005 වසරේදී විදේශ වෙළෙඳාමෙහි ඉහළ වර්ධනයක් ඇති වීමට ඉවහල් විය**. 2004 වසරේ දී සියයට 12.2 වූ වර්ධනය තවදුරටත් ඉක්මවමින්, 2005 වසරේ දී අපනයන ආදායම, සියයට 10.2කින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 6,347 දක්වා වැඩි විය. 2004 වසරේ දී වූ සියයට 19.9ක වර්ධනය හා සැසඳීමේ දී, 2005 වසරේ ආනයන වියදම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 8,863 දක්වා සියයට 10.8කින් වැඩි විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස වෙළෙඳ හිඟය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,516 දක්වා එ.ජ.ඩොලර් දශ ලක්ෂ 274කින් පුළුල් විය.

- **2005 වසරේ දී, අපනයන මිල ගණන් සියයට 3.3කින් සහ අපනයන පරිමාව සියයට 6.7කින් වැඩි වූ නමුදු ආනයන මිල සියයට 7.8කින් සහ ආනයන පරිමාව සියයට 2.7කින් වැඩිවිය**. මෙහි ප්‍රතිඵලයක් ලෙස වෙළෙඳ

අනුපාතය සියයට 4.2කින් පහත වැටුණි. ප්‍රධාන ගැනුම්කරුවන්ගේ අඛණ්ඩ ඉල්ලුම හා භාණ්ඩවල ගුණාත්මකභාවය, තේ මිල ඉහළ යාමට හේතු විය. පොල් අපනයන මිල ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ කපාපු පොල්, කොප්පරා සහ පොල් තෙල් සඳහා පකිස්ථානය සහ මැදපෙරදිග රටවලින් ඇතිවූ ඉල්ලුම ඉහළ යාමය. අධික ලෙස ඉහළ ගිය ඛනිජ තෙල් මිල හේතුවෙන් ඉහළ ගිය කෘතිම රබර් මිල හා සමානුපාතිකව ස්වාභාවික රබර් මිල ගණන් ද ඉහළ ගියේය. මෙම නිෂ්පාදිතයන්හි මිල ඉහළ යාම, 2005 වසරේ බහුකෙඳි ගිවිසුම නිමවීමෙන් අනතුරුව ඇති වූ තීව්‍ර තරගකාරිත්වය හමුවේ පහළ වැටුණු රෙදිපිළි හා ඇඟළුම් මිලෙහි බලපෑම සමනය කිරීමට ප්‍රමාණවත් විය. ඛනිජ තෙල්, පොහොර, රසායනික සංයෝග, ගොඩනැගිලි ද්‍රව්‍ය, ප්‍රවාහන උපකරණ සහ පාරිභෝගික ද්‍රව්‍ය යනාදියෙහි මිල ඉහළයාම පිළිබිඹු කරමින් ආනයන මිල වැඩිවිය.

අපනයන ක්‍රියාකාරිත්වය

- **අපනයන තුළ කාර්මික අපනයන තවදුරටත් ප්‍රමුඛස්ථානය ගත් අතර ඉන්පසුව පිළිවෙළින් කෘෂිකාර්මික හා ඛනිජ අපනයන විය.** මුළු අපනයනයන්ගෙන් සියයට 78 කට දායක වූ කාර්මික අපනයන

5.3 සංඛ්‍යා සටහන

වෙළෙඳ දර්ශක (අ)

(1997=100)

ශීර්ෂය	2004 වටිනාකම් දර්ශකය	2004 පරිමා දර්ශකය	2004 ඒකක වටිනාකම් දර්ශකය	2005 (ආ) වටිනාකම් දර්ශකය	2005 (ආ) පරිමා දර්ශකය	2005 (ආ) ඒකක වටිනාකම් දර්ශකය	වර්ධන වේගය (ආ) වටිනාකම් දර්ශකය	වර්ධන වේගය (ආ) පරිමා දර්ශකය	වර්ධන වේගය (ආ) ඒකක වටිනාකම් දර්ශකය
අපනයන									
කෘෂිකාර්මික අපනයන	**100.3**	**112.9**	**88.8**	**108.6**	**116.1**	**93.5**	**8.3**	**2.9**	**5.3**
තේ	102.5	113.8	90.1	112.4	117.3	95.8	9.7	3.1	6.4
රබර්	65.3	65.6	99.5	59.7	53.9	110.7	-8.6	-17.8	11.2
පොල්	96.1	112.8	85.2	96.3	102.3	94.1	0.2	-9.3	10.5
අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන	111.7	134.6	83.0	126.5	155.6	81.3	13.3	15.6	-2.0
කාර්මික අපනයන	**130.9**	**135.4**	**96.7**	**143.7**	**145.4**	**98.9**	**9.8**	**7.4**	**2.3**
රෙදිපිළි හා ඇඟළුම්	123.2	127.7	96.5	127.0	134.4	94.5	3.0	5.3	-2.1
ඛණිජතෙල් නිෂ්පාදන	102.3	59.4	172.1	134.5	54.4	247.4	31.5	-8.5	43.7
වෙනත් කාර්මික අපනයන	149.8	158.9	94.3	180.3	177.1	101.8	20.3	11.5	8.0
ඛණිජ ද්‍රව්‍ය අපනයන	**134.2**	**96.1**	**139.7**	**160.4**	**115.5**	**138.8**	**19.5**	**20.3**	**-0.6**
මැණික්	130.7	96.2	135.8	144.9	115.7	125.3	10.9	20.2	-7.8
අනෙකුත් ඛණිජ ද්‍රව්‍ය අපනයන	181.5	94.5	192.1	365.0	114.1	319.8	101.1	20.8	66.5
මුළු අපනයන	**123.9**	**129.4**	**95.7**	**136.5**	**138.0**	**98.9**	**10.2**	**6.7**	**3.3**
ආනයන									
පාරිභෝගික භාණ්ඩ	**132.9**	**158.4**	**83.9**	**138.6**	**159.8**	**86.7**	**4.3**	**0.9**	**3.4**
ආහාර හා පාන වර්ග	92.8	102.5	90.6	95.2	101.3	94.0	2.5	-1.2	3.8
වෙනත් පාරිභෝගික භාණ්ඩ	191.1	239.5	79.8	201.7	244.9	82.4	5.6	2.3	3.2
අන්තර් භාණ්ඩ	**149.2**	**135.7**	**110.0**	**168.7**	**139.3**	**121.1**	**13.1**	**2.7**	**10.1**
පොහොර	160.7	130.4	123.2	203.3	135.7	149.8	26.5	4.1	21.6
බොර තෙල්	229.2	121.3	189.0	292.7	110.7	264.4	27.7	-8.7	39.9
අනෙකුත් ඛණිජ තෙල්	219.3	110.3	198.9	320.4	132.5	241.8	46.1	20.1	21.6
රසායනික ද්‍රව්‍ය සහ සංයෝග	151.4	150.6	100.5	182.8	143.2	127.6	20.7	-4.9	27.0
තිරිඟු සහ ධාන්‍ය	132.9	125.8	105.6	102.6	109.5	93.7	-22.8	-13.0	-11.2
රෙදිපිළි	109.2	125.0	87.4	110.4	131.8	83.8	1.1	5.5	-4.1
ප්ලාස්ටික්	166.2	159.0	104.5	201.7	176.3	114.4	21.4	10.9	9.5
දියමන්ති	163.6	125.7	130.1	192.5	139.4	138.1	17.6	10.8	6.1
වෙනත් අන්තර් භාණ්ඩ	156.0	174.4	89.4	183.4	181.6	101.0	17.6	4.1	12.9
ආයෝජන භාණ්ඩ	**125.9**	**172.8**	**72.9**	**141.0**	**180.0**	**78.3**	**12.0**	**4.2**	**7.5**
ගොඩනැගිලි ද්‍රව්‍ය	147.9	169.0	87.5	186.6	190.9	97.8	26.1	12.9	11.7
ප්‍රවාහන උපකරණ	123.3	93.7	131.6	156.3	104.8	149.2	26.8	11.8	13.4
යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	115.3	205.5	56.1	115.7	204.4	56.6	0.3	-0.6	0.9
වෙනත් ආයෝජන භාණ්ඩ	149.5	106.2	140.8	171.8	127.6	134.6	14.9	20.2	-4.4
මුළු ආනයනය	136.4	148.8	91.7	151.1	152.8	98.9	10.8	2.7	7.8
වෙළෙඳ අනුපාතය			104.4			100.0			-4.2

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) එ.ජ. ඩොලර් වටිනාකම අනුව
(ආ) තාවකාලික

2005 වසරේදී සමස්ත අපනයන වර්ධනයට සියයට 75කින් දයක විය. මුළු අපනයනයන්ගෙන් සියයට 18කට දයකවූ කෘෂිකාර්මික අපනයන සමස්ත වර්ධනයට සියයට 15ක දයකත්වයක් සැපයූ අතර, අපනයනයන්ගෙන් සියයට 4ක ප්‍රතිශතයක් නියෝජනය කළ ඛනිජ හා අනෙකුත් අපනයන සමස්ත අපනයන වර්ධනයට සියයට 10කින් දයක විය.

- **2005 වසරේ දී, කාර්මික අපනයන සියයට 9.8කින් වර්ධනය විය.** මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් රබර් ආශ්‍රිත නිෂ්පාදිත, රෙදිපිළි හා ඇඟළුම් සහ ආහාර හා පාන වර්ගයන්හි ඉහළ ක්‍රියාකාරිත්වය හේතු විය. මුළු අපනයනයන්ගෙන් සියයට 46කට දයක වූ රෙදිපිළි හා ඇඟළුම්, ඉහළ අපනයන පරිමාවක් පිළිබිඹු කරමින් සියයට 3කින් වර්ධනය විය. රෙදිපිළි හා ඇඟළුම් අපනයන පරිමා දර්ශකය සියයට 5.3කින් වර්ධනය වූ අතර ඒකක මිල දර්ශකය සියයට 2.1කින් පහත වැටුණි. රෙදිපිළි හා ඇඟළුම් සඳහා වන විශාලතම ගැනුම්කරු වන ඇමෙරිකා එක්සත් ජනපදය වෙත වූ අපනයන සියයට 6.1කින් වර්ධනය විය. ඇමෙරිකා එක්සත් ජනපදය විසින් චීනයෙන් ආනයනය කල රෙදිපිළි හා ඇඟළුම් සඳහා පනවන ලද වාරණයන් සහ ශ්‍රී ලංකාවේ ප්‍රධානම අපනයන ඇඟළුම් කාණ්ඩයන් සඳහා වර්ධනය වෙමින් පැවති ඉල්ලුම, ඇමෙරිකා එක්සත් ජනපදය තුළ ශ්‍රී ලංකාවේ වෙළෙඳපොළ කොටස වැඩිවීමට ඉවහල් විණි. භාණ්ඩවල ප්‍රභව හා ආශ්‍රිත ගැටළු හේතුවෙන්, වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය+ යටතේ අපේක්ෂිත වාසිදයක තත්ත්වයන් ලබා ගැනීමට නොහැකි වූ බැවින්, දෙවන විශාලතම අපනයන වෙළෙඳපොළ වන යුරෝපීය සංගමය වෙත අපනයනය කළ රෙදිපිළි හා ඇඟළුම් මද වශයෙන් පමණක් ඉහල ගියේය. ඉදිරියේ දී යුරෝපීය සංගමයට අපනයනය කරනු ලබන රෙදිපිළි හා ඇඟළුම් ඉහළ නැංවීම අරමුණුකොටගෙන යුරෝපීය සංගමය සමග සාකච්ඡා පවත්වමින් සිටී. ඇමෙරිකා එක්සත් ජනපදය හා යුරෝපීය සංගමයෙන් ඇතිවූ ඉල්ලුම ඉහළ යාම හේතුවෙන් රබර් ටයර් හා ටියුබ් සහ ශල්‍ය වෛද්‍ය අත් ආවරණ අපනයන් 2005 වසරේදී කැපීපෙනන ලෙස ඉහළ ගියේය. ගෝලීය ඉල්ලුම හමුවේ මැණික්, ස්වර්ණාභරණ සහ දියමන්ති අපනයනයන් ද 2005 දී සතුටුදයක වර්ධනයක් අත්කර ගත්තේය. 2005 වසරේ අගෝස්තු මාසයේ සිට මැණික්, ස්වර්ණාභරණ හා වටිනා ලෝහ ආනයනය සහ වෙළෙඳම මත වූ වැට් බද්ද ඉවත් කිරීම හේතුවෙන් මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට වාසිදයක තත්ත්වයක් උදවිය.

5.4 සංඛ්‍යා සටහන

අපනයන සංයුතිය

කාණ්ඩය	2004		2005 (අ)		වටිනාකමේ වෙනස (අ)	වර්ධන වේගය (අ)	වර්ධනයට වූ දයකත්වය (අ)
	වටිනාකම එ.ජ. ඩොලර් දශලක්ෂ	දයකත්වය %	වටිනාකම එ.ජ. ඩොලර් දශලක්ෂ	දයකත්වය %	එ.ජ. ඩොලර් දශලක්ෂ		
1. කෘෂිකාර්මික අපනයන	**1,065.2**	**18.5**	**1,153.8**	**18.2**	**88.6**	**8.3**	**15.0**
තේ	738.9	12.8	810.2	12.8	71.3	9.6	12.1
රබර්	51.3	0.9	46.9	0.7	-4.4	-8.6	-0.7
පොල්	113.1	2.0	113.3	1.8	0.2	0.2	0.0
මද නිෂ්පාදන	58.6	1.0	48.8	0.8	-9.8	-16.7	-1.7
වෙනත්	54.5	0.9	64.5	1.0	10.0	18.3	1.7
වෙනත් කෘෂිකාර්මික නිෂ්පාදන	161.9	2.8	183.4	2.9	21.5	13.3	3.6
2. කාර්මික අපනයන	**4,506.1**	**78.3**	**4,948.4**	**78.0**	**442.3**	**9.8**	**75.0**
ආහාර, පාන වර්ග හා දුම්කොළ	175.1	3.0	318.2	5.0	143.1	81.7	24.3
රෙදිපිළි හා ඇඟළුම්	2,808.9	48.8	2,894.6	45.6	85.7	3.1	14.5
ඛණිජ නිෂ්පාදන	99.6	1.7	130.9	2.1	31.3	31.4	5.3
රබර් නිෂ්පාදන	282.9	4.9	394.4	6.2	111.5	39.4	18.9
පිගන් නිෂ්පාදන	46.8	0.8	47.1	0.7	0.3	0.6	0.1
සම්, සංචාරක භාණ්ඩ හා සපත්තු	42.6	0.7	43.8	0.7	1.2	2.8	0.2
යන්ත්‍ර සූත්‍ර හා උපකරණ	385.7	6.7	329.9	5.2	-55.8	-14.5	-9.5
දියමන්ති හා ස්වර්ණාභරණ	265.3	4.6	277.9	4.4	12.6	4.7	2.1
අනෙකුත් කාර්මික උපකරණ	399.2	6.9	511.7	8.1	112.5	28.2	19.1
3. ඛණිජ අපනයන	**120.0**	**2.1**	**143.3**	**2.3**	**23.3**	**19.4**	**4.0**
මැණික්	108.5	1.9	120.3	1.9	11.8	10.9	2.0
වෙනත්	11.5	0.2	23.0	0.4	11.5	100.0	2.0
4. වර්ග නොකළ අපනයන (ආ)	**66.0**	**1.1**	**101.2**	**1.6**	**35.2**	**53.3**	**6.0**
මුළු අපනයන (ඇ)	**5,757.3**	**100.0**	**6,346.7**	**100.0**	**589.4**	**10.2**	**100.0**
වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතය	101.19		100.50				

(අ) තාවකාලික
(ආ) ප්‍රති අපනයන ඇතුළත් ය
(ඇ) ගලපන ලද

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව හා වෙනත් ඛණිජ තෙල් ද්‍රව්‍ය අපනයනකරුවෝ
ශ්‍රී ලංකා මහ බැංකුව
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

5.3 රූප සටහන

ප්‍රධාන කාණ්ඩ අනුව අපනයන සංයුතිය



- **සියයට 2.9ක අපනයන පරිමා වර්ධනයක් හා සියයට 5.3ක ඒකක මිලෙහි වර්ධනයක් පිළිබිඹු කරමින් 2005 දී කෘෂිකාර්මික අපනයන සියයට 8.3කින් වර්ධනය විය.** මෙම වර්ධනයට මූලික වශයෙන් හේතු වූයේ කි.ග්‍රෑ.දශ ලක්ෂ 309 ක වාර්තාගත අපනයන පරිමාවක් සහිතව ඉහළ මිල ගණන් යටතේ සිදුවූ තේ අපනයනවල ඉහළ ක්‍රියාකාරීත්වයයි. සියයට 19ක ප්‍රතිශතයක් සහිතව 2005 වසරේදීද, රුසියාව විශාලතම තේ ගැනුම්කරු වූ අතර, ඉන්පසු විශාලතම ගැණුම්කරුවන් වූයේ එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ සිරියාව යන රටවල් වේ. අනෙකුත් මූලිකම වෙළෙඳපොළවල් වූයේ ඉරානය, තුර්කිය, ජෝර්දනය සහ සෞදි අරාබිය යන රටවල්ය. පොල් ඵලදාවේ අඩුවීම හේතුවෙන් පොල් අපනයනවල ඉපැයීම් සියයට 0.2කින් පමණක් ආන්තිකව වැඩි විය. රබර් ආශ්‍රිත කර්මාන්තයන් හි ඉහළ පරිභෝජනය හේතුකොට ගෙන ස්වාභාවික රබර් අපනයන සියයට 8.6කින් පහත වැටිණි. ඛනිජ තෙල් සහ කෘත්‍රිම රබර්වල ඉහළ මිල ගණන් හේතුවෙන් අන්තර් ජාතික වෙළෙඳපොළ තුළ ස්වාභාවික රබර් මිල නුදුරු අනාගතයේදීද ඉහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂිතය. එළවළු, ගම්මිරිස්, කුරුඳු සහ කරාබුනැටි අපනයනයන්හි ඉහළයාම පිළිබිඹු කරමින් අනෙකුත් කෘෂිකාර්මික භෝග අපනයනයන් සියයට 13.2කින් වැඩි විය. ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ ඉන්දියානු වෙළෙඳපොළට තීරුබදු රහිතව පිවිසීමේ හැකියාව සහ මැද පෙරදිග රටවලින් ඇති වූ ඉල්ලුම හේතුකොට මෙම නිෂ්පාදිතයන් සඳහා වූ බාහිර ඉල්ලුම ඉහළ ගියේය.

- **යුරෝපීය සංගමයෙහි නව ආරක්ෂණ ප්‍රමිතීන්, තේ අපනයනයට බලපාන ආකාරය පිළිබඳව අවධානය යොමු කළ යුතුව ඇත.** 2006 ජනවාරි මස සිට බලපැවැත්වෙන පරිදි යුරෝපීය සංගමය විසින් පනවන ලද 'උපද්‍රව විශ්ලේෂණ සහ තීරණාත්මක පාලන ස්ථාන (HACCP)' ප්‍රමිතිකරණය අනුව, යුරෝපීය වෙළෙඳපොළට අපනයනය සඳහා නිපදවන සියළු කර්මාන්ත ශාලා විසින් ආහාර නිෂ්පාදන ක්‍රියාවලියේ සිට වෙළෙඳපොළට පිවිසෙන තෙක් වූ මුළු ක්‍රියාවලිය තුළ මෙම ප්‍රමිතීන් පිළිපැදිය යුතු වේ. ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා තේ ආනයනික රටවල්වලින් අදළ ආහාර ආරක්ෂණ ප්‍රමිතීන් සපුරා ගැනීම සඳහා අවශ්‍ය සහාය දීම පිණිස ක්‍රියාමාර්ග රාශියක් ගෙන ඇත. කෙසේ නමුදු, යුරෝපීය සංගමය විසින් මෙම ප්‍රමිතීන් සපුරාගැනීමට 2006 ජුනි මස දක්වා වූ සහන කාල සීමාවක් ලබා දී ඇත. සමහර තේ නිෂ්පාදිත සහ අපනයනික සමාගම් දැනටමත් මෙම ප්‍රමිතීන් ලබා ගෙන ඇති අතර අනෙකුත් සමාගම් රාශියක් 2006 ජුලි මසට පෙර අදළ ප්‍රමිතීන් සපුරා ගැනීමට අපේක්ෂිතය. අනෙකුත් සමාගම් ද මෙම ප්‍රමිතීන් ලබා ගැනීම උදෙසා ධෛර්යමත් කළ යුතුව ඇත.

- **ඛනිජ අපනයනයන්ගෙන් සියයට 84ක දායකත්වයක් පෙන්වූ මැණික් අපනයනයන්හි ඉහළ ක්‍රියාකාරීත්වය පිළිබිඹු කරමින් 2005 වසරේ දී ඛනිජ අපනයනයෙන් සියයට 19.5කින් වැඩි විය.** ශ්‍රී ලංකාව තවදුරටත් ලෝක වෙළෙඳපොළ තුළ ඉහළ ප්‍රමිතියකින් යුතු විශාලතම නිල් මැණික් සැපයුම්කරු විය. ආවේනික ලක්ෂණයන්ගෙන් හෙබි නිල් මැණික් "සිලෝන් සැපයර්" නාමය යටතේ අපනයනය කිරීමට රජය විසින් ක්‍රියාමාර්ග රාශියක් ගෙන ඇත. 2005 වසරේ දී ඇමෙරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ විශාලතම මැණික් ගැනුම්කරු වූ අතර, ඉන් අනතුරුව ප්‍රධාන ගැනුම්කරුවන් වූයේ තායිලන්තය සහ ස්විස්ටර්ලන්තය වේ.

ආනයන ක්‍රියාකාරීත්වය

- **2005 දී ඉහළ ඉල්ලුම සහ මිල ගණන් පිළිබිඹු කරමින් ආනයනයන් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 8,863 දක්වා සියයට 10.8කින් වර්ධනය විය.** අධිප්‍රමාණය වූ විනිමය අනුපාතය, පොලී අනුපාතික පහළ මට්ටමක පැවතීම, ඉහළ ආර්ථික ක්‍රියාකාරීත්වය සහ සුනාමි ව්‍යසනයට ලක් වූ ප්‍රදේශවල ප්‍රතිසංස්කරණ කටයුතු හේතුවෙන් අන්තර්, ආයෝජන සහ පාරිභෝගික භාණ්ඩ යන ප්‍රධාන කාණ්ඩ සඳහා වූ ආනයන ඉල්ලුම ඉහළ ගියේය.

5.5 සංඛ්‍යා සටහන
ආනයන සංයුතිය

කාණ්ඩය	2004 වටිනාකම එ.ජ. ඩොලර් දශලක්ෂ	2004 දායකත්වය %	2005 (අ) වටිනාකම එ.ජ. ඩොලර් දශලක්ෂ	2005 (අ) දායකත්වය %	වටිනාකමේ වෙනස (අ) එ.ජ. ඩොලර් දශලක්ෂ	වර්ධන වේගය (අ) %	වර්ධනයට වූ දායකත්වය (අ) %
1. පාරිභෝගික භාණ්ඩ	**1,623.5**	**20.3**	**1,643.9**	**18.5**	**20.5**	**1.3**	**2.4**
ආහාර හා පාන වර්ග	779.1	9.7	752.6	8.5	-26.5	-3.4	-3.1
සහල්	59.4	0.7	15.6	0.2	-43.8	-73.8	-5.1
සීනි	111.4	1.4	132.3	1.5	20.8	18.7	2.4
තිරිඟු	183.1	2.3	141.4	1.6	-41.7	-22.8	-4.8
වෙනත්	425.2	5.3	463.3	5.2	38.2	9.0	4.4
වෙනත් පාරිභෝගික භාණ්ඩ	844.4	10.6	891.4	10.1	46.9	5.6	5.4
2. අන්තර් භාණ්ඩ	**4,645.4**	**58.1**	**5,317.1**	**60.0**	**671.8**	**14.5**	**77.8**
බනිජ තෙල්	1,209.3	15.1	1,655.3	18.7	445.9	36.9	51.6
පොහොර	106.7	1.3	135.0	1.5	28.3	26.5	3.3
රසායනික ද්‍රව්‍ය	205.9	2.6	248.6	2.8	42.7	20.7	4.9
රෙදිපිළි හා ඇඟළුම්	1,514.1	18.9	1,531.0	17.3	16.9	1.1	2.0
වෙනත් අන්තර් භාණ්ඩ	1,609.4	20.1	1,747.3	19.7	137.9	8.6	16.0
3. ආයෝජන භාණ්ඩ	**1,669.9**	**20.9**	**1,869.6**	**21.1**	**199.7**	**12.0**	**23.1**
යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	857.4	10.7	860.4	9.7	3.0	0.3	0.3
ගමනාගමන උපකරණ	256.6	3.2	325.3	3.7	68.7	26.8	8.0
ගොඩනැගිලි ද්‍රව්‍ය	402.0	5.0	507.0	5.7	105.0	26.1	12.2
වෙනත් ආයෝජන භාණ්ඩ	153.9	1.9	176.9	2.0	23.0	14.9	2.7
4. වර්ග නොකළ ආනයන	**61.1**	**0.8**	**32.6**	**0.4**	**-28.5**	**-46.7**	**-3.3**
මුළු ආනයන (ආ)	**7,999.8**	**100.0**	**8,863.2**	**100.0**	**863.4**	**10.8**	**100.0**
වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතය	101.19		100.50				

(අ) තාවකාලික
(ආ) ගලපන ලද

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ශ්‍රී ලංකා මහ බැංකුව
සීමාසහිත ලංකා ඉන්ඩියන් ඔයිල් සමාගම

- **ප්‍රධාන වශයෙන් ඛනිජ තෙල් නිෂ්පාදන සහ රෙදිපිළි ඇතුළත් වූ අන්තර් භාණ්ඩ ආනයනයන්, 2005 වසරේ දී සියයට 14.5කින් වර්ධනය විය.** 2005 වසරේ දී සියයට 39.8කින් ඉහළ ගිය බොර තෙල් මිල හේතුකොටගෙන සමස්ත ආනයනයෙන් සියයට 19ක් වූ ඛනිජ තෙල් සඳහා වූ ආනයන පිරිවැය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,655 දක්වා සියයට 36.9කින් ඉහළ ගියේය. බොර තෙල් බැරලයක මිල, 2003 වසරේ දී එ.ජ.ඩොලර් 29.46ක්ව පැවතියද, එය 2004 වසරේ දී එ.ජ.ඩොලර් 37.48 දක්වා ද 2005 වසරේ දී එ.ජ.ඩොලර් 52.39 දක්වා ද තවදුරටත් වැඩි විය. ඛනිජ තෙල් පිරිපහදු මධ්‍යස්ථානය දෙවසරකට වතාවක් සිදුකරන නඩත්තු කටයුතු සඳහා තාවකාලිකව වසා දැමීම හේතුවෙන් බොරතෙල් ආනයන පරිමාව සියයට 8.7කින් අඩු වූ නමුදු, 2005 දී පිරිපහදු කරන ලද අනෙකුත් ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන සියයට 10.8කින් වැඩි විය. 2004 වසරේ දී වාර්තාගත වූ සියයට 16.4ක වැඩිවීම හා සැසඳීමේදී, ඛනිජ තෙල් හැර අනෙකුත් සමස්ත ආනයන පිරිවැය 2005 වසරේ දී සියයට 6කින් පමණක් වැඩිවිය. 2005 වසර තුළ දී රසායනික ද්‍රව්‍ය, දියමන්ති, ස්වර්ණාභරණ, කඩදාසි සහ රබර් ආශ්‍රිත කර්මාන්තයන් සඳහා වූ අන්තර් භාණ්ඩ ආනයන ඉහළ ගියේය.
- **විශේෂයෙන්ම 2005 වසරේ දෙවන භාගයේ දී ආයෝජකයින්ගේ විශ්වාසනීයත්වය වැඩිවීම පිළිබිඹු කරමින් මෑත වසර කීපය තුළ නොකඩවා ප්‍රසාරණය වූ**

5.4 රූප සටහන
ප්‍රධාන කාණ්ඩ අනුව ආනයන සංයුතිය



5.6 සංඛ්‍යා සටහන
ප්‍රධාන ආනයනයන්හි පරිමාවන් (අ)

මෙට්‍රික් ටොන් දහස්

ශීර්ෂය	2001	2002	2003	2004 (ආ)	2005(ඇ)
සහල්	**52**	**95**	**35**	**222**	**52**
1 වන කාර්තුව	3	51	22	9	43
2 වන කාර්තුව	7	9	9	9	4
3 වන කාර්තුව	2	10	2	4	2
4 වන කාර්තුව	40	25	2	200	3
තිරිඟු	**760**	**993**	**919**	**993**	**864**
1 වන කාර්තුව	231	309	262	257	272
2 වන කාර්තුව	229	215	232	218	191
3 වන කාර්තුව	177	221	217	189	174
4 වන කාර්තුව	123	248	208	329	227
සීනි	**420**	**554**	**509**	**438**	**418**
1 වන කාර්තුව	100	146	151	98	49
2 වන කාර්තුව	127	141	135	173	167
3 වන කාර්තුව	109	110	104	71	94
4 වන කාර්තුව	84	157	119	96	108
ඛනිජ තෙල් (බොර තෙල්)	**1,954**	**2,300**	**1,995**	**2,200**	**2,008**
1 වන කාර්තුව	237	539	382	586	586
2 වන කාර්තුව	539	513	466	464	581
3 වන කාර්තුව	624	593	500	634	246
4 වන කාර්තුව	554	655	647	516	595
පිරිපහදු ඛනිජ තෙල්	**1,420**	**1,348**	**1,168**	**1,645**	**1,823**
1 වන කාර්තුව	537	276	340	460	314
2 වන කාර්තුව	419	426	239	380	396
3 වන කාර්තුව	224	266	317	341	711
4 වන කාර්තුව	240	380	272	464	402
රෙදිපිළි	**234**	**244**	**253**	**257**	**266**
1 වන කාර්තුව	60	57	61	58	56
2 වන කාර්තුව	63	65	65	66	68
3 වන කාර්තුව	52	61	58	66	73
4 වන කාර්තුව	59	61	68	66	70
පොහොර	**460**	**537**	**514**	**510**	**529**
1 වන කාර්තුව	66	103	124	54	168
2 වන කාර්තුව	183	163	166	164	111
3 වන කාර්තුව	83	138	49	76	142
4 වන කාර්තුව	128	133	175	216	107

(අ) ගලපන ලද
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
සීමාසහිත ප්‍රීමා ලංකා සමාගම

ආයෝජන භාණ්ඩ ආනයන 2005 වසරේ දී සියයට 12කින් තවදුරටත් වැඩිවිය. ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ප්‍රවාහණ උපකරණයන් සඳහා වූ ඉහළ ඉල්ලුම පිළිබිඹු කරමින් ආයෝජන භාණ්ඩ ආනයන ඉහළ ගියේය. සුනාමි ව්‍යසනයට ලක්වූ ප්‍රදේශවල ප්‍රතිසංස්කරණ කටයුතු, රාජ්‍ය අංශයේ යටිතල පහසුකම් සැපයීමේ කටයුතු සහ වාණිජමය හා වාසස්ථාන සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් හි සිදුවූ ප්‍රසාරණය හේතුවෙන් මගින් සිමෙන්ති, යකඩ, ඇළුමිනියම් ද්‍රව්‍ය, ඇස්බැස්ටෝස්, දව කඳන් හා ලෑලි සහ විද්‍යුත් උපකරණ යනාදි භාණ්ඩ සඳහා වූ ඉල්ලුම ඉහල ගියේය.

- **2004 වසරේ පැවති ප්‍රවනතාවය තවදුරටත් පෙන්නුම් කරමින් වූ සියයට 20ක් වූ පාරිභෝගික භාණ්ඩ වල දයකත්වය, 2005 වසරේ දී සියයට 19 දක්වා අඩු වූ අතර,** රටෙහි වර්ධනය වෙමින් පවතින්නා වූ ආයෝජන හා නිෂ්පාදන ක්‍රියාකාරකම් පිළිබිඹු කරමින් අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ දයකත්වය, පිළිවෙළින් සියයට 60 සහ සියයට 21 දක්වා වැඩි විය. පසුගිය වසරේ වූ සියයට 10ක වර්ධනය හා සැසඳීමේදී, 2005 වසරේ දී පාරිභෝගික භාණ්ඩ ආනයන පිරිවැය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,644 දක්වා සියයට 1.3 කින් වැඩි විය. 2005 වසරේ දී වූ වාර්තාගත ඉහළ වී අස්වැන්න, සහල් ආනයනය අඩු වීමට ඉවහල් විය. 2004 වසරේ දී සිට ක්‍රියාත්මක කල භාවිතා කරන ලද වාහන ආනයනය සඳහා වැඩිකල නිෂ්පාදන බද්ද සහ ණයවර ලිපිමත සියයට 100 ක මුදලක වූ අවම තැන්පතු හේතුවෙන්, පෞද්ගලික භාවිතය සඳහා මෝටර් රථ ආනයන 2005 වසරේ දී ද පහත වැටුණි.

වෙළෙඳ දිශාව

- **2005 වසරේ වෙළෙඳ දිශාව ආන්තික වශයෙන් පමණක් වෙනස් විය.** බටහිර රටවල් ශ්‍රී ලංකාවේ ප්‍රධානම අපනයනනාන්තය වූ අතර ආසියානු රටවල් ශ්‍රී ලංකාවේ ප්‍රධානතම ආනයන සැපයුම්කරුවන් විය. ඇමෙරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ ප්‍රධානතම අපනයන ගැනුම්කරු වූ නමුදු 2004 වසරේ වූ සියයට 32ක අපනයන දයකත්වය 2005 වසරේ දී සියයට 31 දක්වා මද වශයෙන් අඩු විය. ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම අපනයනනාන්තය වූයේ එක්සත් රාජධානියයි. 2005 වසරේ දී එක්සත් රාජධානිය සඳහා වූ සමස්ත අපනයනයන් නොවෙනස්ව එ.ජ.ඩොලර් දශ ලක්ෂ 778ක මට්ටමත පැවති නමුදු, 2004 වසරේ සියයට 14ක දයකත්වය 2005 වසරේ දී සියයට 12 දක්වා පහළ ගියේය. ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ නිර්මාණය වූ හිතකර වාතාවරණය නිසා ඉන්දියාවට වූ අපනයන 2005 වසරේ දී සියයට 44.4කින් වැඩි විය. පිරිහුම් කරන ලද තඹ, විද්‍යුත් සන්නායකයන්, වානේ අඩංගු ද්‍රව්‍ය, කරාබුනැටි, වියලන ලද පොල් සහ වනස්පති යන ද්‍රව්‍යයන්හි ඉහළ අපනයනයන් පිළිබිඹු කරමින් ඉන්දියානු වෙළෙඳපොළ වෙත 2004 දී වූ සියයට 7ක අපනයන දයකත්වය, 2005 වසරේ දී සියයට 9 දක්වා වැඩි විය. 2000 වසරේ දී ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම අත්සන් කිරීමෙන් පසු ඉන්දියාව, ශ්‍රී ලංකාවේ කැපී පෙනෙන වෙළෙඳපොළක් බවට පත්වෙමින් සිටී. 2000 වසරේ දී ශ්‍රී ලංකාවේ අපනයනය විශාලත්වය අනුව 16 වන ස්ථානයේ පසුවූ ඉන්දියාව 2005 වන විට විශාලත්වයෙන් තෙවන අපනයන වෙළෙඳපොළ බවට පත්වී ඇත. 2004 වසරේ දී වූ එ.ජ.ඩොලර් බිලියන 1.8ක් වූ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර වූ වෙළෙඳම 2005 වසරේ දී එ.ජ.ඩොලර් බිලියන 2.4 දක්වා වැඩි වී ඇත.

- **ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රධාන අපනයන ගමනාන්ත වූයේ බෙල්ජියම-ලක්ෂම්බර්ග්, ජර්මනිය, ඉතාලිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, රුසියාව සහ ජපානයයි.** බෙල්ජියමය-ලක්ෂම්බර්ග් සහ ඉතාලිය වෙත වූ අපනයනය 2005 වසරේ දී ඉහළ ගියද, ජර්මනිය සහ ජපානය සඳහා වූ අපනයනය පහළ ගියේය.

5.5 රූප සටහන
වෙළඳ දිශාව

අපනයන වෙළෙඳ දිශාව



ආනයන වෙළෙඳ දිශාව



ජර්මනිය සඳහා වූ ප්‍රධාන අපනයන වූයේ ඇඟළුම්, තේ, ටයර්, අත්වැසුම් සහ පොල් කෙඳි නිෂ්පාදනයන්ය. බෙල්ජියම-ලක්ෂම්බර්ග් රට වලට ප්‍රධාන වශයෙන් අපනයන කරනු ලැබුයේ දියමන්ති සහ ඇඟළුම්ය. යුරෝපීය සංගමයට වූ අනෙකුත් ප්‍රධානතම අපනයනයන් වූයේ වටිනා මැණික්, අත්වැසුම්, ටයර්, පොල් අතුරු නිෂ්පාදන, ඉස්සන් හා මත්ස්‍ය වර්ග සහ ප්‍රතිමා හා විසිතුරු භාණ්ඩ වේ.

- **කලාපයක් ලෙස ගත්විට ආසියාතු රටවල් තවදුරටත් ප්‍රධාන ආනයන කලාපය වශයෙන් පැවති අතර 2005 වසරේ දී සියයට 16 ක වර්ධනයක් වාර්තා කළේය.** 2004 වසරේදී සියයට 57ක් වූ ආසියාතු රටවල වෙළෙඳපොළ දායකත්වය 2005 වසරේ දී සියයට 60ක් විය. ආනයනයන් හි විශාලතම ප්‍රභවය ඉන්දියාව (සියයට 21), වූ අතර ඉන් අනතුරුව හොංකොං ඇතුළු චීනය (සියයට 14), සිංගප්පූරුව (සියයට 8) සහ ඉරානය (සියයට 6) යන රටවල් පසු විය. 2005 වසරේ දී ඉන්දියාවෙන් කල මුළු ආනයන සියයට 28කින් වැඩි වූ අතර ආනයනය කල ප්‍රධාන භාණ්ඩ වූයේ ඖෂධීය නිෂ්පාදන, තිරිඟු, සහල්, අනෙකුත් ඛනිජ තෙල් නිෂ්පාදන වාහන සහ කපු රෙදි වලින් සමන්විත භාණ්ඩ විය.

5.4 සේවා වෙළෙඳම, ආදයම, සංක්‍රාම සහ ජංගම ගිණුමේ ශේෂය

- **ප්‍රවාහන සහ සංචාරක සේවා, සේවා වෙළෙඳමෙහි ප්‍රමුඛ අංශ වූ අතර ව්‍යාපාර ක්‍රියාවලිය බාහිර මූලාශ්‍ර වෙත පැවරීම ඇතුළු තොරතුරු තාක්ෂණ සේවා, විදුලි සංදේශ, ඉදිකිරීම් සහ රක්ෂණ සේවා වර්ධනය වෙමින් පවතින වැදගත් අංශයන් විය.** සංචාරක ව්‍යාපාරයේ විදේශ විනිමය ඉපැයීම් සැලකිය යුතු ලෙස පහත වැටීමත්, ප්‍රවාහන සහ සංචාරක වියදම් ඉහළ යාමත් හේතුවෙන් 2005 වසරේ දී සේවා ගිණුමේ අතිරික්තය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 338 දක්වා සියයට 19.3කින් පහත වැටිණි.

ප්‍රවාහන සේවා වෙළෙඳම

- **බහාලුම් ප්‍රතිනැව්ගත කිරීම ඇතුළු වරාය ආශ්‍රිත කටයුතු වර්ධනය වීම හේතුවෙන් මගී ගාස්තු, නැව් කුලී සහ වරාය ආශ්‍රිත ඉපැයීම් ඇතුළත් ප්‍රවාහන සේවා ලැබීම් 2005 වසරේ දී සියයට 7.9කින් වර්ධනය විය.** අන්තර්ජාතික වෙළෙඳම පුළුල්වීම, විශේෂයෙන්ම ඉන්දියාවේ වේගවත් වර්ධනයත් සමග ශ්‍රී ලංකාව බහාලුම් ප්‍රතිනැව්ගත කිරීමේ ප්‍රධාන මධ්‍යස්ථානයක් ලෙස යොදා ගැනීම හේතුවෙන් බහාලුම් ප්‍රතිනැව්ගත කිරීම සියයට 10.9කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, කොළඹ දකුණ වරාය සංවර්ධන ව්‍යාපෘතිය වැනි යෝජිත වරාය සංවර්ධන ව්‍යාපෘති කඩිනම් කර සාපේක්ෂ වාසි අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා ඉක්මන් පියවර නොගන්නේ නම්, "සේතු සමුද්‍රම්" ඇළ මාර්ගය ඉදිකිරීම සහ ඉන්දියාවේ වරායන් කිහිපයකම සිදුවන වේගවත් සංවර්ධනයත් ශ්‍රී ලංකාවේ වරාය කටයුතුවල තරගකාරිත්වය වැඩි කිරීමට

5.7 සංඛ්‍යා සටහන
ශුද්ධ සේවා, ආදායම් සහ සංක්‍රාම (අ)

ශීර්ෂය	එ.ජ. ඩොලර් දශ ලක්ෂ		රුපියල් දශ ලක්ෂ	
	2004	2005(ආ)	2004	2005(ආ)
1. ප්‍රවාහනය	209	204	21,201	20,452
2. සංචාරක	217	115	22,232	11,553
3. විදුලි සංදේශ සේවා	33	25	3,304	2,503
4. පරිගණක සහ තොරතුරු සේවා	72	82	7,286	8,371
5. ඉදිකිරීම් සේවා	20	24	2,012	2,396
6. රක්ෂණ සේවා	20	39	2,024	3,890
7. වෙනත් ව්‍යාපාරික සේවා	-137	-134	-13,798	-13,513
8. රජයේ වියදම් (අන් තැනක සඳහන් නොවන)	-15	-16	-1,527	-1,607
මුළු සේවා	**419**	**338**	**42,735**	**34,043**
1. සේවක වන්දි ගෙවීම	-6	-9	-601	-940
2 සෘජු ආයෝජන ආදයම්	-92	-112	-9,303	-11,245
3. පොලී සහ අනෙකුත් ගෙවීම්	-106	-178	-10,828	-17,864
මුළු ආදයම	**-204**	**-299**	**-20,732**	**-30,049**
1. පෞද්ගලික	1,350	1,736	136,672	174,542
2. මධ්‍යම ආණ්ඩුව	30	93	3,038	9,300
මුළු ජංගම සංක්‍රාම	**1,380**	**1,828**	**139,710**	**183,842**

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) මෙම ඉදිරිපත් කිරීම ගෙවුම් තුලන අත්පොතෙහි 5වන සංශෝධනය (1993)ට අනුරූපව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් ජාත්‍යන්තරව අනුගමනය කරන ආකාරයට සැසඳෙන ලෙස ඉදිරිපත් කර ඇත.

(ආ) තාවකාලිකයි.

හේතුවනු ඇත. මේ අතරතුර, විදේශයන්හි සංචාරය කරන ශ්‍රී ලාංකිකයන් ප්‍රමාණය ඉහළ යාම සහ වරාය ආශ්‍රිත සේවාවන් සඳහා ගෙවීම් ඉහළ යාම නිරූපණය කරමින් ප්‍රවාහන සේවා වියදම සියයට 13.3කින් වර්ධනය විය. මෙම ප්‍රවණතාවයන් හේතුවෙන් 2005 වසර තුළ දී ප්‍රවාහන සේවාවන්හි ශුද්ධ ඉපැයීම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 204 දක්වා සියයට 2.8කින් පහත වැටිණි.

විදේශ ගමන් සහ සංචාරක සේවා

- **සුනාමි ව්‍යසනය හේතුවෙන් සංචාරක ව්‍යාපාරයෙහි ඉපැයීම් 2005 වසරේ දී පසු බැස්මකට ලක්විය.** 2004 වසරේ දී වාර්තා වූ ඉහළම සංචාරක පැමිණීම 566,000 සිට 2005 වසරේ දී 549,000 දක්වා සියයට 3.0කින් පහත වැටිණි. හෝටල් කාමරවල නවාතැන් ගැනීම අඩු වීමත් සමග, 2005 වසරේ දී සංචාරක ඉපැයීම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 329 දක්වා සියයට 20.3ක ඉහළ අගයකින් පහත වැටිණි. ආධාර කණ්ඩායම්වල සේවකයන් සහ ඉන්දියාවෙන් හා පකිස්ථානයෙන් පැමිණි සංචාරකයන් හේතුවෙන් සංචාරක පැමිණීම ඉහළ ගිය ද, ඔවුන් ශ්‍රේණිගත හෝටල්වල නවාතැන් ගැනීම සැලකිය යුතු ප්‍රමාණයක නොවීය. අනේවාසික ශ්‍රී ලාංකිකයන්ගේ පැමිණීම ද ඇතුළත්, සංචාරක අංශයේ මුළු ඉපැයීම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 429 දක්වා සියයට 16.3කින් පහත වැටිණි. 2005 වසර තුළ දී ශ්‍රී ලාංකිකයන් වැඩි වශයෙන් විදේශයන්හි සංචාරය කිරීමෙහි ප්‍රතිඵලයක් ලෙස සංචාරක අංශයේ දළ වියදම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 314 දක්වා සියයට 6.2කින් ඉහළ ගියේය.

- **සියයට 7.8ක වර්ධනයක් වාර්තා කරමින් ඉන්දියාව 2005 වසරේ දී සංචාරක පැමිණීමට දයක වූ විශාලම තනි මූලාශ්‍රය බවට පත් විය.** ශ්‍රී ලංකාවට අඛණ්ඩව සංචාරකයන් පැමිණෙන විශාලම කලාපය වූයේ බටහිර යුරෝපය වුවද, 2004 වසරේ දී මුළු සංචාරක පැමිණීමෙන් සියයට 50.2ක් වූ එහි දායකත්වය 2005 වසර තුළ දී සියයට 41.4 දක්වා අඩුවිය. සුනාමි ව්‍යසනය සහ ඒ හා සම්බන්ධ අහිතකර ප්‍රචාරයන් ද, වසරේ අවසන් භාගයේ දී උතුරු නැගෙනහිර ප්‍රදේශවල ඉහළ ගිය ගැටුම්කාරී වාතාවරණය ද 2005 වසරේ දී මෙම කලාපයෙන් පැමිණෙන සංචාරකයන් සංඛ්‍යාව සියයට 20.1කින් අඩු වීමට හේතු විය. සුනාමි සහන, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා පැමිණි විශාල ස්වේච්ඡා සේවකයන් ප්‍රමාණය හේතුවෙන් 2005 වසරේ දී උතුරු ඇමෙරිකාවෙන් පැමිණි සංචාරකයන් සංඛ්‍යාව සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. සංචාරකයන් සපයන දෙවන විශාලම කලාපය බවට පත්වෙමින් ආසියාතු කලාපය සංචාරක පැමිණීමට සියයට 40.7කින් දයක වූයේ සියයට 12.8ක වර්ධනයක් වාර්තා කරමිනි. වියදම් කිරීමේ හැකියාව ඉහළ සංචාරකයන් වැඩි ප්‍රමාණයක් ආකර්ශනය කර ගැනීම සඳහා ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය ක්‍රියාත්මක කිරීමට නියමිත විශේෂ ජාත්‍යන්තර ප්‍රචාරක වැඩසටහන, 2006 වසර තුළ සංචාරක ව්‍යාපාරයේ විදේශ විනිමය ඉපැයීම් ඉහළ නැංවීමට හේතු විය හැකිය.

5.6 රූප සටහන
මාසික සංචාරක පැමිණීම



- **ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයේ ශක්‍යතාවය මේ දක්වා ප්‍රශස්ත ලෙස ප්‍රයෝජනයට ගෙන නොමැත.** 2005 වසරේ දී සංචාරකයන් දශ ලක්ෂ 9ක් පමණ ආකර්ෂණය කර ගත් සිංගප්පූරුව සමඟ සසඳන විට, ශ්‍රී ලංකාවට ආකර්ශනය කර ගතහැකි වූයේ සංචාරකයන්

5.8 සංඛ්‍යා සටහන
සංචාරක ව්‍යාපාරයේ ක්‍රියාකාරීත්වය

ශීර්ෂය	2001	2002	2003	2004(අ)	2005(ආ)	වර්ධන වේගය 2004(අ)	වර්ධන වේගය 2005 (ආ)
1. සංචාරක පැමිණීම්	336,794	393,171	500,642	566,202	549,308	13.1	-3.0
2. සංචාරක රාත්‍රී ගණන (දහස්)	3,342	3,986	5,093	5,742	4,400	12.7	-23.4
3. කාමර උපයෝජන අනුපාතය (%)	42.1	43.1	53.2	59.3	43.9	11.5	-26.0
4. දළ සංචාරක ලැබීම් (රු. දශ ලක්ෂ)	18,863	24,202	32,810	41,666	36,377	30.0	-14.7
5. ඒක පුද්ගල සංචාරක ලැබීම්	56,008	61,556	65,536	75,355	66,223	15.0	-12.1
6. මුළු සේවා නියුක්තිය	80,904	93,170	112,226	129,038	125,004	15.0	-3.1
සෘජු	33,710	38,821	46,761	53,766	52,085	15.0	-3.1
වක්‍ර	47,194	54,349	65,465	75,272	72,919	15.0	-3.1

(අ) සංශෝධිතයි
(ආ) තාවකාලිකයි

මූලයන් : ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය
ශ්‍රී ලංකා මහ බැංකුව

549,000ක් පමණි. ජෛව විවිධත්ව පද්ධති, ඓතිහාසික ස්ථාන වැනි ආකර්ශනීයත්වයෙන් බහුල ස්ථාන පැවතියදීත් ශ්‍රී ලංකාව මෙම තත්ත්වයට මුහුණ පෑවේය. පෞද්ගලික අංශය මෙම ක්ෂේත්‍රයේ විශාලම ක්‍රියාකාරිකයා වන බැවින්, සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී සහ ඉලක්කගත විදේශ වෙළෙඳපොළවල සංචාරක ව්‍යාපාරය ප්‍රචලිත කිරීමේදී ඔවුන්ගේ දයකත්වය රජයේ පහසුකම් සැපයීමේ කාර්යභාරය ද සමඟ පුළුල්ව සිදුවිය යුතුය. මීට අමතරව, ඉහළ ගුවන්යානා ධාරිතාවය සහ අඩු ප්‍රවේශපත් ගාස්තු තුළින් අඩු වියදම් ගුවන් ගමන් ප්‍රචලිත කිරීම සංචාරක පැමිණීම ඉහළ නැංවීමට උපකාරී වනු ඇත.

විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ සේවා වෙළෙඳාම

- **විදුලි සංදේශ සේවාවන්හි ශුද්ධ ඉපැයීම් 2005 වසරේ දී පහත වැටිණි.** ජාත්‍යන්තර විදුලි සංදේශ පිවිසුම නිදහස් කළ 2003 අප්‍රේල් මාසයේ සිට මෙම ඉපැයීම් අඩුවෙමින් පවතින අතර, ශ්‍රී ලංකාවේ සිට අරඹන ජාත්‍යන්තර ඇමතුම් සංඛ්‍යාව ඉහළ යාමත් සමඟ එය 2005 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 25 දක්වා තවදුරටත් සියයට 24.2කින් පහත වැටිණි. අන්තර්ජාලය, ෆැක්ස් සහ විද්‍යුත් තැපැල වැනි පණිවුඩ හුවමාරු ක්‍රම භාවිතය ඉහළයාමද මෙම පහත වැටීම වඩා තීව්‍ර වීමට හේතුවිය.
- **තොරතුරු තාක්ෂණය අන්තර්ගත සේවාද ඇතුළත් තොරතුරු තාක්ෂණ අපනයනවල සීඝ්‍ර වර්ධනය පිළිබිඹු කරමින් 2005 වසරේ දී තොරතුරු තාක්ෂණ අපනයනයන් හි ශුද්ධ ඉපැයීම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 82 දක්වා සියයට 13.9කින් වර්ධනය විය.** සේවා අපනයනයෙහි වැදගත් අංශයක් ලෙස වර්ධනය වෙමින් පවතින ව්‍යාපාර ක්‍රියාවලිය බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ කර්මාන්තය වඩාත් ප්‍රචලිත කිරීම සඳහා නිපුණතා සංවර්ධනය සහ විදුලි සංදේශ යටිතල පහසුකම් තවදුරටත් පුළුල් කිරීම අත්‍යවශ්‍ය වේ.

ආදායම් ලැබීම් සහ ගෙවීම්

- **රාජ්‍ය ණය මත පොලී ගෙවීම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 76කින් පමණ පහත වැටී තිබියදීත්, 2005 වසරේ දී ආදායම් ගිණුමේ හිඟය පුළුල් විය.** ප්‍රධාන වශයෙන් මහ බැංකුව මගින් පාලනය කෙරෙන නිල විදේශ වත්කම් සැලකිය යුතු ලෙස ඉහළ යාම සහ 2005 වසර තුළ ජාත්‍යන්තර පොලී අනුපාත ඉහළ යාම හේතුවෙන්, නිල විදේශ වත්කම් ආයෝජනය තුළින් ඉපැයූ පොලී ආදායම් සියයට 15.4කින් ඉහළ ගියේය. මේ අතර, වාණිජ බැංකුවල විදේශ වත්කම් ඉහළ යාම ද පොලී ආදායම සැලකිය යුතු ලෙස ඉහළ යාමට හේතු විය. කෙසේ වෙතත්, එ.ජ.ඩොලරය 2004 වසරේ දී වාර්තා කළ අවප්‍රමාණයට සාපේක්ෂව 2005 වසරේ දී අනෙකුත් ප්‍රධාන මුදල් වර්ගයන්ට එරෙහිව අධිප්‍රමාණය වීම පවතින වෙළෙඳ වටිනාකම් අනුව තක්සේරුකල විදේශ සංචිත එ.ජ.ඩොලර් වටිනාකම අනුව දක්වීමේ දී සැලකිය යුතු ලෙස අඩුවීමට හේතු විය. මෙම අලාභය අඩු ආදයමක් වශයෙන් ආදායම් ගිණුමේ නිරූපණය වේ. 2005 වසරේ දී සහ ඊට පෙර විදේශ සෘජු ආයෝජන ඉහළයාම හේතුවෙන් එම ආයෝජන මත ආදයම ඉහළ ගිය අතර, විදේශ ආයෝජකයන්ගේ ලාභ සහ ලාභාංශ තම රට වෙත ගෙනයාම වැඩි විය. මෙම ප්‍රවණතාවයන් අනුව ආදයම් ගිණුමේ හිඟය 2004 වසරේ පැවති එ.ජ.ඩොලර් දශ ලක්ෂ 204 සිට 2005 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 299 දක්වා සියයට 46.6කින් පුළුල් විය.

ජංගම සංක්‍රාම

- **පුළුල්වන වෙළෙඳ ගිණුමේ හිඟය මූල්‍යනය කිරීමෙහි ප්‍රධානතම මූලාශ්‍රයවන ජංගම සංක්‍රාම ගිණුමේ ශුද්ධ ලැබීම් 2005 වසරේ දී සියයට 32.5කින්, වැඩි වී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,828 ක් විය.** සුනාමි සහන වශයෙන් ලැබුණු එ.ජ.ඩොලර් දශ ලක්ෂ 50ක ජංගම සංක්‍රාමද ඇතුළත් පෞද්ගලික ප්‍රේෂණ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,968 දක්වා සියයට 25.8කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. ජංගම ගිණුමෙහි දෙවන විශාලතම ලැබීම වන විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2005 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,918 දක්වා සියයට 22.6කින් වර්ධනය විය. මෙය ඓතිහාසික වර්ධන වේගය දෙගුණවීමකි. සුනාමි ව්‍යසනයෙන් පසු විදේශගත ශ්‍රී ලාංකිකයන් තම පවුල්වලට, ඥතීන්ට සහ හිතමිතුරන්ට විශාල වශයෙන් මුදල් ප්‍රේෂණය කිරීමත්, විදේශ රැකියා සඳහා පිටත්ව ගිය ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව ඉහළ යාමත්, වාණිජ බැංකු බොහොමයක් විසින් හඳුන්වා දෙනු ලැබූ විද්‍යුත් අරමුදල් හුවමාරු ක්‍රම ජනප්‍රිය වීමත් මෙම ඉහළ වර්ධනයට හේතු විය. 2005 වසරේ දී රැකියා සඳහා විදේශගත වූවන්ගේ සංඛ්‍යාව 230,206 දක්වා සියයට 8.0කින් ඉහළ ගියේය.
- **අපනයන ආදායමට පසු ඉහළම තනි විදේශ විනිමය ඉපැයීමේ මූලාශ්‍රය වන විදේශ සේවා නියුක්තිකයන්ගෙන් ලැබෙන ප්‍රේෂණ, වෙළෙඳ ගිණුමේ පුළුල්වන හිඟය මූල්‍යනය කිරීමෙහිලා තවදුරටත් වැදගත් කාර්යභාරයක් ඉටු කළේය.** 2005 වසරේ දී වෙළෙඳ ගිණුමේ හිඟයෙන් සියයට 75කටත් වැඩි ප්‍රමාණයක් මූල්‍යනය කිරීම සඳහා විදේශ සේවා නියුක්තිකයන්ගෙන් ලැබෙන ප්‍රේෂණ ප්‍රමාණවත් විය. පෞද්ගලික ප්‍රේෂණ ඵලදයී කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගැනීමේ අවශ්‍යතාවය හඳුනා ගැනීම සහ විදේශගත ශ්‍රී ලාංකිකයන්ගෙන් විදේශ විනිමය වැඩි ප්‍රමාණයක් ලබා ගැනීම පිණිස රජය විසින් 2006 වසර සඳහා වූ අයවැය මගින් ජාතිය ගොඩනැංවීමේ බැඳුම්කර හඳුන්වා දෙන ලදී.
- **මැදපෙරදිග කලාපය ශ්‍රී ලංකාව සඳහා රැකියා අවස්ථාවන් සපයන ප්‍රධානතම කලාපය වශයෙන් තවදුරටත් පැවතුණි.** ප්‍රධාන වශයෙන් නුපුහුණු ශ්‍රමිකයන් බඳවා ගන්නා මැදපෙරදිග කලාපයෙන් ලැබුණු ප්‍රේෂණ 2005 වසරේ දී මුළු ප්‍රේෂණ

විශේෂ සටහන 10

විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල ආර්ථික වැදගත්කම සහ එහි බලපෑම

පසුගිය කාලය තුළ දී සංවර්ධනයවෙමින් පවතින බොහෝ රටවල විදේශ විනිමය ගලාඒම්වල ප්‍රධාන ප්‍රවාහයන් වූයේ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණය ය. විදේශීය සෘජු ආයෝජනයන්ගෙන් පසු සංවර්ධනය වෙමින් පවතින රටවල දෙවන විශාලතම බාහිර මූල්‍යකරණ මූලාශ්‍රය බවට පත් වී ඇත. එය රටට ලැබෙන නිල ආධාර මෙන් දෙගුණයකටත් වඩා වැඩි ප්‍රමාණයකි..[1]

දශ ලක්ෂයකට වැඩි ශ්‍රී ලාංකිකයින් පිරිසක් රැකියා සඳහා විදේශගතව ඇති අතර මින් වැඩිම පිරිසක් මැදපෙරදිග රටවලට සංක්‍රමණය වූවෝ වෙති. රජයට ලැබෙන විදේශ මූල්‍ය ලැබීම්වලට වඩා, විදේශ සේවා නියුක්තිකයන්ගෙන් ලැබෙන ප්‍රේෂණ ඉහළවන අතර, පුළුල් වෙමින් පවතින වෙළෙඳ පරතරය මූල්‍යනය කිරීමේ ප්‍රධාන මූලාශ්‍රයක් බවට එය පත්වී ඇත. කෙසේ වෙතත් විදේශ ලැබීම්වලදී අපනයන ඉපයුම් විශේෂයෙන් රෙදිපිළි හා නිමි ඇඳුම් ප්‍රමුඛ මූලාශ්‍ර බවට පත් වී ඇතත්, ඉන් පසු වැදගත් අංශයන් වී ඇත්තේ මෙම ප්‍රේෂණ සහ සේවා අපනයනයන්ගෙන් ලැබුණු ඉපයුම් වේ. (සංඛ්‍යා සටහන වි. ස. 10.1)

මෙම ප්‍රේෂණ මගින් විදේශ විනිමය හිඟය සහ විනිමය අනුපාතිකය මත වන පීඩනය ලිහිල් කිරීමටත් ගෙවුම් ශේෂ තත්ත්වය වැඩි දියුණු කිරීමටත් උපකාරී වේ. ප්‍රේෂණ මගින් රටේ ණය ලබාගැනීමට ඇති හැකියාව සහ ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළ සඳහා වන ප්‍රවේශයන් ඉහළ නංවනු ඇත. ආර්ථික චක්‍රයන් අනුව ආර්ථිකය වර්ධනය වන අවස්ථාවලදී ප්‍රාග්ධන ගලාඒම් ඉහළයන අතර ආර්ථික වර්ධනය පහත වැටෙන අවස්ථාවලදී පහත බසිනු ඇත. එහෙත් විදේශ සේවා නියුක්තිකයන්ගෙන් ලැබෙන ප්‍රේෂණ එම රටවල ආර්ථික වර්ධනයන් පහත වැටෙන අවස්ථාවලදී පවා ඉහළයාමේ නැඹුරුවක් පෙන්නුම් කරන්නේය. මෙම ප්‍රේෂණ ගෙවුම් තුලනයේ උච්චාවචනයන් සමනය කිරීමට උපකාරී වේ. මෙම ප්‍රේෂණ සංවර්ධනය වෙමින් පවතින රටවල අනෙකුත් විදේශ විනිමය මූලාශ්‍රවලට සාපේක්ෂව අඩුවෙන් උච්චාවචනයවන තත්ත්වයක් පෙන්නුම් කර ඇත. එමෙන්ම මෙම ගලාඒම් වඩාත් සාධාරණ ආදායම් ව්‍යාප්තියක් සඳහා උපකාරී වී ඇත.

සංඛ්‍යා සටහන වි.ස. 10.1

විදේශ ලැබීම්වල ප්‍රධාන මූලයන් සහ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල ආර්ථික වැදගත්කම

එ.ජ.ඩොලර් දශ ලක්ෂ

	1980	1985	1990	1995	2000	2005(අ)
අපනයන ඉපයීම් (භාණ්ඩ)	1,064.7	1,315.3	1,983.9	3,806.6	5,522.3	6,346.7
රෙදිපිළි හා ඇඟළුම්	109.7	293.1	628.1	1,852.6	2,982.0	2,894.6
තේ	373.3	441.9	494.8	480.7	701.1	810.2
රබර්	156.7	97.8	76.9	111.5	28.7	46.9
පොල්	74.6	113.9	69.5	102.8	121.1	113.3
අනෙකුත්	350.4	368.6	714.6	1,259.0	1,689.4	2,481.7
අපනයන ඉපයීම් (සේවා)	279.1	328.6	531.0	821.0	953.0	1,540.2
ප්‍රවාහණ	40.5	63.5	95.3	336.0	406.0	673.4
සංචාරක	49.0	82.2	127.8	226.0	252.0	429.1
අනෙකුත්	189.6	182.9	307.9	259.0	295.0	437.7
විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ	152.3	291.6	400.7	790.0	1160.0	1918.5
විදේශීය සෘජු ආයෝජන	42.9	24.4	34.0	27.5	175.1	272.2
විදේශ ණය හා ප්‍රදාන	307.0	516.6	526.3	847.0	422.0	972.0
විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ	9.3	13.8	12.9	20.6	14.9	19.4
ජංගම ගිණුමේ ලැබීම්වල % ලෙස	15.4	40.0	57.0	52.5	64.5	76.2
වෙළෙඳ ශේෂයේ % ලෙස	49.6	56.4	76.1	93.3	274.9	197.3
ණය සහ ප්‍රදානවල % ලෙස	7.4	14.3	14.9	14.9	15.8	21.6
මුළු ආනයනවල % ලෙස	3.8	4.9	5.0	6.1	7.0	8.1
ද.දේ.නි. යේ % ලෙස						

(අ) තාවකාලික මූලය : ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා

සංක්‍රමිකයන්ගෙන් ලැබෙන මෙම ප්‍රේෂණ ප්‍රයෝජනවත් වුවද ඒ හා සම්බන්ධ පිරිවැය රාශියක් ඇත. ඒ අතරින් විශාලතම වන්නේ තාවකාලිකව හෝ පවුල් වියවුල් වීමෙන් වන සමාජ පිරිවැය වේ. එමෙන්ම තාවකාලික වශයෙන් වුවද බුද්ධිගලනය සහ පුහුණු ශ්‍රමය ගලායෑම නිසා, ආර්ථික වර්ධනයට අහිතකර බලපෑම් ඇති වේ. සමහර පුහුණු ශ්‍රමිකයින් විදේශ රටවලින් ඉල්ලුම් කිරීම නිසා ශ්‍රමය අපනයනය වන රටවල හිඟයක් ඇති විය හැකිය. මුළු විදේශීය සංක්‍රමිකයන්ගෙන් සියයට 70කට වඩා වැඩි ප්‍රමාණයක් ගෘහ සේවිකාවන් සහ නුපුහුණු පුද්ගලයන් වන අතර පුහුණු ශ්‍රමික කාණ්ඩය සියයට 20 ක් පමණ වේ. ගණකාධිකරණ, නීති, ඉංජිනේරු සහ ගෘහ නිර්මාණ, ඉදිකිරීම් සම්බන්ධ සේවා, තොරතුරු තාක්ෂණය සහ පරිගණක මෘදුකාංග සංවර්ධන ආදී ක්ෂේත්‍රවල විශේෂඥයන්ගේ විදේශගත වීම් උනන්දු කිරීම මගින් අනාගතයේ දී ප්‍රේෂණ ගලාඒම් විශාල ලෙස වැඩිකර ගැනීමට හැකියාවක් ඇත. පුහුණු ශ්‍රමිකයන්ගේ විදේශගතවීම් උනන්දුවන ආකාරයට ශ්‍රී ලංකාවේ විදේශ සේවා නියුක්ති ප්‍රතිපත්ති නැවත සකස් කළ යුතු වේ. වෙළෙඳම සහ සේවා සඳහාවන පොදු ගිවිසුම යටතේ වන ප්‍රතිපාදන අනුව සේවාවන් අලෙවිය ක්‍රමයෙන් ලිහිල්කරණය වෙමින් පවතී. එමෙන්ම සේවා වෙළෙඳමේ 4වන ක්‍රමය යටතේ ස්වාභාවික පුද්ගල සංචලනය, සේවාවන් ලබාදීමේ ඉතාමත් වැදගත් අංශයක් ලෙස විශාල පිළිගැනීමක් පවතී. ක්ෂේත්‍ර කිහිපයකම ඉතා ඉහළ සුදුසුකම්ලත් වෘත්තිකයන් බිහිකරන බැවින් 4 වන ක්‍රමය යටතේ වෙළෙඳම දියුණු කිරීමට ශ්‍රී ලංකාවට සාපේක්ෂ වශයෙන් වාසි සහගත තත්වයක් ඇත. මේ නිසා විශේෂයෙන්ම පුහුණු මානව සම්පත් කෙටිකාලීන වශයෙන් විදේශයන් වෙත යැවීම දිරිගන්වන ආකාරයේ ප්‍රතිපත්ති රජයට සම්පාදනය කළහැකි වේ.

ප්‍රේෂණ සේවා සහ තැපැල් සහ බැංකු ජාලයන් අතර සම්බන්ධතාවයන් වැඩිදියුණු කිරීම ප්‍රේෂණ සේවාවන්ගේ ධාරිතාවය සහ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට ඉවහල් වනු ඇත.

සංක්‍රමිකයන්ට මුහුණපෑමට සිදුවන දුෂ්කරතා මගහැරවීම සඳහා, විදේශ සේවා නියුක්තික ආයතන සම්බන්ධ අනාපනත් සහ සමීප සුපරීක්ෂාව අවශ්‍යතාවයක්ව ඇත. සංක්‍රමණික ලැබීම් වැඩිකර ගැනීම සඳහා සංක්‍රමණිකයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම අරමුණු කොට ගෙන දනට පවතින ආරක්ෂක හවුල්කාරී ගිවිසුම් අළුත් කිරීම හෝ අළුත් ගිවිසුම් ඇතිකරගත හැකිය.

පෞද්ගලික සංක්‍රාම විදේශ විනිමය ගලාඑන ප්‍රධානම මාර්ගය වුවත් වේගවත් ආර්ථික සංවර්ධනයක් තුළින් නිෂ්පාදන ධාරිතාව වර්ධනය වූ විට දේශීය රැකියා අවස්ථා වැඩිවී, සාමාන්‍ය ආදායම් මට්ටම ඉහළ ගිය විට විදේශීය රැකියා සඳහා සංක්‍රමණිකයන්ගේ උනන්දුව අඩුවන බැවින් රජය විසින් දීර්ඝකාලීනව මෙම ආදායම් කෙරෙහි විශ්වාසය තැබීම එතරම් සතුටුදායක නොවනු ඇත. නූතන තාක්ෂණික උපක්‍රම තුළින් විදේශීය සෘජු ආයෝජන ධෛර්යමත් කිරීමත්, අපනයන වෙළෙඳපොළ පුළුල් කිරීමත්, දක්ෂතා වර්ධනය කිරීමත් සහ ආර්ථිකයේ නිෂ්පාදන කාර්යක්ෂමතාව වැඩිකිරීමත් මෙයට විකල්ප ක්‍රියාමාර්ග වේ.

[1] Global Economic Prospects: Economic Implications of Remittances and mitations (2006), World Bank

ප්‍රමාණයෙන් සියයට 56.8ක් විය. මේ අතරතුර, පුහුණු ශ්‍රමිකයන් සඳහා වෙළෙඳපොළක් වශයෙන් වර්ධනය වෙමින් පවතින යුරෝපා සංගමයේ රටවලින් ලැබුණු ප්‍රේෂණ මුළු ප්‍රේෂණවලින් සියයට 18.5ක් විය. 2005 වසරේ දී අනෙකුත් යුරෝපා රටවලින් ලැබුණු ප්‍රේෂණ ප්‍රමාණය, මුළු ප්‍රේෂණවලින් සියයට 6.5ක් විය. සැලකිය යුතු දායකත්වයක් සැපයූ අනෙකුත් රටවල් වූයේ පිළිවෙළින් මුළු ප්‍රේෂණවලින් සියයට 6.5කට සහ 4.5කට දායක වූ උතුරු ඇමෙරිකානු සහ ඈත පෙරදිග ආසියානු රටවල්ය. ශ්‍රී ලංකාව අඛණ්ඩව වෘත්තීමය ශ්‍රම බලකායක් බිහි කරන බැවින්, ශ්‍රී ලංකාවට සාපේක්ෂ වාසි සහිත අංශවල වෘත්තිමය සේවා සඳහා ඉල්ලුමක් ඇති රටවල් සමග ද්විපාර්ශ්වික ගිවිසුම්වලට ඇතුළත් වීම මගින් වෙළෙඳම හා තීරුබදු සඳහා වූ පොදු සම්මුතිය (GATS) යටතේ 4 වන ක්‍රමය (mode 4) අනුව සේවා වෙළෙඳම ප්‍රචලිත කිරීමට රජයට හැකියාව ඇත.

- **නිල ජංගම සංක්‍රාම 2004 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 30ක සිට 2005 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 93 දක්වා තුන්ගුණයකටත් වඩා වැඩි ප්‍රමාණයකින් වර්ධනය විය.** සුනාමි ව්‍යසනයෙන් පසු බහුපාර්ශ්වීය සහ ද්විපාර්ශ්වීය ආධාර දෙන ආයතනයන් ගෙන් සුනාමි ව්‍යසනයට ගොදුරු වූවන්ට සහන සැලසීම සඳහා කඩිනම් සහන ක්‍රම වශයෙන් ආහාර, ඖෂධ, තාවකාලික වාසස්ථාන (කූඩාරම්) වැනි ද්‍රව්‍යමය ආධාර මෙන්ම මූල්‍යාධාර ද රජය වෙත ලැබිණි.

ජංගම ගිණුමේ ශේෂය

- **2004 වසරේ දී ද.ජා.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 3.2ක හිඟයක් වාර්තා කළ ජංගම ගිණුමේ ශේෂය, 2005 වසරේ දී ද.ජා.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 2.8ක් දක්වා අඩු විය.** කෙසේ වෙතත්, එය එ.ජ.ඩොලර් වටිනාකම අනුව සියයට 0.3කින් පුළුල් වී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 650ක් විය. විදේශ සේවා නියුක්තියන්ගේ ප්‍රේෂණ ඇතුළු පෞද්ගලික සංක්‍රාම ලැබීම්වල තිබුණු ඉහළ යාම වෙළෙඳ ගිණුමේ හිඟය සමනය කිරීමටත් ජංගම ගිණුමේ හිඟය සීමා කිරීමටත් හේතු විය.

5.5 ප්‍රාග්ධන සහ මූල්‍ය ගිණුම්, සහ ගෙවුම් තුලනය

ප්‍රාග්ධන සහ මූල්‍ය ගිණුම්

- **2005 වසර තුළ දී ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුම්වල ශුද්ධ ලැබීම්වල වර්ධනයක් පෙන්නුම් කෙරිණි.** මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ඉහළ ප්‍රාග්ධන ලැබීම්, විශේෂයෙන් රජයට ලැබුණු සුනාමි සම්බන්ධ ආධාර, ඉහළ ශුද්ධ විවිධ ආයෝජන, පෞද්ගලික අංශයේ ඉහළ ගිය ණය ආධාර, වාණිජ බැංකු සතු විදේශීය වත්කම් දේශීය වත්කම්වලට මාරුවීම සහ රජයේ ණය ගෙවීම සඳහා ලැබුණු සහනය හේතුවෙන් ණය ආපසු ගෙවීම අඩු මට්ටමක පැවතීමයි. කෙසේ වෙතත්, 2005 වසරේ රජයේ ණය ලබා ගැනීම් 2004 වසරට වඩා අඩු විය. බොහෝ දුරට ආධාර දෙන ආයතන මගින් රජයට ලබාදෙන ප්‍රාග්ධන ප්‍රදානයන් ප්‍රාග්ධන ගිණුමේ පෙන්නුම් කෙරෙන අතර, එය 2004 වසරේ වාර්තා වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 64 සමඟ සසඳන විට 2005 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 250 දක්වා ඉහළ ගියේය. මෙයට ප්‍රධාන වශයෙන් හේතුවූයේ විදේශීය ආධාර ලබාදෙන්නන් විසින් ලබාදුන් සුනාමි සම්බන්ධ ප්‍රාග්ධන ප්‍රදානයන්ය. මේ අතර, 2004 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 567ක අතිරික්තයක් වාර්තා කල මූල්‍ය ගිණුමේ ශේෂය 2005 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 974ක් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුම්වල අතිරික්තය ජංගම ගිණුමේ හිඟය සමනය කිරීමටත් වඩා ප්‍රමාණවත් විය.

විදේශීය සෘජු ආයෝජන

- **2005 වසරේ දී විදේශීය සෘජු ආයෝජන ගලාඒම් සහ ගලායාම් ඉහළ ගියේය.** 2004 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 223ක දළ විදේශීය සෘජු ආයෝජන ප්‍රමාණය සමඟ සසඳන විට 2005 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 272ක වාර්තාගත ඉහළම දළ විදේශ ආයෝජනයක් වාර්තා විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතුවූයේ, විශේෂයෙන් සේවා අංශයේ ව්‍යාපාරවල යෙදී සිටින ආයෝජකයින්ගේ ඉපැයීම් නැවත ආයෝජනය කිරීමයි. මෙයින්, ව්‍යාපෘති 69කින් සමන්විත සේවා සහ යටිතල පහසුකම් සංවර්ධන අංශයට එ.ජ.ඩොලර් දශ ලක්ෂ 151ක වැඩි ප්‍රමාණයක් ලැබුණු අතර, ව්‍යාපෘති 36කින් සමන්විත රෙදිපිළි සහ ඇඟළුම් උප අංශයන්ට එ.ජ.ඩොලර් දශ ලක්ෂ 47ක් ලැබිණි. ලෝක වෙළෙඳපොළේ පවතින ඉහළ තරගකාරිත්වය හමුවේ ශ්‍රී ලංකාවේ රෙදිපිළි සහ ඇඟළුම් අංශයට තව දුරටත් අළුත් විදේශීය ආයෝජකයින් පැමිණීමෙන් පෙන්නුම් කෙරෙනුයේ ශ්‍රී ලංකාවේ රෙදිපිළි සහ ඇඟළුම් අංශයේ තිරසාරත්ව පිළිබඳ පවතින විශ්වසනීයත්වයයි. දේශීය සමාගම් කිහිපයකට විදේශීය වෙළෙඳපොළේ ආයෝජනය කිරීමට අවසර ලබා දීම නිසා 2004 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 6ක ආයෝජන ගලායාම් 2005 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 38 දක්වා ඉහළ ගියේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2004 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 217ක් වූ ශුද්ධ විදේශීය

5.7 රූප සටහන
නිල සහ පෞද්ගලික ප්‍රාග්ධන ගලාඒම්



5.9 සංඛ්‍යා සටහන
2005 වසර තුළ විදේශ ණය දෙන ආයතනවලින් විදේශ ආධාර ලබාදුන් ව්‍යාපෘතීන්

දයකයා	ව්‍යාපෘතිය	ලැබුණු ණය මුදල එ.ජ. ඩොලර් දශ ලක්ෂ
ආසියානු සංවර්ධන බැංකුව		**198.1**
එයින් :	පෞද්ගලික අංශයේ සංවර්ධනය සඳහා වූ මූල්‍ය වෙළෙඳපොළ ව්‍යාපෘතිය	19.8
	මාර්ග පද්ධතිය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය	16.7
	මාර්ග අංශයේ සංවර්ධන ව්‍යාපෘතිය	15.0
	3 වන ජල සැපයුම් සහ සනීපාරක්ෂක අංශයේ ව්‍යාපෘතිය	14.0
	ද්විතියික අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය	13.4
	වෙරළබඩ සම්පත් කළමණාකරණ ව්‍යාපෘතිය	12.9
	විදුලිබල අංශයේ සංවර්ධන ව්‍යාපෘතිය	12.8
	සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය සම්බන්ධ තෝරාගත් ව්‍යාපෘති සඳහා ණය ආධාර ව්‍යාපෘතිය	11.7
	දකුණු පලාත් ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය	11.4
	ගැටුම් බලපෑවති ප්‍රදේශවල පුනරුත්ථාපන ව්‍යාපෘතිය	11.0
ජාත්‍යන්තර සංවර්ධන ආයතනය		**113.1**
එයින් :	ග්‍රාමීය ආර්ථික සංවර්ධනය සඳහා විදුලිබල ප්‍රතිඋත්පාදන ව්‍යාපෘතිය	22.6
	උතුරු නැගෙනහිර නිවාස නැවත ගොඩනැගීමේ ව්‍යාපෘතිය	16.8
	සුනාමි හානි කඩිනම් ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය II අදියර	14.2
	උපාධි අධ්‍යාපනයේ අනුකූලතාවය හා ගුණාත්මකභාවය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	12.3
	ඉ - ශ්‍රී ලංකා සංවර්ධන ව්‍යාපෘතිය	10.3
ජපානය		**198.5**
එයින් :	ශ්‍රී ලංකාවේ සුනාමි ව්‍යසනයට ලක් වූ ප්‍රදේශ යථා තත්වයට පත් කිරීමේ සහ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය	39.3
	බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සංවර්ධන ව්‍යාපෘතිය	35.3
	සුළු පරිමාණ යටිතල පහසුකම් පුනරුත්ථාපන සහ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (SIRUP ii)	21.0
	මහ කොළඹ සඳහා කළුගඟ ජල සැපයුම් ව්‍යාපෘතිය	18.1
	සුළු පරිමාණ යටිතල පහසුකම් පුනරුත්ථාපන සහ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය	13.5
	වලවේ වම් ඉවුර වාරිමාර්ග සහ දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය II	10.0
සිටිකෝප් ආයෝජන බැංකු ආයතනය		**100.0**
	පහසුකම් ගිවිසුම	100.0
යුරෝපා ආයෝජන බැංකුව		**17.9**
	පෞද්ගලික අංශය සඳහා ඩී.එෆ්.සී.සී. බැංකු ණය යෝජනා ක්‍රමය	17.9

මූලයන් : ශ්‍රී ලංකා මහ බැංකුව
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

සෘජු ආයෝජන 2005 වසරේ දී ඉහළ ගියේ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 234 දක්වා පමණි. ආයෝජන මණ්ඩල පනතේ 17වන වගන්තිය යටතේ 2004 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 689ක් සඳහා වූ අනුමත කළ සහ එකඟ වූ ව්‍යාපෘති 296 සමඟ සසඳන විට, 2005 වසරේ දී එ.ජ. ඩොලර් දශ ලක්ෂ 276ක් සඳහා අනුමත කළ හා එකඟ වූ ව්‍යාපෘති සංඛ්‍යාව 223 දක්වා පහළ ගියේය. අනුමත කළ ව්‍යාපෘතිවල අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතුවූයේ ව්‍යාපෘතිවල ගුණාත්මක බව හා ඵලදායිතාවය තහවුරු කිරීම පිණිස සෘජු විදේශ ආයෝජන ඉහළ සුපරීක්ෂණයකට ලක් කිරීමයි. 2004 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 361ක එකඟ වූ විදේශ ආයෝජන සඳහා ගිවිසුම් ගත ව්‍යාපෘති සංඛ්‍යාව 228 සිට, 2005 වසරේ දී එ.ජ.ඩොලර් දශලක්ෂ 322ක් සඳහා ගිවිසුම්ගත ව්‍යාපෘති සංඛ්‍යාව 167 දක්වා පහළ ගියේය. කෙසේ වෙතත්, ඉහළ සුපරීක්ෂණ ක්‍රියාවලිය තුළින් අනාගතයේදී ගිවිසුම්ගත ව්‍යාපෘතිවලින් සාපේක්ෂව වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. රජයේ ප්‍රතිපත්තිවලට අනුව සෑම ප්‍රදේශයකම තුලිත වර්ධනයක් ඇති කිරීම සඳහා අඩු සංවර්ධිත ප්‍රදේශවල ආයෝජනය කරන්නන් හට නව දිරිගැන්වීම් ක්‍රමයක් ආයෝජන මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කර ඇත. මූලික වශයෙන් නිපැයුම් මධ්‍යස්ථාන වැඩසටහන යටතේ වන කර්මාන්ත 300 සඳහා මෙම ප්‍රතිලාභ ලැබෙනු ඇත.

රජයට ලැබුණු ණය ප්‍රාග්ධනය

- **2004 වසරේ පැවැති එ.ජ.ඩොලර් දශ ලක්ෂ 771ක් වූ රජයට ලැබුණු මුළු දිගුකාලීන ණය 2005 වර්ෂයේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 747 දක්වා සියයට 3.1කින් අඩු විය.** සුනාමි ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති සඳහා එ.ජ.ඩොලර් දශ ලක්ෂ 93ක් ද, ඒකාබද්ධ විදේශීය වාණිජ ණය ලෙස එ.ජ.ඩොලර් දශ ලක්ෂ 100ක් ද වශයෙන් රජයට ණය ප්‍රාග්ධනය ලැබිණි. මෙම සුනාමි සම්බන්ධ ණය සහ ඒකාබද්ධ විදේශීය වාණිජ ණය අත්හැර බැලූවිට රජයට ලැබුණු විදේශීය ණය ආධාර එ.ජ.ඩොලර් දශ ලක්ෂ 554 දක්වා සියයට 28.1කින් සැලකියයුතු ලෙස අඩු වේ. මේ අතර, 2005 වසරේ දී, පැරිස් කණ්ඩායමේ සාමාජිකයින්ගෙන් ලැබුණු එ.ජ.ඩොලර් දශ ලක්ෂ 188ක ණය පමාකිරීමේ පහසුකම නිසා ලැබුණු ප්‍රතිලාභ හේතුවෙන්, 2004 වසරේ පැවැති රජයේ ණය ආපසු ගෙවීම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 331 සිට එ.ජ.ඩොලර් දශ ලක්ෂ 194 දක්වා අඩු විය. 2005 වසරේ දී වැඩ සටහන් ණය ආධාර ලෙස එ.ජ.ඩොලර් දශ ලක්ෂ 20ක් ලැබිණි. මෙය 2005 වසරේ අපේක්ෂිත එ.ජ.ඩොලර් දශ ලක්ෂ 119ට වඩා විශාල අඩුවීමක් වන අතර 2004 වසරේ වැඩසටහන් ණය ආධාර ලෙස ලැබුණු එ.ජ.ඩොලර් දශ ලක්ෂ 30ට ද වඩා අඩුවීමකි. මෙම අඩුවීමට හේතුවූයේ ණය ලබා ගැනීමට අදළ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම පමාවීමයි. වැඩ

සටහන් ණය ආධාරවල අඩුවීම ඒකාබද්ධ වාණිජ ණය ලෙස ලැබුණු එ.ජ.ඩොලර් දශ ලක්ෂ 100 මගින් මූල්‍යනය කිරීමට හැකි විය. සුනාමි ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති සඳහා එ.ජ.ඩොලර් දශ ලක්ෂ 93ක ව්‍යාපෘති ණය ලැබී තිබියදීත්, 2004 වසරේ දී ව්‍යාපෘති ණය ලෙස ලැබුණු එ.ජ.ඩොලර් දශ ලක්ෂ 689, සියයට 10කින් අඩු වී 2005 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 620ක් විය. සුනාමි සම්බන්ධ ණය ආධාර ඉවත්කළහොත්, ව්‍යාපෘති ණය මුදාහැරීම් සියයට 22.5කින් අඩු වී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 527ක් විය. 2005 වසරේ දී විදේශ ණය ආධාර ලැබූ ප්‍රධාන අංශයන් වූයේ මාර්ග සංවර්ධනය, අධ්‍යාපන, බලශක්ති අංශය, ජල සැපයුම් සහ වාරිමාර්ග, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය, ගුවන් තොටුපොළ සංවර්ධනය සහ සුනාමි ව්‍යසනයට ලක්වූ සහ ගැටුම් බලපෑ ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය හා පුනරුත්ථාපන ව්‍යාපෘතීන්ය. විදේශ අරමුදල් මගින් මූල්‍යනය කරන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම සඳහා බලයටපත් රජයයන් මගින් විවිධ නිර්ණායකයන් හඳුන්වා දෙනු ලැබුවත්, ණය ලබා ගැනීම තවදුරටත් ප්‍රමාද වීමෙන් පෙන්නුම් කරනුයේ එම ක්‍රියාවලියේ දුර්වලතා තවදුරටත් පවතින බවයි. 2005 වසරේ දී විදේශීය ණය උපයෝජන අනුපාතය ප්‍රතිශතාංක 2කින් අඩු වී සියයට 16.5ක් විය.

- **2004 වසරේ දී සියයට 92.7ක සහනදායී පදනම මත ලැබුණු ණය හා සසඳනවිට, 2005 වසරේ මුළු ණය ලැබීම්වලින් සියයට 84.4ක් සහනදායී නියමයන් හා කොන්දේසි මත ලැබුණු අතර ඉතිරිය වාණිජ නියමයන් හා කොන්දේසි මත ලැබුණු ණය විය.** අතීතයේ මෙන්, 2005 වසරේදීත් බහුපාර්ශ්වීය ණය දෙන ආයතන මගින් විදේශීය ණයවලින් වැඩි ප්‍රමාණයක් ලබා දී ඇත. පිළිවෙළින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 198ක් සහ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 113ක් ලබා දුන් ආසියානු සංවර්ධන බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය බහුපාර්ශ්වීය ණය ලබා දෙන්නන් අතර තවදුරටත් ප්‍රධාන විය. ද්විපාර්ශ්වීය ණය ආධාර ලෙස ලැබුණු එ.ජ.ඩොලර් දශ ලක්ෂ 271න් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 199ක් ජපානයෙන් ද, එ.ජ.ඩොලර් දශ ලක්ෂ 24ක් ජර්මනියෙන් ද ලැබිණි. මුළු සහනදායී මූල්‍ය පහසුකම්වලින් සියයට 31.5ක් ජපානය විසින් ද, පිළිවෙළින් සියයට 31.3ක් සහ සියයට 17.9ක් ආසියානු සංවර්ධන බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් ලබා දී ඇත. 2004 වසරේ දී මෙය පිළිවෙළින් සියයට 37.7ක්, සියයට 25.8ක් සහ සියයට 9.5ක් විය.

- **සහනදායී නොවන විදේශීය මූල්‍ය පහසුකම් සහ දේශීය වෙළෙඳපොළෙන් විදේශ ව්‍යවහාර මුදල් ණය ලබා ගැනීම මගින් විදේශීය සහනදායී මූල්‍ය පහසුකම්වල අඩුවීම මූල්‍යනය කෙරිණි.** වසර තුළ දී, රජය විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක ණය වලින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 170ක් පියවා එ.ජ.ඩොලර් දශ ලක්ෂ 585ක වටිනාකමට අලුත් ණය ලබාගැනීම සහ නැවත නිකුත් කිරීම මගින් ණය ලබා ගෙන ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2005 වසරේදී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 415ක ශුද්ධ විදේශ ව්‍යවහාර මුදල් ණය දේශීය වාණිජ බැංකුවලින් ලබා ගෙන ඇත. ඊට අමතරව රජය මගින් ජාත්‍යන්තර වෙළෙඳපොළෙන් ලබාගත් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 100ක් වූ ඒකාබද්ධ වාණිජ ණය මුදල මගින් ඉතිරි මූල්‍ය ශේෂය පියවා ගෙන ඇත. ඒකාබද්ධ වාණිජ ණය මුදලත්, දේශීය වෙළෙඳපොළෙන් ලබාගත් විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක ණය මුදලත් යන ණය මුදල් දෙකම ලබාගෙන ඇත්තේ වෙළෙඳපොළේ පවතින පොලී අනුපාත යටතේය. ජාත්‍යන්තර පොලී අනුපාතයේ උච්චාවචනයන්ට අනුව ණය සේවා ඉහළයාමේ හැකියාවක් පෙන්නුම් කරන බැවින්, ණය තොගය වැඩිවීම නිසා මැදි හා දිගුකාලීන සහනදායී ණයවල අඩුවීම විදේශ විනිමය බැංකු ඒකක මගින් සැඳුම්ලත් වාණිජ ණය මගින් පියවීමට උත්සාහ කළත්, එය දිගුකාලීන ණය පැවැත්මට අහිතකර ලෙස බලපෑ හැකිය.

පෞද්ගලික අංශයට ලැබුණු ප්‍රාග්ධනය

- **පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය සංස්ථාවලට දිගුකාලීන ප්‍රාග්ධන ලැබීම් 2004 වසරේ දී පැවැති එ.ජ.ඩොලර් දශ ලක්ෂ 169 සිට 2005 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 197 දක්වා සියයට 16.6කින් ඉහළ ගියේය.** මෙයට ප්‍රධාන වශයෙන් දායකවූයේ ඉන්දියාවෙන් ඛනිජ තෙල් ආනයනය කිරීම සඳහා ඉන්දියානු ණය ක්‍රමය යටතේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලබාගත් එ.ජ.ඩොලර් දශලක්ෂ 144ක ද්විපාර්ශ්වීය ණය මුදලය. ඛනිජ තෙල් මිල ඉහළයාමෙන් රටේ ගෙවුම් තුලනය කෙරෙහි ඇති විය හැකි අහිතකර බලපෑම අවම කර ගැනීම සඳහා රජය විසින් මෙම ණය මුදල් ලබා ගැනීමට කටයුතු කෙරිණි.

කෙටිකාලීන ප්‍රාග්ධන ගලාඒම් සහ ගලායාම්

- **2004 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 112ක කෙටිකාලීන ශුද්ධ ප්‍රාග්ධන ගලායාම් හා සසඳනවිට 2005 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 176ක ශුද්ධ ගලාඒම් ප්‍රමාණයක් වාර්තා විය.** කොටස් වෙළෙඳපොළ හරහා ශුද්ධ විවිධ ආයෝජන ගලාඒම්වල ඉහළයෑමක් වාර්තා විය. මෙයට හේතු වූයේ ලැයිස්තුගත සමාගම්වල ශක්තිමත් ක්‍රියාකාරිත්වය සහ පැවති යහපත් ආර්ථික වාතාවරණයයි. එක්සත් ජනපදයේ විශාලතම රාජ්‍ය විශ්‍රාම වැටුප් අරමුදල වූ කැලිෆෝනියා රාජ්‍ය සේවක විශ්‍රාම ක්‍රමය එහි ආයෝජන සඳහා සුදුසුකම් ලබන ලැයිස්තුවේ ශ්‍රී ලංකාව ද 2005 වසර සඳහා ඇතුළත් කරන ලදී. සේවා අංශයේ සමාගම් මගින් ආරම්භක මහජන පිරිනැමීම් දෙකක් ඉදිරිපත් කිරීම මගින් 2005 වසරේදී විදේශීය ආයෝජන තවදුරටත් ඉහළ ගියේය. 2004 වසරේ දී වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 11ක ශුද්ධ විවිධ ආයෝජන ගලාඒම් හා සසඳන විට එය 2005 වසරේ දී එ.ජ.ඩොලර් දශලක්ෂ 60ක් විය. 2005 වසරේ දී කොළඹ කොටස් වෙළෙඳපොළ ඉතාමත් හොඳින් ක්‍රියාත්මක වූ වෙළෙඳපොළ අතරින් එකක්

බවට පත්විය. 2004 වසරේදී වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 28ක ශුද්ධ ගලාඒම් හා සසඳන විට අපනයන සහ ආනයන සම්බන්ධ සැපයුම්කරුවන්ගේ කෙටිකාලීන ණය ඇතුළත් පෞද්ගලික කෙටිකාලීන ණය 2005 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 16ක ශුද්ධ ගලා ඒමක් ලෙස වාර්තා වූයේ ආනයන වර්ධනය පහළ මට්ටමක පැවතීම සහ ඉන්දියානු ණය ක්‍රමය යටතේ පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයන සඳහා දිගුකාලීන ණය ලබා ගැනීමයි.

- **2004 වසරේ දී වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 151ක වාණිජ බැංකුවල ශුද්ධ විදේශීය වත්කම් ඉහළයාම හා සසඳන විට එය 2005 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 100කින් පහළ ගියේය.** විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක මගින් රජයට එ.ජ.ඩොලර් දශ ලක්ෂ 415ක ශුද්ධ ණය මුදලක් ප්‍රදානය කළ ද, වාණිජ බැංකු සතු විදේශීය වත්කම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 223කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, 2005 වසරේ දී වාණිජ බැංකුවල විදේශීය වගකීම් දශ ලක්ෂ 323කින් ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ විදේශීය වත්කම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 100කින් පහළ ගියේය. විදේශ වත්කම්වල වර්ධනයෙන් පිළිබිඹු වන්නේ වාණිජ බැංකු මගින් විදේශයන්හි කරන ලද ආයෝජනයන්ය. වාණිජ බැංකුවල විදේශ වගකීම් ඉහළයාමෙන් ප්‍රධාන වශයෙන් පිළිබිඹු වූයේ එක් වාණිජ බැංකුවක් මගින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 130ක ඒකාබද්ධ වාණිජ ණය මුදලක් ලබා ගැනීමයි.

ගෙවුම් තුලනය සහ විදේශ වත්කම්

- **2005 වසරේ දී ගෙවුම් තුලනයේ අතිරික්තයක් වාර්තා විය.** ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුමේ ශුද්ධ ලැබීම් ජංගම ගිණුමේ හිඟය පියවීමටත් වඩා ප්‍රමාණවත් විය. ඒ අනුව 2004 වසරේ වාර්තා වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 205ක හිඟයට එරෙහිව 2005 වසරේ දී ගෙවුම් තුලන සමස්ත ශේෂය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 501ක අතිරික්තයක් වාර්තා කළේය.

- **2001 වසරේ සිට වසර තුනක් අඛණ්ඩ වර්ධනයක් වාර්තා කිරීමෙන් පසු 2004 වසරේ දී පහත වැටුණු දළ නිල වත්කම් ප්‍රමාණය 2005 වසරේ දී නැවතත් ඉහළ ගියේය.** බාහිර කම්පනයන්ට රටට මුහුණදීමට ඇති හැකියාව වත්කම් ඉහළයාම තුළින් පිළිබිඹු කෙරේ. 2004 වසර අවසානයේ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,196 ක් වූ දළ නිල වත්කම් ප්‍රමාණය 2005 වසර අවසානයේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,735 දක්වා ඉහළ ගියේය. අන්තර්ජාතික මූල්‍ය අරමුදලෙන් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 157ක හදිසි ආපද සහන ලැබීම, දේශීය වාණිජ බැංකු මගින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 415ක ශුද්ධ

5.8 රූප සටහන
විදේශ සංචිත (ත්‍රෛමාසික)



5.10 සංඛ්‍යා සටහන
ශ්‍රී ලංකාවේ විදේශ වත්කම් (අ)

		එ.ජ. ඩොලර් දශ ලක්ෂ (ආ)					රුපියල් දශ ලක්ෂ				
		2001	2002	2003	2004	2005	2001	2002	2003	2004	2005
1.	රජය	78	46	55	95	131	7,302	4,424	5,320	9,897	13,417
2.	රාජ්‍ය නියෝජ්‍යකත්වය	-	-	-	-	-	-	-	-	-	-
3.	මහ බැංකුව	1,260	1,654	2,274	2,101	2,604	117,365	160,018	219,984	219,795	265,873
4.	මුළු නිල වත්කම්	1,338	1,700	2,329	2,196	2,735	124,668	164,442	225,304	229,693	279,290
5.	වාණිජ බැංකු	900	795	889	1,243	1,466	83,815	76,921	86,011	129,987	149,656
6.	මුළු විදේශීය වත්කම්	2,238	2,495	3,218	3,438	4,201	208,482	241,364	311,315	359,680	428,946
7.	දළ නිල වත්කම් මගින් කළ හැකි ආනයන මාස ගණන										
	7.1 වෙළෙඳ භාණ්ඩ	2.7	3.3	4.2	3.3	3.7					
	7.2 භාණ්ඩ හා සේවා	2.3	2.9	3.6	2.9	3.3					
8.	මුළු වත්කම් මගින් කළහැකි ආනයන මාස ගණන										
	8.1 වෙළෙඳ භාණ්ඩ	4.5	4.9	5.8	5.2	5.7					
	8.2 භාණ්ඩ හා සේවා	3.8	4.2	5.0	4.5	5.0					

(අ) 2002 වසරේ සිට සංචිත ගණනය කර ඇත්තේ වෙළෙඳපොළ වටිනාකම අනුව ගැලපීමේ පදනම මතය.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(ආ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග එකඟ වන ලද නියෝජන අනුපාතිකයට අනුව පරිවර්තනය කරන ලද මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතයේ සමහර ශීර්ෂයන් හැර ඉතිරිය පහත සඳහන් කාලපරිච්ඡේද අවසානයේ වූ විනිමය අනුපාතිකයින්ට අනුව පරිවර්තනය කර ඇත.

වසර අවසානයේ දී	2001	2002	2003	2004	2005
එ.ජ. ඩොලර් එකකට රුපියල්	93 16	96.73	96.74	104.61	102.12

විශේෂ සටහන 11

ගෙවුම් තුලන ලේඛනයේ මූල්‍ය ගිණුම නැවත වර්ගීකරණය කිරීම

ආර්ථික විශ්ලේෂණයත්, රටවල් අතර සංසන්දනයත් පහසු කිරීම පිණිස ගෙවුම් තුලන සංඛ්‍යා සටහන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) මගින් ස්ථාපිත කරනු ලැබූ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව සිදු කෙරෙයි. ජා.මූ.අ. විසින් ප්‍රකාශයට පත් කරන ලද ගෙවුම් තුලන අත්පොතෙහි මෙම ප්‍රමිතීන් අන්තර්ගත වේ. මූල්‍ය වෙළෙඳපොළවල සිදුවන ශීඝ්‍ර සංවර්ධනය සහ දියුණුවීම්, ජාත්‍යන්තර භාණ්ඩ වෙළෙඳමෙහි වෙනස්කම් සහ සේවා වෙළෙඳමෙහි වර්ධනය ආදිය සැළකිල්ලට ගැනීමෙන් අනතුරුව ගෙවුම් තුලන අත්පොතෙහි 5වන සංස්කරණය 1993 දී ප්‍රකාශයට පත් කෙරිණි. ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලන ලේඛනයේ වෙළෙඳ, සේවා, ආදයම් සහ ජංගම සංක්‍රාම ගිණුම් ගෙවුම් තුලන අත්පොතෙහි 5වන සංස්කරණයට බොහෝදුරට අනුකූල වන නමුත් මූල්‍ය ගිණුම සම්පූර්ණ වශයෙන්ම ඊට අනුරූප නොවීය. එබැවින්, 2005 වසරේදී ගෙවුම් තුලන අත්පොතෙහි 5වන සංස්කරණයේ අවශ්‍යතාවයන්ට අනුරූප වන පරිදි මූල්‍ය ගිණුම වැඩි දියුණු කර ඇති අතර, වාර්ෂික වාර්තාවේ 85(අ) සංඛ්‍යා සටහන මගින් එය ප්‍රකාශයට පත් කෙරෙයි.

1987 දී ගෙවුම් තුලන අත්පොතේ 4වන සංස්කරණය ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව සිදු වූ ජාත්‍යන්තර මූල්‍ය ගනුදෙනුවල ස්වභාවයේ සහ සැකැස්මෙහි ඇති වූ පුළුල් වෙනස්කම් නිරූපණය කරමින් ගෙවුම් තුලන අත්පොතෙහි 5වන සංස්කරණයේදී මූල්‍ය ප්‍රමාණයන් ආවරණය සැළකිය යුතු ලෙස පුළුල් හා ප්‍රතිව්‍යුහගත කර ඇත. ඒ අනුව, ගෙවුම් තුලන අත්පොතේ 5වන සංස්කරණය අනුව මූල්‍ය ගිණුමට අදළ ගනුදෙනු සෘජු ආයෝජන, කොටස් වෙළෙඳපොළ ආයෝජන, වෙනත් ආයෝජන සහ සංචිත වත්කම් වශයෙන් ප්‍රධාන කොටස් හතරකට වර්ගීකරණය කෙරේ. සෘජු ආයෝජන, රට තුළ විදේශීය සෘජු ආයෝජන සහ විදේශයන්හි සිදු කෙරෙන සෘජු ආයෝජන වශයෙන් තවදුරටත් බෙදෙන අතර කොටස් වෙළෙඳපොළ ආයෝජන සහ වෙනත් ආයෝජන, වත්කම් සහ වගකීම් පදනම මත වර්ගීකරණය කෙරේ. ගෙවුම් තුලන අත්පොතේ 5 වන සංස්කරණය අනුව සංචිත වත්කම් හා සම්බන්ධ ගනුදෙනු වාර්තා කෙරෙනුයේ වත්කම් පදනම මත පමණි.

සංඛ්‍යා සටහන වි.ස. 11.1

මූල්‍ය ගිණුමේ ප්‍රධාන අයිතමයන් ගෙවුම් තුලන අත්පොතේ 4 වන සංස්කරණයේ සිට 5 වන සංස්කරණයට නැවත වර්ගීකරණය කෙරෙන අයුරු



ණය මුදලක් විදේශ ව්‍යවහාර මුදලින් ලබා ගැනීම, ජාත්‍යන්තර වෙළෙඳපොළෙන් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 100ක ඒකාබද්ධ වාණිජ ණය මුදලක් ලබා ගැනීම, ආසියානු සංවර්ධන බැංකුවෙන් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 20ක වැඩසටහන් ණය ලබා ගැනීම, පැරිස් කණ්ඩායමේ සාමාජික රටවලින් සහ බහු පාර්ශ්වීය ණය දෙන ආයතන වලින් ණය ආපසු ගෙවීම සඳහා සහන කාලයක් ලබා දීම සහ සුනාමි ව්‍යසනය හේතුවෙන් ලද ලැබීම් නිල සංචිතවල වර්ධනයට දායක විය. රට තුළට ලැබුණු ඉහළ විදේශ විනිමය ප්‍රවාහ ඉහළ යමින් පවතින ආනයන වියදමෙහි අහිතකර බලපෑම අවම කර ගැනීමට උපකාරී විය. 2004 වසර අවසානයේ දී මාස 3.3ක ආනයන මූල්‍යනය කිරීමට ප්‍රමාණවත් වූ දළ නිල වත්කම් ප්‍රමාණය, 2005 වසර අවසන් වන විට මාස 3.7ක ආනයන මූල්‍යනය කිරීමට ප්‍රමාණවත් ලෙස ඉහළ ගියේය. කෙටිකාලීන ණය සහ වගකීම්වල අනුපාතයක් ලෙස දළ නිල වත්කම්වල ප්‍රමාණය මගින් මනිනු ලබන සංචිතවල ප්‍රමාණවත්භාවය 2004 වසරේ දී සියයට 83.5 සිට 2005 වසරේ දී සියයට 85.4 දක්වා ඉහළ ගියේය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සහ විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක ණය වැනි දේශීය වශයෙන් ලබා ගත් විදේශ ව්‍යවහාර මුදල් ණය ද ඇතුළත් කළේ නම් මෙම අනුපාතය සියයට 77.1 සිට සියයට 71.6 දක්වා පහත වැටෙන අතර, එයට ප්‍රධාන වශයෙන් හේතු වනුයේ විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක ණයවලින් සැලකිය යුතු ප්‍රමාණයක් 2006 වසරේ දී ආපසු ගෙවිය යුතු වීමයි.

- **නිල සංචිත ඉහළ යාම හේතුවෙන් 2004 වසර අවසානයේ දී එ.ජ.ඩොලර් දශලක්ෂ 3,438 (ආනයන මාස 5.2) ක් වූ රටේ මුළු සංචිත ප්‍රමාණය 2005 වසර අවසානවන විට එ.ජ.ඩොලර් දශලක්ෂ 4,200 (ආනයන මාස 5.7) දක්වා ඉහළ ගියේය.**

5.6 විදේශ ණය සහ ණය සේවා

විදේශ ණය

- **ශ්‍රී ලංකා රුපියල ප්‍රධාන මුදල් ඒකකයන්ට එරෙහිව අධිප්‍රමාණය වීම සහ විදේශ ණය ලබාදෙන ආයතන සහ ද්විපාර්ශ්වීය ණය ප්‍රදානය කරන්නන් විසින් ණය මුදා හැරීම අඩු මට්ටමක පැවැතීම හේතුවෙන්, රටක ණය ප්‍රමාණය තක්සේරු කරන ප්‍රධාන දර්ශකය වන ද.දේ.නි.යේ ප්‍රතිශත වටිනාකම අනුව මුළු විදේශ ණය ප්‍රමාණය 2005 වසර තුළ දී පහත වැටුණි.** ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස 2004 වසරේ දී සියයට 56.6ක් වූ මුළු විදේශ ණය ප්‍රමාණය 2005 වසර තුළ දී සියයට 48.3 දක්වා අඩු විය. එ.ජ.ඩොලර් වටිනාකම අනුව 2004 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 11,346 වූ මුළු විදේශ ණය ප්‍රමාණය 2005 වසරේදී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 11,368 දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. කෙසේ වෙතත්, පුළුල් ලෙස සලකා බැලීමේදී වාණිජ බැංකු සතු වගකීම් ප්‍රමාණය ඉහළයාම නිරූපණය කරමින්, මුළු විදේශ ණය සහ වගකීම් ප්‍රමාණය

5.9 රූපසටහන
විදේශ ණය



සියයට 2.0කින් වැඩි වී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 13,034ක් විය. මුළු විදේශ ණය ප්‍රමාණයෙන් සියයට 30ක් පමණ ජපන් යෙන්වලින් ද සියයට 42ක් පමණ වි.ගැ.හි.වලින් සමන්විත වන අතර එම මුදල් වර්ග පිළිවෙළින් සියයට 12.8කින් සහ සියයට 8.0කින් එ.ජ.ඩොලරයට එරෙහිව අවප්‍රමාණය වීම 2005 වසර තුළ මුළු ණය ප්‍රමාණය පහත වැටීමට හේතු විය. ඊට අමතර වශයෙන් 2005 වසර තුළ සුනාමි සම්බන්ධ පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ, ආධාර වශයෙන් ඉතාලිය හා චීනය පිළිවෙළින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 9.2ක් සහ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 4.4ක ණය කපාහැරීමත් විදේශ ණය ප්‍රමාණය අඩුවීමට සුළු වශයෙන් දායක විය.

- **2005 වසරේ දී මුළු ණය ප්‍රමාණයෙන්, සියයට 94ක් පමණ රජයේ මැදි හා දිගුකාලීන ණයවලින් සමන්විත විය.** ඉන් සියයට 87.5ක් පමණ රාජ්‍ය අංශයේ ණයවලින් සමන්විත වන අතර ඉතිරි සියයට 12.5 පෞද්ගලික අංශය, රාජ්‍ය සංස්ථා සහ ජා.මූ. අරමුදලෙන් ලබාගත් ණයවලින් සමන්විත වේ. ශුද්ධ ණය ලබාගැනීම ධනාත්මක වුවත්, 2004 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 9,283ක්ව පැවැති රජයේ සහනදායී ශුද්ධ ණය ලැබීම්, එ.ජ.ඩොලරයට එරෙහිව ජපන් යෙන් සහ වි.ගැ.හි. අධිප්‍රමාණය වීම හේතුවෙන් 2005 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 9,000 දක්වා සියයට 3.1කින් පහත වැටුණි. 2005 වසර තුළ දී, එ.ජ.ඩොලර් දශ ලක්ෂ 100ක ඒකාබද්ධ වාණිජ ණය මුදලක් වෙළෙඳපොළ පොලී අනුපාත යටතේ ලබා ගැනීම හේතුවෙන් රජයේ සහනදායී නොවන ණය ප්‍රමාණය සියයට 53.2කින් වැඩි වී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 368ක් විය. 2004 වසර අවසානයේ දී ඇති වූ සුනාමි ව්‍යසනය හේතුවෙන්, ජා.මූ.අ. මගින් ලබා දුන් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 157ක හදිසි සහනාධාර නිසා, එ.ජ.ඩොලර් දශ ලක්ෂ 258ක් වූ ජා.මූ.අ. වගකීම් 2005 වසර අවසානය වනවිට එ.ජ.ඩොලර් දශ ලක්ෂ 381 දක්වා සියයට 47.6කින් ඉහළ ගියේය.

- **ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලබාගත් ණය ප්‍රමාණය හේතුවෙන්, 2004 වසරේ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 918ක් වූ පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය සමාගම්වල මැදි හා දිගුකාලීන ණය ප්‍රමාණය 2005**

5.11 සංඛ්‍යා සටහන
නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය සහ බැංකු අංශයේ විදේශීය වගකීම්

ශීර්ෂය	එ.ජ. ඩොලර් දශ ලක්ෂ					රුපියල් දශ ලක්ෂ				
	2001	2002	2003	2004	2005(අ)	2001	2002	2003	2004	2005(අ)
1. මැදි හා දිගු කාලීන ණය	**7,839**	**8,732**	**10,116**	**10,699**	**10,704**	**730,245**	**844,709**	**978,556**	**1,119,155**	**1,093,057**
1.1 රජය	6,808	7,464	8,812	9,523	9,368	634,255	721,956	852,433	996,203	956,620
1.2 රජය විසින් සහතික කරන ලද රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශය	572	689	602	507	567	53,324	66,663	58,251	52,986	57,912
1.3 රජය විසින් සහතික නොකරන ලද රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශය	249	293	334	411	388	23,203	28,303	32,319	42,944	39,588
1.4 ජා.මූ.අන් කළ ගැණුම්	209	287	368	258	381	19,463	27,787	35,552	27,023	38,937
2. කෙටි කාලීන ණය	**533**	**601**	**620**	**647**	**664**	**49,648**	**58,116**	**59,935**	**67,726**	**67,759**
2.1 රජය	-	-	-	-	-	-	-	-	-	-
2.2 අනෙකුත් (ආ)	533	601	620	647	664	49,648	58,116	59,935	67,726	67,759
3. බැංකු අංශය විදේශ වගකීම් (ඇ)	**1,119**	**1,001**	**1,046**	**1,429**	**1,666**	**104,201**	**96,807**	**101,149**	**149,492**	**170,170**
3.1 මහ බැංකුව	2	1	-	1	1	172	123	32	128	131
3.2 වාණිජ බැංකු	1,009	865	863	1,066	1,388	94,030	83,655	83,514	111,464	141,753
3.3 ආ.නි. සංගමයේ වගකීම්	107	135	182	362	277	9,999	13,029	17,604	37,899	28,286
4. මුළු විදේශීය ණය (1+2)	**8,372**	**9,333**	**10,735**	**11,346**	**11,368**	**779,893**	**902,825**	**1,038,491**	**1,186,881**	**1,160,816**
5. මුළු විදේශීය ණය සහ වගකීම් (1+2+3)	**9,490**	**10,334**	**11,781**	**12,775**	**13,034**	**884,095**	**999,632**	**1,139,640**	**1,336,373**	**1,330,986**
විශේෂිත අයිතමයන්										
මැදි හා දිගු කාලීන ණය										
(1) ව්‍යාපෘති ණය	5,374	4,358	6,961	7,702	7,527	480,237	421,637	673,432	805,646	768,643
(2) ව්‍යාපෘති නොවන ණය	1,154	3,048	1,726	1,763	1,614	103,163	294,880	167,007	184,467	164,858
(3) සැපයුම්කරුවන්ගේ ණය	316	100	218	240	368	29,411	9,718	21,048	25,123	37,591
(4) ජා.මූ. අත් කළ ණය	209	287	368	258	381	19,463	27,787	35,552	27,023	38,937
(5) අනෙකුත් ණය (ඈ)	786	939	843	735	813	97,971	90,686	81,516	76,896	83,029
කෙටිකාලීන ණය හා බැංකු අංශයේ වගකීම්	**1,651**	**1,602**	**1,665**	**2,077**	**2,330**	**153,850**	**154,923**	**161,084**	**217,217**	**237,929**
ද.දේ.නි.යේ ප්‍රතිශතයක් වශයෙන්										
මුළු විදේශ ණය	53.2	56.3	58.9	56.6	48.3	55.4	57.0	59.0	58.5	49.1
බැංකු අංශයේ මුළු විදේශීය වගකීම්	7.1	6.0	5.7	7.1	7.1	7.4	6.1	5.7	7.4	7.2
මුළු විදේශීය ණය සහ බැංකු අංශයේ විදේශීය වගකීම්	60.3	62.4	64.6	63.7	55.4	62.8	63.1	64.7	65.9	56.3
කෙටිකාලීන ණය	3.4	3.6	3.4	3.2	2.8	3.5	3.7	3.4	3.3	2.9
කෙටිකාලීන ණය හා බැංකු අංශයේ විදේශ වගකීම්	10.5	9.7	9.1	10.4	9.9	10.9	9.8	9.2	10.7	10.1
මුළු ණයවල ප්‍රතිශතයන් වශයෙන්										
කෙටිකාලීන ණය	5.6	5.8	5.3	5.1	5.1	5.6	5.8	5.3	5.1	5.1
කෙටිකාලීන වගකීම්	11.8	9.7	8.9	11.2	12.8	11.8	9.7	8.9	11.2	12.8
කෙටිකාලීන ණය, නිල විදේශීය සංචිතයෙහි ප්‍රතිශතයක් වශයෙන්	39.8	35.3	26.6	29.5	24.3	39.8	35.3	26.6	29.5	24.3

මූලයන් : ශ්‍රී ලංකා මහ බැංකුව
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික
(ආ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රතිග්‍රහණ ණය සහ වෙළෙඳ ණය ඇතුළත් කොට ඇත.
(ඇ) ආසියානු නිෂ්කාශන සංගමයේ ණය සහ වි.ව්‍ය.මූ.බැ.ඒ. ඇතුළත් වාණිජ බැංකුවල විදේශ වගකීම් ද ඇතුළත් වේ.
(ඈ) රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශය මගින් ගත් ණය ඇතුළුව දිගුකාලීන ණය .

වසරේ දී එ.ජ.ඩොලර් දශලක්ෂ 955 ක් දක්වා සියයට 4.0කින් ඉහළ ගියේය. ඉන්දියානු ණය ක්‍රමය යටතේ ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව එ.ජ.ඩොලර් දශ ලක්ෂ 144ක ණය අරමුදල් භාවිත කිරීම හේතුවෙන් 2004 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 507ක්ව පැවති පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය සමාගම්වල රජය විසින් සහතික කරන ලද විදේශ ණය ප්‍රමාණය 2005 වසරේ දී සියයට 11.8කින් ඉහළ ගොස් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 567ක් විය. රජය සිය අසම්භාව්‍ය බැරකම් අවමකර ගැනීම සඳහා, පෞද්ගලික අංශය සහ රාජ්‍ය සමාගම් ලබාගන්නා ණය සහතික කිරීමේදී ප්‍රතිපත්තියක් ලෙස ප්‍රවේශම්කාරී වුවත්, 2005 වසරේ දී ඓතිහාසික ලෙස ඛනිජ තෙල් මිල ඉහළ යාමෙන් ගෙවුම් තුලනයට සිදුවිය හැකි අහිතකර ප්‍රතිවිපාක මගහරවා ගැනීම සඳහා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලබාගත් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 144ක ණය රජය විසින් සහතික කෙරිණි. කෙසේ වුවද, 2005 වසර තුළ දී ආපසු ගෙවූ ණය ප්‍රමාණය ලබාගත් ණය ප්‍රමාණයට වඩා ඉහලයාම හේතුවෙන්, 2004 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 411ක් වූ පෞද්ගලික අංශයේ හා රාජ්‍ය සමාගම්වල රජය විසින් සහතික නොකළ දිගුකාලීන ණය ප්‍රමාණය 2005 වසර තුළ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 388 දක්වා සියයට 5.6කින් පහත වැටිණි.

- **අපනයනයන් වැඩිවීමට වඩා වැඩි වේගයකින් ආනයන වැඩිවීම හේතුවෙන් වෙළෙඳ ණයවලින් සමන්විත කෙටිකාලීන ණය ප්‍රමාණය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 664 දක්වා සියයට 2.6කින් වැඩි විය**. 2004 වසරේ දී මුළු

ණය ප්‍රමාණයෙන් සියයට 5.7ක්වූ කෙටිකාලීන ණය ප්‍රමාණය 2005 වසරේ දී සියයට 5.8ක් විය. මේ අතර, ප්‍රධාන වශයෙන් වාණිජ බැංකු සතු වගකීම් තියුණු ලෙස ඉහළයාම හේතුවෙන් 2005 වසර අවසානය වන විට බැංකු ක්‍රමය සතු විදේශ වගකීම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,666 දක්වා සියයට 16.6කින් ඉහළ ගියේය.

- **මෙම වර්ධනයන් නිරූපණය කරමින්, ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස 2004 වසරේ දී සියයට 63.7ක්වූ විදේශ ණය සහ බැංකු ක්‍රමය සතු විදේශ වගකීම් ප්‍රමාණය, 2005 වසරේ දී සියයට 55.4 දක්වා පහත වැටුණි.** කෙසේ වුවද, බැංකු ක්‍රමය සතු විදේශ වගකීම් තියුණු ලෙස ඉහල යාම හේතුවෙන් එ.ජ.ඩොලර් වටිනාකම අනුව 2004 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 12,775ක්වූ මුළු විදේශ ණය සහ බැංකු ක්‍රමය සතු විදේශ වගකීම් ප්‍රමාණය, එ.ජ.ඩොලර් දශ ලක්ෂ 13,034 දක්වා සියයට 2.0කින් වැඩි විය.

විදේශ ණය සේවා ගෙවීම්

- **2005 වසර තුළ රටෙහි විදේශ ණය ආපසු ගෙවීමේ හැකියාව සැලකිය යුතු ලෙස වර්ධනය විය.** වෙළෙඳ භාණ්ඩ හා සේවා අපනයන ඉපැයීම්වල ප්‍රතිශතයක් ලෙස 2004 වසර තුළ දී සියයට 11.6ක්වූ ණය සේවා අනුපාතය සියයට 7.9 දක්වා යහපත් මට්ටමකට පත්විය. ජා.මූ.අ.ට ගෙවන ලද ණය ආපසු ගෙවීම් අත්හළ විට ණය සේවා අනුපාතය සියයට 7.3ක් ලෙස තවදුරටත් වර්ධනය වියහැකිව තිබුණි. මෙම යහපත් වර්ධනයට හේතු වූයේ භාණ්ඩ හා සේවා අපනයනයන්ගෙන් විදේශ විනිමය ඉපයීම වර්ධනය වීම, රජයේ ඇතැම් ණය සහ පොලී ආපසු ගෙවීමේදී සහනයන් ලැබීම සහ ආරක්ෂක අංශයේ ණය ආපසු ගෙවීම පහත වැටීමයි. පෞද්ගලික ප්‍රේෂණ ලැබීම් ද ඇතුළත් කළහොත් මෙම අනුපාතය සියයට 6.3ක් දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය විය හැකිව තිබුණි.

- **ණය වාරික සහ පොලී ගෙවීම්වලින් සමන්විත මුළු ණය ගෙවීම්, 2005 වසර තුළ දී සියයට 26.1කින් අඩු වී එ.ජ.ඩො. දශ ලක්ෂ 623ක් විය.** පැරිස් කණ්ඩායමේ සාමාජික රටවලින්, ජී-8 කණ්ඩායමේ සහ බහුපාර්ශ්වීය ණය ලබා දෙන ආයතන මගින් ලබාදෙන ලද ණය ගෙවීමේ සහනයන්, ආරක්ෂක කටයුතු සඳහා ලබාගත් ණය ආපසු ගෙවීම පහත වැටීම සහ ජපන් යෙන් සහ වි.ගැ.හි.වලට එරෙහිව එ.ජ.ඩොලරය අධිප්‍රමාණය වීම 2005 වසර තුළ ශ්‍රී ලංකාවේ ණය සේවා ගෙවීමේදී හිතකර බලපෑමක් ඇති කලේය. මුළු ණය සේවා ගෙවීම්වලින් සියයට 67ක් පමණ වූ ණය වාරික ගෙවීම් සියයට 29.5කින් පහත වැටී එ.ජ.ඩොලර් දශලක්ෂ 419ක්වූ අතර ණය පොලී ආපසු ගෙවීම සියයට 18.1කින් පහත වැටී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 204ක් විය. 2005 වසරේ දී රජයේ ණය වාරික ආපසු ගෙවීම් සියයට 44.6කින් පහත වැටී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 268ක් විය. ජා.මූ.අ.ට ගෙවීමට තිබූ ණයවලින් සැලකිය යුතු ප්‍රමාණයක් 2004 වසර තුළ දී ගෙවා අවසන් කිරීම

5.12 සංඛ්‍යා සටහන
ණය සේවා ගෙවීම්

ශීර්ෂය	එ. ජ. ඩොලර් දශ ලක්ෂ					රුපියල් දශ ලක්ෂ				
	2001	2002	2003	2004	2005(අ)	2001	2002	2003	2004	2005(අ)
1. ණය සේවා ගෙවීම්	813	788	761	843	623	72,584	74,704	73,125	85,318	62,577
1.1 ණය ආපසු ගෙවීම්	558	572	526	594	419	49,883	54,006	50,502	59,990	42,075
(i) ජා. මූ. අරමුදලට	78	56	32	107	39	6,966	4,647	2,869	10,718	3,902
(ii) අනෙකුත්	480	516	493	487	380	42,918	49,359	47,632	49,272	38,173
1.2 පොලී ගෙවීම්	254	216	235	249	204	22,701	20,698	22,623	25,328	20,502
(i) ජා. මූ. අරමුදලට	4	4	4	10	10	348	398	414	988	973
(ii) අනෙකුත්	251	212	230	240	194	22,353	20,300	22,209	24,340	19,530
2. වෙළඳ භාණ්ඩ අපනයනය හා සේවාවන්ගේ ඉපයීම්	6,172	5,967	6,544	7,284	7,887	551,309	571,195	631,549	738,714	793,153
3. වෙළඳ භාණ්ඩ අපනයන සේවා, ආදායම් හා පෞද්ගලික සංක්‍රාම	7,436	7,330	8,127	9,004	9,891	664,073	701,579	784,408	912,817	994,751
4. ණය සේවා අනුපාතිකය (ආ)										
4.1 2 හි ප්‍රතිශතයක් වශයෙන්										
සමස්ත අනුපාතිකය	13.2	13.2	11.6	11.6	7.9	13.2	13.1	11.6	11.5	7.9
ජා. මූ. අරමුදලේ ගනුදෙනු හැර	11.8	12.2	11.1	10.0	7.3	11.8	12.2	11.1	10.0	7.3
4.2 3 හි ප්‍රතිශතයක් වශයෙන්										
සමස්ථ අනුපාතිකය	10.9	10.8	9.4	9.4	6.3	10.9	10.6	9.3	9.3	6.3
ජා. මූ. අරමුදලේ ගනුදෙනු හැර	9.8	9.9	8.9	8.1	5.8	9.8	9.9	8.9	8.1	5.8
5. රජයේ ණය සේවා ගෙවීම්										
5.1 රජයේ ණය සේවා ගෙවීම් (ඇ)	450	522	502	484	268	40,190	49,928	48,452	48,952	26,927
5.2 1 හි ප්‍රතිශතයක් වශයෙන්	55.3	66.2	66.0	57.4	43.0	55.4	66.8	66.3	57.4	43.0

(අ) තාවකාලික

(ආ) වසර තුළ විනිමය අනුපාතිකයෙහි සිදු වූ වෙනස්වීම් හේතුවෙන් රුපියල් වටිනාකම හා එ. ජ. ඩොලර් වටිනාකම අනුව වෙන් වෙන් වශයෙන් ගත් කල ණය සේවා අනුපාතිකයන් වෙනස් වේ.

(ඇ) ජා.මූ.අරමුදලෙහි ගණුදෙනු හැර

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සහ සුනාමි සහන වශයෙන් ණය ආපසු ගෙවීම සඳහා සහන කාලයක් ලබා දීම හේතුවෙන්, 2005 වසර තුළ ජා.මූ.අ. ට ගෙවන ලද ණය වාරික ආපසු ගෙවීම සියයට 63.6කින් අඩු වී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 39ක් විය. ජාත්‍යන්තර වෙළෙඳ පොළෙහි එ.ජ.ඩොලරය අධිප්‍රමාණ වීම හේතුවෙන්, ජපන් යෙන් සහ වි.ගැ.හි.වලින් සමන්විත ණය ආපසු ගෙවීම පිළිවෙළින් සියයට 12.8කින් හා සියයට 8.0කින් අඩු විය.

5.7 විනිමය අනුපාත ක්‍රම සහ විනිමය අනුපාතයෙහි වෙනස්වීම්

- **නිදහසේ පාවීමට ඉඩහරින ලද විනිමය අනුපාත ක්‍රමය 2005 වසර තුළ දී ඉතා හොඳින් ක්‍රියාත්මක විය.** 2004 වසර තුළ දී අවප්‍රමාණයට ලක්වූ විනිමය අනුපාතිකය, සුනාමි ව්‍යසනයෙන් පසු එම ප්‍රවණතාව වෙනස් කරමින් අධිප්‍රමාණය විය. 2004 දෙසැම්බර් 17 වන දින වන විට එ.ජ.ඩොලරයට එරෙහිව රුපියල් 105.47ක්ව පැවති විනිමය අනුපාතය 2004 දෙසැම්බර් 31 දිනට රුපියල් 104.61 දක්වා අධිප්‍රමාණය විය. 2005 ජනවාරි 12 වන විට එය තවදුරටත් රුපියල් 98.11 දක්වා අධිප්‍රමාණය වූ අතර ඉන් පසු ක්‍රමයෙන් අවප්‍රමාණය විය. සමස්තයක් ලෙස 2005 වසරේ දී රුපියල සියයට 2.4කින් අධිප්‍රමාණය වී වසර අවසානයේදී එය එ.ජ.ඩොලරයට එරෙහිව රුපියල් 102.12ක් විය. සුනාමි ව්‍යසනයට පසු ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික ආධාර ලබාදෙන්නන් විසින් සැලකිය යුතු ප්‍රමාණයක විදේශාධාර සහතිකවීමත් සහ පෞද්ගලික ප්‍රේෂණ ඇතුළු අනෙකුත් විදේශ ආධාර ලැබීම් පිළිබඳ වූ අපේක්ෂාවත් විදේශ විනිමය වෙළෙඳපොළෙහි විශ්වසනීයත්වය තහවුරු කිරීමට හේතුවිය. ගෙවුම් තුලනයේ සමස්ත ශේෂය ඉහළයාම ද විනිමය අනුපාතයේ ස්ථාවරත්වය ශක්තිමත් කිරීමට ඉවහල් විය.

- **2005 වසර තුළ දී එ.ජ.ඩොලරය ප්‍රධාන මුදල් වර්ගවලට එරෙහිව අධිප්‍රමාණය වීම ශ්‍රී ලංකා රුපියල අනෙකුත් ප්‍රධාන මුදල් වර්ගවලට එරෙහිව සාපේක්ෂ වශයෙන් වැඩි වේගයකින් අධිප්‍රමාණය වීමට හේතුවිය.** ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි එ.ජ.ඩොලරයට එරෙහිව අනෙකුත් මුදල් වර්ගවල වෙනස්වී පිළිබිඹු කරමින්, යූරෝ (සියයට 17.7), බ්‍රිතාන්‍ය පවුම් (සියයට 14.5), ඉන්දියානු රුපියල (සියයට 5.7), ජපන් යෙන් (සියයට 17.5), සහ වි.ගැ.හි. (සියයට 11.3) වලට එරෙහිව රුපියල සැලකිය යුතු ලෙස අධිප්‍රමාණය විය.

නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාත

- **2005 වසර තුළ දී නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාත දෙකම අවප්‍රමාණය වීමේ ප්‍රවණතාවය වෙනස්කරමින් අධිප්‍රමාණය විය.** අනෙකුත් ප්‍රධාන මුදල් වර්ගවලට එරෙහිව ශ්‍රී ලංකා රුපියල සාපේක්ෂ වශයෙන් ඉහළ අගයකින් අධිප්‍රමාණයවීමේ ප්‍රතිඵලයක් ලෙස මුදල් වර්ග 5කින් සැදුම්ලත් පැස මත පදනම් වූ (එ.ජ.ඩොලර්, ජපන් යෙන්, බ්‍රිතාන්‍ය පවුම්, ඉන්දියානු රුපියල සහ යූරෝ ඇතුළත්) ශ්‍රී ලංකා රුපියලේ නාමික සඵල විනිමය අනුපාතය (නා.ස.වි.අ.) සැලකිය යුතු ලෙස සියයට 8.5කින් අධිප්‍රමාණය වූ අතර, වෙළෙඳ හවුල්කාර රටවල් සහ තරගකාරී රටවල් 24කින් සැදුම්ලත් පැස මත පදනම්වූ නා.ස.වි.අ. 2004 වසරේ දී වූ සියයට 11ක අවප්‍රමාණය හා සැසඳීමේදී 2005 වසර තුළ සියයට 7.7කින් අධි

5.13 සංඛ්‍යා සටහන

විනිමය අනුපාතික වෙනස්වීම්

මුදල් වර්ගය	විදේශ ව්‍යවහාර මුදල් ඒකකයකට රුපියල් අගය						පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම(අ)			
	වර්ෂය අග අනුපාතිකය			වාර්ෂික සාමාන්‍යය			ලක්ෂ්‍යමය		වාර්ෂික සාමාන්‍යය	
	2003	2004	2005	2003	2004	2005	2004	2005	2004	2005
යූරෝ	121.60	142.32	120.96	109.16	125.79	125.10	-14.56	17.66	-13.22	0.55
ඉන්දියානු රුපියල්	2.12	2.40	2.27	2.07	2.23	2.28	-11.46	5.67	-7.18	-2.22
ජපන් යෙන්	0.90	1.02	0.87	0.83	0.94	0.91	-11.15	17.53	-10.90	2.33
බ්‍රිතාන්‍ය පවුම්	172.20	201.37	175.94	157.71	185.35	182.87	-14.49	14.45	-14.91	1.35
එ. ජ. ඩොලර්	96.74	104.60	102.12	96.52	101.19	100.50	-7.52	2.44	-4.61	0.69
විශේෂ ගැනුම් හිමිකම්	143.75	161.60	145.95	135.23	149.88	148.45	-11.05	11.30	-9.78	0.96

සඵල විනිමය අනුපාත දර්ශක (ආ)	මාසික දර්ශකය			වාර්ෂික සාමාන්‍යය			පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම			
							ලක්ෂ්‍යමය		වාර්ෂික සාමාන්‍යය	
	2003 දෙසැ.	2004 දෙසැ.	2005දෙසැ.	2003	2004	2005	2004	2005	2004	2005
නා.ස.වි.අ. (1999 = 100)	71.58	63.18	68.07	73.84	67.63	67.55	-11.74	7.74	-8.41	-0.12
මූ.ස.වි.අ. (1999 = 100)	96.75	94.93	106.99	97.25	93.61	101.92	-1.88	12.70	-3.74	8.88

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) වෙනස්වීම ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියලට අදාළ විදේශීය ව්‍යවහාර මුදල් වටිනාකම පදනම් කර ගෙනය. සෘණ ලකුණින් ශ්‍රී ලංකා රුපියලෙහි අගය අඩුවීම පෙන්නුම් කරයි.

(ආ) නාමික සඵල විනිමය අනුපාතය (නා.ස.වි.අ.) යනු වෙළෙඳ හවුල්කරුවන් සහ තරගකාරී රටවල් 24ක නාමික විනිමය අනුපාතිකයන්ගේ බර තැබූ සාමාන්‍යයයි. බර ප්‍රමාණය, මුදල් පැසට ඇතුළත් එක් එක් රට සමග සිදු කරන වෙළෙඳාමෙහි වැදගත්කම මත පදනම් වේ. මූර්ත සඵල විනිමය අනුපාතය (මූ.ස.වි.අ.) ගණනය කරනුයේ පැසට ඇතුළත් මුදල් වර්ග අයත් රටවල උද්ධමන වෙනස නා.ස.වි.අ.ට ගැලපීම මගිනි සෘණ ලකුණින් පෙන්නුම් කරනුයේ අගය අඩුවීමකි.

5.10 රූප සටහන
විනිමය අනුපාතිකයන්ගේ වෙනස් වීම්

විනිමය අනුපාතිකයන්ගේ වෙනස්වීම් 2004-2005
එ.ජ. ඩොලරයට එරෙහි රුපියලේ අගය



සඵල විනිමය අනුපාත දර්ශක මුදල් වර්ග 24 පැස අනුව
(1999=100)



ප්‍රමාණය විය. ශ්‍රී ලංකා රුපියලේ ඉහළ නාමික අධිප්‍රමාණය සහ වෙළෙඳ හවුල්කාර රටවලට සහ තරගකාරී රටවලට සාපේක්ෂව ඉහළ දේශීය උද්ධමනයක් පැවතීමේ ප්‍රතිඵලයක් ලෙස 2005 වසරේ දී මුදල් වර්ග 5කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ.ස.වි.අ.) සියයට 13.1කින් සැලකිය යුතු ලෙස අධිප්‍රමාණය විය. එය 2002 වසරේ සිට පැවති අවප්‍රමාණයවීමේ ප්‍රවණතාවය ආපසු හැරවීමක් විය. මූ.ස.වි.අ. 2002 වසරේ දී සියයට 0.1කින්, 2003 වසරේ දී සියයට 2.8කින් සහ 2004 වසරේ දී සියයට 0.7කින් අවප්‍රමාණය විය. මේ අතර, මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූ.ස.වි.අ. පිළිවෙළින් 2003 සහ 2004 වසරවලදී සියයට 3.4කින් සහ සියයට 1.1කින් අවප්‍රමාණය වූ අතර, 2005 වසරේ දී එය සියයට 12.7කින් අධිප්‍රමාණය විය. 2005 වසරේ දී විදේශ විනිමය අනුපාතයෙහි වෙනස්වීම් මත දුර්වල වූ ශ්‍රී ලංකාවේ විදේශ තරගකාරිත්වය විශේෂයෙන් ඇඟළුම් කර්මාන්තයේ ඇති වූ ඵලදායීතාවයේ වර්ධනය හේතුවෙන් තරමක් දුරට මඟහරවා ගත හැකි විය.

5.11 රූප සටහන
ත්‍රෛමාසික අන්තර් බැංකු ඉදිරි විනිමය ගනුදෙනු
(2003- 2005)



දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ වර්ධනයන්

- **වෙළෙඳාම වර්ධනය වීම සහ විනිමය අනුපාතයේ ස්ථාවරත්වය විදේශ විනිමය වෙළෙඳපොළ පුළුල්වීමට හේතු විය**. 2004 වසරේ දී එ.ජ.ඩො. දශ ලක්ෂ 4,330ක් වූ ඉදිරි වෙළෙඳපොළ ගනුදෙනු පරිමාව සහ අන්තර් බැංකු එතැන් වෙළෙඳපොළ කටයුතුවල සමස්ත ගනුදෙනු පරිමාව 2005 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 7807 දක්වා සැලකිය යුතු ලෙස වැඩි විය. 2004 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 3,304ක් වූ එතැන් වෙළෙඳපොළ ගනුදෙනු පරිමාව එ.ජ.ඩොලර් දශ ලක්ෂ 5,949 දක්වා වැඩි වූ අතර, 2004 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,026ක ඉදිරි වෙළෙඳපොළ ගනුදෙනු පරිමාව (මුළු ගනුදෙනු පරිමාවෙන් සියයට 23.7ක්) එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,858 (මුළු ගනුදෙනු පරිමාවෙන් සියයට 23.8)ක් දක්වා වැඩි විය. ශ්‍රී ලංකා රුපියල අධිප්‍රමාණය වේයැයි වෙළෙඳපොළ තුළ වූ අපේක්ෂාවන් හේතුවෙන් එතැන් විනිමය අනුපාතයෙහි ප්‍රතිශතයක් ලෙස වාර්ෂික ඉදිරි විනිමය අධිමිල වසරේ මුල් කාලයේදී පහත වැටිණි. රුපියල ක්‍රමිකව අවප්‍රමාණය වීම සහ දේශීය පොලී අනුපාතයන් ඉහළයාම පිළිබිඹු කරමින් පසුව එය ක්‍රමයෙන් ඉහළ ගියේය.
- **2005 වසර තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව විදේශ විනිමය වෙළෙඳපොළේ පැවති අසාමාන්‍ය උච්චාවචනයන් සමනය කිරීම සඳහා එ.ජ.ඩොලර් දශ ලක්ෂ 464ක් විකිණීමෙන් සහ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 290ක් මිලට ගැනීමෙන් විදේශ විනිමය වෙළෙඳපොළට දෙආකාරයෙන්ම මැදිහත්වීමේ ප්‍රතිඵලයක් ලෙස 2004 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 515ක ශුද්ධ විකිණීම හා සැසඳීමේදී එය එ.ජ. ඩොලර් දශ ලක්ෂ 174ක අඩු ප්‍රමාණයක් විය.**